# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම් වලට අදාල 1995 ප්‍රධාන නීති අණපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 1995 අංක 6 දරන විසර්ජන පනත | I |
| 2. | 1995 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත | IV |
| 3. | 1995 අංක 8 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ (සංශෝධන) පනත | V |
| 4. | 1995 අංක 10 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත | VIII |
| 5. | 1995 අංක 13 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත | X |
| 6. | 1995 අංක 14 දරන සාක්ෂි (විධිවිධාන) පනත | XIII |
| 7. | 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත | XIX |
| 8. | 1995 අංක 16 දරන මුදල් පනත | XXVIII |
| 9. | 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | XXXVII |
| 10. | 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත | XXXVIII |
| 11. | 1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත | XXXIX |
| 12. | 1995 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | XLI |
| 13. | 1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත | LI |
| 14. | 1995 අංක 31 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත | LIX |
| 15. | 1995 අංක 32 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම් පත් (සංශෝධන) පනත | LXVI |
| 16. | 1995 අංක 33 දරන බැංකු (සංශෝධන) පනත | LXXVI |
| 17. | 1995 අංක 34 දරන විසර්ජන පනත | C |
| 18. | 1995 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත | CII |

## 1995 අංක 6 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1995 මාර්තු මස 30 වැනි දින]**

1995 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද, ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට සැලසීම සඳහා ද, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධි විධාන සැලසීම සඳහා ද වූ පනතකි.

1\. මේ පනත 1995 අංක 6 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2\. (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙන යම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි " 1995 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1995 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භ වී 1995 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් දහසය දහස් නව සිය අසූ කෝටි විසිහත් ලක්ෂ විසි දෙදහසක් විය යුතු ආණ්ඩුවේ වියදම -

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින්; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල් වල සමස්තය රුපියල් නව දහස් හැට හය කෝටි හැට තුන් ලක්ෂ අනූහත් දහසක් නොඉක්ම වන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් දහසය දහස් හයසිය හැට කෝටි විසි හත් ලක්ෂ විසි දෙදහසක් වූ මුදල, මේ පනතේ පළමු වන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙන ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

3\. (1) 1995 මුදල් වර්ෂය තුළ දී මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම් වල එකතුව, ඒ උපලේඛනයේ III වන තීරයෙහි අනුරූපී සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. ඒ කටයුත්තෙන් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1995 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(2)(1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා, පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) යම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතුය

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1995 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුළදී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ I වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන් 1995 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒ කටයුත්තේ මුළු බැරකම්, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 1995 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උප ලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කළ විධාන කරනු ලැබිය හැකිය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල් වල එකතුව ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙනලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දාවූ හෝ මතුවට වියදම් නොකෙරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ මුදල වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදු වලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු විය හැකි බවට; හෝ

(2) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තව දුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකිය.

7. (1) අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව -

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්;

(ආ) මේ පනතේ දෙවන උපලේඛයේ III වන තීරයෙහි දැක්වෙන් අවම සීමා

නියමයක් මගින්, 1996 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

(3) එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම්, එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය.

8. පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින් මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීර වලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ-

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්;

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව
එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

9. 1995 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ සේවය සඳහා මුදල් ප්‍රතිපාදන සලස්වමින් 1994 නොවැම්බර් මස විසිපස් වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවෙහි කුමක් සඳහන් වී තිබුණද -

(අ) ඒ යෝජනාවෙහි පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනකට, ඒ යෝජනාව මගින් වෙන් කරනු ලැබූ මුදල් වලින් ඒ කාලසීමාව තුළ දී වියදම් කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් ඒ යෝජනාවේ බලය යටතේ වියදම් කරනු ලැබූ ලෙස නොව මේ පනතෙහි බලය යටතේ වියදම් කරනු ලැබූ ලෙස සියළුම කාර්ය සඳහා සැලකිය යුතුය.

(ආ) මේ පනතේ පළමුවන උපලේඛනයේ කිසිම ශීර්ෂයක් යටතේ අනුරූප වැඩ සටහනක් නොමැති, එකී යෝජනාවේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වා ඇති වැඩ සටහනක් සඳහා ඒ යෝජනාවෙන්, වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් අතුරින් ඒ කාල සීමාව තුළදී කරන ලද වියදම්, මෙම පනතේ පළමුවන උපලේඛනයෙහි භාණ්ඩාගාර සේවා දෙපාර්මේන්තුව සඳහා වූ 361 වන ශීර්ෂය යටතේ දැක්වෙන 3 වන වැඩ සටහන යටතේ වියදම් කරනු ලැබූ ලෙස සියළුම කාර්යය සඳහා සැලකිය යුතුය.

(ඇ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි වියදම් නොකර ඇති, එසේ වෙන් කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයන්, මේ පනත යටතේ වූ අනුරූප ශීර්ෂය යටතේ දැක්වෙන අනුරූප වැඩ සටහනට වෙන් කරනු ලැබූ මුදල් වලට ඇතුළත් කරනු ලැබූ ලෙස සියළුම කාර්යය සඳහා සැළකිය යුතුය; තවද

(ඈ) ඒ යෝජනාවෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් කටයුතු සම්බන්ධයෙන්, 1995 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි අවසන් වන කාල සීමාව තුළ දී, ඒකාබද්ධ අරමුදලින් අත්තිකාරම් වශයෙන් ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයන්, ඒ යෝජනාවේ බලය යටතේ අත්තිකාරම් වශයෙන් ගෙවනු ලැබූ ලෙස නොව මේ පනතෙහි බලය යටතේ අත්තිකාරම් වශයෙන් එසේ ගෙවනු ලැබූ ලෙස සියළුම කාර්යය සඳහා සැලකිය යුතුය.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**1995 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 අප්‍රේල් මස 12 වන දින]**

**සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය "යනුවෙන් හඳුන්වනු ලබන, සුරාබදු ආඥාපනතේ 22 වන වගන්තියේ (3) වන උප වගන්තියේ යෙදෙන "එක් මාසයක කාලයක ඇතුළත "යන වචන වෙනුවට "මාස හතරක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ "මේ ආඥාපනත යටතේ බලපත්‍ර දෙනු නොලැබූ සුරාබද්දට යටත් යම් භාණ්ඩයක් " යන වචන වෙනුවට "මේ ආඥාපනත යටතේ බලපත්‍ර දෙනු නොලැබූ සුරා බද්දට යටත් යම් භාණ්ඩයක් හෝ සුරා බද්දට යටත් යම් භාණ්ඩයක් අවසර නොමැතිව කරනු ලබන යම් ගබඩා කිරීමක් හෝ විකිණීමක් "යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය, එහි "රුපියල් පන් දහසක් "යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් පන්ලක්ෂයක් දක්වා දීර්ඝ විය හැකි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. "යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥාප්තියේ 58අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 58 ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු යː-

58ආ යම් තැනැත්තෙකුට

"විශේෂ සේවා සහ පැමිණීම වෙනුවෙන් සුරාබදු නිලධාරියන්ට ගෙවීම.

(අ) විශේෂ සේවයක් ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල් වරයා විසින් නිශ්චය කරනු ලබන යම් සේවාවක්; හෝ

(ආ) යම් සුරාබදු නිලධරයකු ඔහුගේ නිසි කාර්යාලය හෝ සේවයේ නියුක්ත ස්ථානය නොවන වෙනත් යම් කාර්යාලයකට හෝ ස්ථානයකට පැමිණ සිටීම

අවශ්‍ය වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් එම සේවාව හෝ පැමිණ සිටීම වෙනුවෙන්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන යම් අනුප්‍රමාණ මත, සුරාබදු කොමසාරිස් ජනරාල් වරයා වෙත ගෙවීම කළ යුතු ය."

6. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවල හෝ ප්‍රධාන ප්‍රඥප්තිය නැතහොත් ඒ ලිඛිත නීතිය මගින් හෝ යටතේ නිකුත් කරන ලද, කරන ලද, නියම කරන ලද හෝ බලය දෙන ලද යම් දැන්වීමක, සංනිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක "සුරාබදු කොමසාරිස්වරයා" යන යෙදුම සඳහන් වන සෑම තැනකම, ඒ වෙනුවට "සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයකු හඳුන්වන "නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයා" හෝ "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන යෙදුම සඳහන් වන අවස්ථාවක, ඒ යෙදුමට ප්‍රධාන ප්‍රඥාප්තිය යටතේ පත් කරන ලද සුරාබදු කොමසාරිස්වරයකු ඇතුළත් වනසේ සලකනු ලැබිය යුතුය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙර සුරාබදු කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ නමින් සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සෑම ගිවිසුමක්, එකඟවීමක් හෝ වෙනත් සාධන පත්‍රයක් නැතහොත් ලියවිල්ලක් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමේ දිනයේ සිට සහ ඉන්පසුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ නමින් සාදන ලද නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**1995 අංක 8 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ (සංශෝධිත) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 අප්‍රේල් මස 27 වන දින]**

**1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 8 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ දීර්ඝ නාමය "කාර්යාංශයේ කොටස් හිමියන්ට ඒ තොරතුරු සැපයීම සඳහා ද" යන වචන වෙනුවට, "ඉල්ලීමක් කරනු ලැබූ විට, කාර්යාංශයේ කොටස් හිමියන්ට සහ සමගාමීව, ඒ තොරතුරු අදාළවන යම් ණය ගැනුම්කරුවකුට හෝ අනාගත ණය ගැණුම්කරුවකුට ඒ තොරතුරු සැපයීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති, ආදේශ කරනු ලැබේ:-

"කාර්යාංශයේ කර්තව්‍ය

6. කාර්යාංශයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යː-
ආර්ථිකයේ සියලු අංශවලට සහ විශේෂයෙන්ම අවිධිමත් අංශයකට ණය බෙදා හැරීම පහසු කිරීමේ අදහසින්

(අ) ණය දෙන ආයතනවල ණය ගැණුම්කරුවන් සහ අනාගත ණය ගැණුම්කරුවන් පිළිබඳ වෙළඳ ණය සහ මූල්‍ය තොරතුරු රැස් කිරීම සහ සැසඳීම;

(ආ) ඉල්ලීම මත, කාර්යාංශයේ ණය දෙන ආයතන වල කොටස් හිමියන් වෙත සහ ඒ අවස්ථාවේ දී ම, ඒ තොරතුරු අදාළ වන ණය ගැනුම්කරුවන් සහ අනාගත ණය ගැනුම්කරුවන් වෙත ණය තොරතුරු සැපයීම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ වත්කම් ප්‍රමාණයක් ඇතිකිරීම සහ වත්කම් ප්‍රමාණය භාර ගැනීම සහ ලබා ගැනීම, සඳහා ඉල්ලීමක් කළ විට වත්කම් ප්‍රමාණය යම් විදේශීය සහ දේශීය නියෝජ්‍යායතනයකට හෝ යම් තැනැත්තකුට විකිණීම;

(ඈ) කාර්යාංශයේ කොටස් හිමියන්වන ණය ආයතන සඳහා පර්යේෂණ ව්‍යාපෘති භාර ගැනීම."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ), (ආ), (ඇ), සහ (ඈ) ඡේද ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, සහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් -

"(අ) ණය දෙන ආයතනවලින් ණය ලබාගන්නා ණය ගැණුම්කරුවන් පිළිබඳ දත්ත බැංකුවක් පවත්වා ගෙන යාම;

(ආ) ණය දෙන ආයතනවල ණය ගැනුම්කරුවන් හෝ අනාගත ණය ගැණුම්කරුවන් පිළිබඳ වෙළෙඳ ණය හෝ මූල්‍ය තොරතුරු රැස් කිරීම සහ සැසඳීම;

(ඇ) එසේ රැස් කළ තොරතුරු තැන්පත් කිරීම;

(ඈ) ණය තොරතුරු;
(i) රහස්‍යතාවෙන් යුතුව, කාර්යාංශයේ කොටස් හිමියන්ට;
(ii) ඒ තොරතුරු අදාළවන්නා වූ ණය ගැණුම්කරුවකුට හෝ අනාගත ණය ගැණුම්කරුවකුට කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසි වලට යටත්ව කාර්යාංශයේ කොටස් හිමියකුගේ
ඉල්ලීම මත සැපයීම සහ ඒ තොරතුරු සැපයීම යුතු ආකෘතිනියම කිරීම;";

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-
"(ඈ ඈ) ඉල්ලීම මත, විදේශීය හෝ දේශීය නියෝජ්‍යායතන වලට හෝ යම් තැනැත්තකුට වත්කම් ප්‍රමාණය විකිණීම;";

(3) ඒ වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් -

"(ච) කාර්යාංශයේ කොටස් හිමියන් වන ණය දෙන ආයතන සඳහා පර්යේෂණ ව්‍යාපෘති භාර ගැනීම;";

(4) ඒ වගන්තියේ (ච) ඡේදය (ජ) ඡේදය වශයෙන් නැවත අකුරු යෙදීමෙන්.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ -

"(4) (3) වන උපවගන්තිය යටතේ කොටස් වෙන්කරදීමක් හෝ පැවරීමක් සඳහා අනුමතය දීමේ දී කාර්යාංශයේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් යටත් පිරිසෙයින් සියයට තිස් එකක්වත් රඳවා තබා ගැනීම සහතික කිරීමට මුදල් මණ්ඩලය වෑයම් කළ යුතුය."

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) කාර්යාංශය විසින්, මාස හයකට නොවැඩි කාලච්ඡේද සඳහා මහ බැංකුවෙන් හෝ ණය දෙන ආයතනවලින් කලින් කල මුදල් ප්‍රමාණ ණයට ගැනීම කරනු ලැබිය හැකි ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:

"මණ්ඩලය විසින් ලාභාංශ ප්‍රකාශ කළයුතු බව.

16අ. යම් වර්ෂයක් සඳහා වූ කාර්යාංශයේ ශුද්ධ ලාභවලින්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයක ලාභාංශ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විගණනය.

18. (1) මණ්ඩලය විසින්, කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරයකු වාර්ෂිකව පත් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් වර්ෂය සඳහා වූ කාර්යාංශයේ ගිණුම්, ඊළඟ වර්ෂයේ ජුනි මස තිස්වන දිනට පෙර (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින් විගණනය කරනු ලැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3)(1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයකු විසින් කාර්යාංශයේ ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිසැකව දැන පහත දැක්වෙන දේ එනම්:-

(අ) ඔහුට අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ඔහු විසින් ලබාගත්තේ ද නැද්ද යන වග; සහ

(ආ) වාර්තාවේ සඳහන් ශේෂ පත්‍රය සහ ගිණුම් කාර්යාංශයේ කටයුතු පිළිබඳ සත්‍ය වූ ද පැහැදිලි වූ ද දර්ශනයක් පිළිඹිබු කෙරෙන පරිදි නිසියාකාර ලෙස සකස් කරනු ලැබ ඇද්ද යන වග

ප්‍රකාශ කෙරෙන වාර්තාවක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) විගණකවරයාගේ වාර්තාව මණ්ඩලය වෙත යැවිය යුතු ය.

(5) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණක වරයා" යන්නෙන්, -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට, ඒ ආයතනයේ සභාව නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද එවැනි ගණකාධිකාරි සමාගමක් අදහස් වේ."

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අමාත්‍යවරයා වෙත යැවිය යුතු ලේඛන.

19. 18 වන වගන්තිය යටතේ යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණන වාර්තාව ලැබුණු විට, ඒ වර්ෂයට අදාළ පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක් අමාත්‍යවරයා සහ කොටස් හිමියන් වෙත යැවීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු යː-

(අ) විගණන වාර්තාව;
(ආ) ශේෂ පත්‍රය;
(ඇ) ලාභාලාභ ගිණුම; සහ
(ඈ) ඒ වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ පිළිබඳ විස්තරයක් දැක්වෙන ඒ මණ්ඩලයේ සභාපතිගේ වාර්තාව.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "කාර්යාංශයේ කොටස් හිමියකු වන ණය දෙන ආයතනයක ඉල්ලීම මත ඒ කොටස් හිමියාට" යන වචන වෙනුවට "කාර්යාංශයේ කොටස් හිමියකු වන ණය දෙන ආයතනයක ඉල්ලීම මත ඒ කොටස් හිමියාට සහ ඒ අවස්ථාවේ දී ම, ඒ තොරතුරු අදාළ වන ණය ගැනුම්කරුවකු හෝ අනාගත ණය ගැණුම්කරුවන් වෙත" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු යː-

"යම් ණයදෙන ආයතනයක් විසින් මේ පනත යටතේ ගනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

25අ. වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතින් හෝ කාර්යාංශය විසින් යම් ණය දෙන ආයතනයක් වෙත සපයන ලද යම් තොරතුරක් විශ්වාස කරමින් ඒ ණය දෙන ආයතනය වෙත නියම කරන ලද්දා වූ හෝ පවරන ලද්දා වූ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීමේ හෝ ඉටුකිරීමේ කාර්යය සඳහා ඒ ණය දෙන ආයතනය විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් හේතුවෙන් යම් තැනැත්තකු විසින් දරන ලද හෝ යම් තැනැත්තකුට සිදු වූ පාඩුවක් හෝ අලාභයක් හෝ යම් තැනැත්තකු විසින් කරන ලදැයි හෝ යම් තැනැත්කුට සිදු වී යයි කියන ලද යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ඒ ණය දෙන ආයතනය වගකිව නොයුතුය; නැතහොත් යම් අධිකරණයක දී සිවිල් හෝ අපරාධ නඩුවකට යටත් නොවිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (4) වන උප වගන්තියේ "27 (1) (අ) හෝ (ආ) යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(1) (අ) හෝ (ආ) උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ "ණය දෙන ආයතන" යන්නෙහි අර්ථකථනය අගට පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ අර්ථකථනය මෙයින් සංශෝධනය කරනු ලැබේː-

"(උ) යම් ආයතනයක මූල්‍ය ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, මේ පනතේ කාර්යය සඳහා ණය දෙන ආයතනයක් විය යුතු යයි ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් ප්‍රකාශිත ණය දීමෙහි නියුතු වෙනත් යම් ආයතනයක්.".

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

**1995 අංක 10 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 ජූනි මස 27 වන දින]**

**1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 10 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (ඇ) 1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත්, 1995 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා:-

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට තුන හමාරකට සමාන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට තුන හමාරකට සමාන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව, ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල ;

(ඉ) 1995 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1996 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා -

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට සමාන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට සමාන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ ඒ දිනට පෙර මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව, ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

| "**උපලේඛනය** | **(3 වන වගන්තිය)** |
|---|---|
| කාර්තුව | අනුපාතය |
| 1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 1 |
| 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | සියයට 2.3 |
| 1992 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1994 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා ... ... | සියයට 3 |

1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1995
ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම්
කාර්තුවක් සඳහා ... ... සියයට 3.5

1995 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1996
ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම්
කාර්තුවක් සඳහා ... ... සියයට 4.5

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 13 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 ජූලි මස 25 වන දින]**

**1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 13 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමය "පිළිවෙලින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙලින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1995 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1996 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (v) වන ඡේදයේ "එහි ශේෂය ද ; සහ" යන වචන වෙනුවට "එහි ශේෂය ද;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (vi) වන ඡේදයේ " එහි ශේෂය ද ;" යන වචන වෙනුවට "එහි ශේෂය ද, සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-
" (vii) 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින් -

(අ) සියයට පනහකට නොඅඩු ප්‍රමාණයක් 1995 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද;

(ආ) 1995 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂය ද ; "

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "සියයට 7 1/2 ක් ; සහ "වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 7 1/2 ක්"; යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "සියයට 7 1/2 ක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 7 1/2 ක්; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(උ) 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන් -

(i) 1995 ජූලි මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක්; සහ

(ii) 1995 ඔක්තෝබර් මාස සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ (ii) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහා අධිභාරය ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින් -

(ඈ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් -

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2කට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) 1990 අප්‍රේල් මස 1 දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් -

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඈ) 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1992 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii)1992 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඉ) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1993 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1993 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඊ) 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1994 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1994 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(උ) 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1995 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ
(ii) 1995 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර, සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක -

1989 අප්‍රේල් මස 1 දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1993 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1994 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1995 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ; සහ

1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1996 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ කිරීමට ඔහුට නියම කරනු ලබන ගෙවීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ," ආදායම් බද්ද" යන්නෙහි අර්ථකථනයේ (i) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) පිළිවෙලින් 1993 අප්‍රේල් මස 1 වන, 1994 අප්‍රේල් මස 1 වන සහ 1995 අප්‍රේල් මස 1 වන දිනවලින් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා වූ විට, දේශීය ආදායම් පනත යටතේ ඒ අදාළ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් පහත දැක්වෙන මුදල්වල එකතුව අඩු කළ විට ශේෂ වන ආදායම් බද්ද අදහස් වේ:-

(i) ඒ සමාගම විසින් ඒ වර්ෂය සඳහා ඒ පනතේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දක් ; සහ

(ii) ඒ වර්ෂය සඳහා ඒ පනතේ 82 වන වගන්තිය යටතේ හෝ 83 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද යම් සහනයක් සහ 85අ වගන්තිය යටතේ ඉඩදෙන ලද යම් අඩු කිරීමක්."

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 ජූලි මස 31 වන දින]**

**සිවිල් සහ අපරාධ නඩු කටයුතුවල දී ශ්‍රව්‍ය දෘශ්‍ය රෙකෝඩන සහ පරිගණක මගින් ලබාගන්නා ප්‍රකාශවල ඇතුළත් තොරතුරු සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද , මෙහි විධිවිධාන සලස්වා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ කරනු ලැබිය යුතුය.

3. (1) මේ පනතේ විධිවිධාන අදාළ කිරීමේ දී පැන නගින්නා වූ හෝ ඊට ආනුෂංගික වන්නා වූ ද මේ පනතේ විධිවිධාන සලස්වා නොමැති වූ ද යම් කරුණක් තීරණය කිරීම සඳහා සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන උචිත අවස්ථා වල දී නඩුවේ සාධාරණත්වය ඉටුකිරීම සඳහා සුදුසු ගලපාගැනීම් සහිතව පිළිගෙන අදාළ කරනු ලැබිය යුතුය.

(2) මේ පනතේ විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් තීරණය කරනු පිණිස සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් නීතියක විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා, සාක්ෂි ආඥාපනතේ හෝ ඒ වෙනත් නීතියේ ලේඛනවලට අදාළ වන්නාවූ සමාන කරුණක් පාලනය කෙරෙන්නාවූ විධිවිධාන මේ පනත යටතේ ආවේශ්‍ය කළ හැකි යම් රෙකෝඩනයක්, ප්‍රත්‍යුත්පාදනයක් හෝ ප්‍රකාශයක් හෝ වෙනත් සාක්ෂියක් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීමෙහිලා අවශ්‍ය වන පරිදි යම් සුදුසු ගලපා ගැනීම් ද සහිතව පිළිගෙන අදාළ කරනු ලැබිය යුතුය.

(3) ඉහත සඳහන් කර ඇති පරිදි, සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් නීතියක විධිවිධාන, මේ පනතේ විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් තීරණය කරනු පිණිස පිළිගෙන හෝ අදාළ කිරීම උචිත නොවන්නාවූ හෝ ප්‍රායෝගික නොවන්නා වූ අවස්ථාවක අධිකරණය විසින් එවැනි කරුණක් සම්බන්ධයෙන් සිය නෛසර්ගික බලය ක්‍රියාත්මක කරමින්, යුක්තිය ඉටුකිරීමෙහි ලා අවශ්‍ය වන යම් ආඥාවක් කිරීමෙන් ඒ කරුණු තීරණය කරනු ලැබිය හැකිය.

## I වන කොටස

### සමකාලීන රෙකෝඩන

4. (1) යම් සිද්ධියක් පිළිබඳ සෘජු වාචික සාක්ෂි ආවේශ්‍ය කෙරෙන යම් නඩු කටයුත්තක දී ඒ සිද්ධිය ඔප්පු කිරීමට තුඩු දෙන ඒ පිළිබඳ වූ යම් සමකාලීන රෙකෝඩනයක් හෝ එහි ප්‍රත්‍යුත්පාදනයක්-

(අ) එකී රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය ඉලෙක්ට්‍රොනික හෝ යාන්ත්‍රික ක්‍රමයක් භාවිත කිරීමෙන් සාදන ලද බව;

(ආ) මේ වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කරගත හැකි ආකාරයකින් ක්‍රියා කරවීම, පුනර්ක්‍රියා කරවීම, ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම කළ හැකි බව;

(ඇ) අවස්ථාවෝචිත පරිදි රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය සකස් කිරීමේදී භාවිත කරන ලද යන්ත්‍රය හෝ උපක්‍රමය රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය සකස් කිරීමට වැදගත් සියලූ අවස්ථාවලදී නිසි ලෙස ක්‍රියා කරමින් තිබුණු බව හෝ එසේ නොතිබුණේ නම් එය නිසි ලෙස ක්‍රියා නොකළේ හෝ ක්‍රියා විරහිත වූයේ යම් කරුණක් සම්බන්ධයෙන් ද ඒ කරුණ එම රෙකෝඩනයේ හෝ ප්‍රත්‍යුත්පාදනයේ නිරවද්‍යතාව කෙරේ බලනොපෑබව;

(ඈ) ඒ රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීමේදී හෝ කිරීමෙන් පසු ඒ රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය කවර හෝ ආකාරයකින් වෙනස් කිරීමක් හෝ ඊට අනිසි යම් දෙයක් නොකරන ලද බව හෝ ඒ රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීමේ දී හෝ කිරීමෙන් පසු සියලූ වැදගත් අවස්ථාවලදී එය ආරක්ෂක භාරයේ තිබූ බව සහ ඒ ආරක්ෂක භාරයේ එය තිබුණු කාලය තුළදී ඒ රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය වෙනස් කිරීමේ හෝ ඊට අනිසි යම් දෙයක් කිරීමේ හැකියාව වළක්වාලීම සඳහා ප්‍රමාණවත් පූර්වාරක්ෂ ක්‍රියා මාර්ග ගන්නා ලද බව

පෙන්නුම්කර ඇත්නම් එය, ඒ සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතුය.

(2) (1) වන උප වගන්තියේ දක්වා ඇති කොන්දේසි ඉටු වී ඇත්නම්, රෙකෝඩනය කරන ලද්දා වූ හෝ ප්‍රත්‍යුත්පාදනය කරන ලද්දා වූ සිද්ධිය සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සාක්ෂි දැරීමක් කර ඇත්තේ හෝ නොමැත්තේ වුවද ඒ රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තියේ සඳහන් යම් රෙකෝඩනයක් හෝ ප්‍රත්‍යුත්පාදනයක් -

(අ) ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කරගත හැකි ආකාරයකින් ක්‍රියාකරවීම, පුනර්ක්‍රියාකරවීම, ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම කල නොහැක්කා වූ;

(ආ) එසේ ග්‍රහණය කර ගත හැකි නමුත් යම් නිශ්චිත විද්‍යාවක් පිළිබඳ දැනුමක් නොමැති යම් තැනැත්තකුට අවබෝධකර ගත නොහැක්කා වූ; හෝ

(ඇ) එහි ස්වභාවය අනුව එහි මුල් ආකෘතියෙන්ම එය අවබෝධ කර ගැනීමට සහ සාක්ෂි වශයෙන් පිළිගැනීමට පහසු නොවන්නා වූ

අවස්ථාවක, ඒ රෙකෝඩනයේ හෝ ප්‍රත්‍යුත්පාදනයේ අවබෝධ කර ගතහැකි වූද ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කළ හැකිවූද යම් පිටපත් කිරීමක්, පරිවර්තනයක්, අනුවර්තනයක් හෝ රූපාන්තරකරණයක් අධිකරණය විසින් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය හැකිය.

(4) යම් රෙකෝඩනයක් හෝ ප්‍රත්‍යුත්පාදනයක්, තනි යන්ත්‍රයකින් හෝ උපක්‍රමයකින් හෝ යන්ත්‍ර හෝ උපක්‍රම කිහිපයකින් හෝ විවිධ යන්ත්‍ර හෝ උපක්‍රම ඒකාබද්ධ කිරීමකින්, යම් උචිත උපකරණයක ආධාරය හෝ මිනිස් මැදිහත් වීමක් ඇතිව හෝ නැතිව හෝ සාදන ලද්දේ වුවද, එය ඉලෙක්ට්‍රානික හෝ යාන්ත්‍රික ක්‍රමයක් භාවිතයෙන් සාදන ලද්දක් ලෙස පිළිගනු ලැබිය යුතුය.

(5) මේ වගන්තියේ ඉහත කී විධිවිධාන යටතේ සාක්ෂි ආවේශ්‍ය කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂියේ අනුපිටපතක්, ඒ අනුපිටපත සෑදීමට උපයෝගීකොට ගත් මුල් පිටපත පිළිගනු ලබන ආකාරයෙන්ම සහ ඒ ප්‍රමාණයටම ආවේශ්‍ය කරනු ලැබිය යුතුය.

## II වන කොටස

## පරිගණක සාක්ෂි

5. (1) සිද්ධියක් පිළිබඳ සෘජු වාචික සාක්ෂි ආවේශ්‍ය කළ හැකි යම් නඩු කටයුත්තකදී, පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද්දා වූද, ඒ සිද්ධිය ඔප්පු කිරීමට තුඩු දෙන්නා වූද යම් ප්‍රකාශයක ඇතුළත් යම් තොරතුරක් -

(අ) (2) වන උපවගන්තියට යටත්ව ඒ ප්‍රකාශය උත්පාදනය කර ඇත්තාවූ ආකෘතියෙන් හෝ ප්‍රත්‍යුත්පාදනය කර ඇත්තාවූ ආකෘතියෙන් ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කළ හැකි බව;

(ආ) ප්‍රකාශය උත්පාදනය කළ පරිගණකය සියලු වැදගත් අවස්ථාවලදී නිසි ලෙස ක්‍රියාකරමින් තිබුණු බව හෝ එසේ නොතිබුණේ නම් එය නිසි ලෙස ක්‍රියා නොකළේ හෝ ක්‍රියාවිරහිත වූයේ යම් කරුණක් සම්බන්ධයෙන් ද ඒ කරුණ එහි ස්වභාවය අනුව එකී ප්‍රකාශය උත්පාදනය කිරීම හෝ එහි ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාව කෙරෙහි හෝ බල නොපෑ බව;

(ඇ) පරිගණකයට සපයන ලද තොරතුරු නිරවද්‍ය බව සහ ප්‍රකාශයේ ඇතුළත් තොරතුරු, පරිගණකයට එසේ සපයන ලද තොරතුරු ප්‍රත්‍යුත්පාදනය කරන බව හෝ ඉන් ව්‍යුත්පන්න වන බව පෙන්නුම් කරනු ලැබුවහොත්, ඒ තොරතුර ඒ සිද්ධිය පිළිබඳ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතුය;

එසේ වුවද, ප්‍රකාශයේ ඇතුළත් තොරතුරු යම් කාලපරිච්ඡේදයක් තුළදී නිතිපතා කරගෙන ගිය යම් ක්‍රියාකාරකමක කාර්ය සඳහා තොරතුරු එක්රැස් කිරීම හෝ සකස් කිරීම සඳහා පරිගණකය නිතිපතා භාවිත කරනු ලැබ ඇති විටදී පරිගණකය විසින් උත්පාදනය කරන ලදැයි පෙන්නුම් කෙරෙන විටදී -

(අ) එකී කාලපරිච්ඡේදය තුළදී ඒ ක්‍රියාකාරකම සාමාන්‍යයෙන් කරගෙන යනු ලබන අවස්ථාවේදී ප්‍රකාශයේ ඇතුළත් වර්ගයේ තොරතුරු හෝ එසේ ඇතුළත් තොරතුරු ව්‍යුත්පන්න වූයේ යම් වර්ගයක තොරතුරු වලින්ද ඒ වර්ගයේ තොරතුරු පරිගණකය වෙත නිතිපතා සපයන ලද බව; සහ

(ආ) ප්‍රකාශයේ ඇතුළත් තොරතුරු, ඒ ක්‍රියාකාරකම සාමාන්‍යයෙන් කරගෙන යනු ලබන අතරතුර පරිගණකයට නිතිපතා සපයන ලද තොරතුරු ප්‍රත්‍යුත්පාදනය කිරීමක් හෝ ඉන් ව්‍යුත්පන්න වූවක් බව පෙන්නුම් කිරීම ප්‍රමාණවත් වන්නේය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ප්‍රකාශයක් -

(අ) ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කර ගත හැකි ආකාරයකින් ක්‍රියා කරවීම, ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම කළ නොහැකි වූ ;

(ආ) ඉන්ද්‍රියයන්ගෙන් එසේ ග්‍රහණය කරගත හැකි නමුදු යම් නිශ්චිත විද්‍යාවක් පිළිබඳ දැනුමක් නොමැති තැනැත්තකුට අවබෝධ කරගත නොහැකි වූ; හෝ

(ඇ) එහි ස්වභාවය අනුව එහි මුල් ආකෘතියෙන් ග්‍රහණය කර ගැනීම සහ සාක්ෂි වශයෙන් ලබාගැනීම පහසු නොවන්නා වූ

අවස්ථාවක , අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රකාශයේ අවබෝධ කරගතහැකි වූද, ඉන්ද්‍රියයන්ගෙන් ග්‍රහණය කරගත හැකිවූද යම් පිටපත් කිරීමක්, පරිවර්තනයක්, අනුවර්තනයක් හෝ රූපාන්තරකරණයක් සාක්ෂි වශයෙන් අධිකරණය විසින් ආවේශ්‍ය කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ සාක්ෂි ආවේශ්‍ය කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂියේ අනුපිටපතක්, ඒ අනුපිටපත සෑදීමට උපයෝගී කරගත් මුල් පිටපත පරිද්දෙන් ම සහ ඒ ප්‍රමාණයටම ආවේශ්‍ය කරනු ලැබිය යුතුය.

(4) (අ) යම් ප්‍රකාශයක් තනි පරිගණකයක් මගින් හෝ පරිගණක කිහිපයක් මගින් හෝ පරිගණක ඒකාබද්ධ කිරීමකින් හෝ යම් ක්‍රමයකින් අනුපිළිවෙලට ක්‍රියාත්මක වන විවිධ පරිගණක මගින් හෝ උත්පාදනය කරන ලද්දක් නම්, ඒ ප්‍රකාශයේ ඇතුළත් තොරතුරු පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද තොරතුරු ලෙස පිළිගනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය උත්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලැබූ සියලුම පරිගණක මගින් තනි පරිගණකයක් සංස්ථාපනය කෙරුනු පරිද්දෙන් මේ පනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය. තවද මේ පනතේ පරිගණකයක් සම්බන්ධයෙන් වූ යම් සඳහනක්, ඒ අනුව තේරුම්ගත යුතු ය.

(ආ) යම් ප්‍රකාශයක් මිනිස් මැදිහත්වීමක් ඇතිව හෝ නැතිව පරිගණකයක් මගින් කෙළින්ම උත්පාදනය කරනු ලැබුව ද යම් උචිත උපකරණයක ආධාරයෙන් උත්පාදනය කරනු ලැබුව ද පරිගණකය මගින් උත්පාදනය කරන ලද්දක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(ඇ) යම් තොරතුරක් යම් උචිත ආකාරයකින් පරිගණකයකට සපයනු ලැබුවේ නම් එය මිනිස් මැදිහත්වීමක් ඇතිව හෝ නැතිව, කෙළින්ම පරිගණකයට සැපයුණද යම් උචිත උපක්‍රමයක ආධාරයෙන් එය සැපයුණ ද ඒ තොරතුර පරිගණකයට සපයනු ලැබූ ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(ඈ) ගණන් බැලීමෙන්, සංසන්දනය කිරීමෙන් හෝ පරිගණකයකට කළ හැකි වෙනත් යම් ක්‍රියාවලියකින් යම් තොරතුරක් ලබාගනු ලබන්නේ නම් හෝ ප්‍රත්‍යුත්පාදනය කරනු ලබන්නේ නම්, ඒ තොරතුර පරිගණකයකට සපයන ලද තොරතුරුවලින් ලබා ගත්තා වූ හෝ ප්‍රත්‍යුත්පාදනය කරන ලද්දා වූ තොරතුරක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඉ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වල දී, ඒ ක්‍රියාකාරකම් නොවන අන්‍යාකාරයකින් ක්‍රියා කරවනු ලබන පරිගණකයක් මගින්, ඒ ක්‍රියාකාරකම්වල කාර්යය සඳහා එක්රැස්කිරීමේ හෝ සැකසීමේ අදහසින් පරිගණකයකට තොරතුරු සපයනු ලබන අවස්ථාවක, ඒ තොරතුරු නිසි පරිදි පරිගණකයට සපයන ලද්දේ නම් ඒ ක්‍රියාකාරකම්වල දී සපයනු ලැබූ ලෙස පිළිගනු ලැබිය යුතු ය.

## III වන කොටස
## පොදු විධිවිධාන

6. (1) යම් නඩුකටයුත්තක දී, මේ පනතේ 4 වන හෝ 5 වන වගන්තිය යටතේ යම් සාක්ෂියක් දීමට යම් පාර්ශ්වකරුවකු අදහස් කරන අවස්ථාවක, පහත දැක්වෙන කරුණු අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් වූ, එනම්-

(අ) ඒ සාක්ෂිය රෙකෝඩනයකින් හෝ ප්‍රත්‍යුත්පාදනයකින් සමන්විත වේ නම්, ඒ නඩු කටයුත්තේ දී ඔප්පු කිරීමට බලාපොරොත්තු වන යම් සිද්ධියක සමකාලීන රෙකෝඩනය හෝ ප්‍රත්‍යුත්පාදනය, 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල දක්වා ඇති කොන්දේසි සපුරාලන බව;

(ආ) ඒ සාක්ෂිය, අවස්ථාවෝචිත පරිදි, රෙකෝඩනයක හෝ ප්‍රත්‍යුත්පාදනයක පිටපතකින්, පරිවර්තනයකින්, අනුවර්තනයකින් හෝ රූපාන්තරකරණයකින් සමන්විතවේ නම් එය 4 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි අතුරෙන් යම් කොන්දේසියක් සපුරාලන බව;

(ඇ) ඒ සාක්ෂිය 4 වන වගන්තියේ (5) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අනුපිටපතකින් සමන්විතවේ නම්, ඒ අනුපිටපත සැබෑ බව සහ ද්විකරණ ක්‍රියාවලියක් මගින් උත්පාදනය කරනු ලැබ ඇති බව;

(ඈ) ඒ සාක්ෂිය, පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද යම් ප්‍රකාශයක ඇතුළත් තොරතුරුවලින් සමන්විත වේනම්, ඒ ප්‍රකාශය පරිගණකයක් මගින් උත්පාදනය කරනු ලැබ ඇති බව සහ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල දක්වෙන කොන්දේසි ඒ ප්‍රකාශය සහ පරිගණකය සම්බන්ධයෙන් සපුරා ඇති බව;

(ඉ) ඒ සාක්ෂිය, අවස්ථාවෝචිත පරිදි, පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද ප්‍රකාශයක පිටපතකින්,

පරිවර්තනයකින්, අනුවර්තනයකින් හෝ රූපාන්තරකරණයකින් සමන්විත වේ නම්, ඒ ප්‍රකාශය 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි අතුරෙන් යම් කොන්දේසියක් සපුරාලන බව;

(ඊ) ඒ සාක්ෂිය, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි අනුපිටපතකින් සමන්විතවේ නම්, ඒ අනුපිටපත සැබෑ බව සහ ද්විකරණ යන්ත්‍රයක් මගින් උත්පාදනය කරනු ලැබ ඇති බව

ප්‍රකාශ කරන්නා වූ සහ අදාළ යන්ත්‍රය, උපක්‍රමය හෝ පරිගණකය මෙහෙයවීම හෝ අදාළ ක්‍රියාකාරකම් පාලනය කිරීම යන කරුණු අතුරෙන් කුමක් සම්බන්ධයෙන් වුව ද වගකිව යුතු තනතුරක් උසුලන තැනැත්තකු විසින් කරන ලදැයි අදහස් කෙරෙන්නා වූ දිවුරුම් ප්‍රකාශයක් ඒ තැනැත්තා සාක්ෂි කරුවකු වශයෙන් නොකැඳවා සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් එය සාක්ෂියක් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා යම් කරුණක් ප්‍රකාශ කරන තැනැත්තාගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව එය ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

එසේ වුව ද, විරුද්ධ පාර්ශවකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත හෝ සිය මෙහෙයවීමෙන් ම හෝ අධිකරණය විසින්, දිවුරුම් ප්‍රකාශය කළ තැනැත්තා හෝ දිවුරුම් ප්‍රකාශයේ දක්වා ඇති යම් කරුණක් පිළිබඳ දැනීමක් ඇතැයි කියනු ලබන වෙනත් යම් තැනැත්තකු, එහි දක්වා ඇති කරුණු අතුරෙන් යම් කරුණක් හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් අදාළ කරුණක් සම්බන්ධයෙන් විවෘත අධිකරණයේ දී පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

**දැන්වීම, ප්‍රවේශය සහ පරීක්ෂණය**

7. (1) යම් නඩු කටයුත්තකට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකු ඒ නඩු කටයුත්තේ දී 4 වන හෝ 5 වන වගන්තිය යටතේ යම් සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අදහස් කරන විටෙක, පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතුය:-

(අ) ඒ සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන පාර්ශ්වකරු විසින්, පරීක්ෂණය හෝ නඩු විභාගය පැවැත්වීමට නියම කර ඇති දිනට දින හතළිස් පහකට පෙර, විරුද්ධ පාර්ශ්වකරු වෙත දැනුම් දීමකින් පසුව, විරුද්ධ පාර්ශ්වකරු වෙත එකී පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කිරීමට අදහස් කරන එකී සාක්ෂි පිළිබඳ ලැයිස්තුවක්, එකී සාක්ෂිවල පිටපතක් හෝ විරුද්ධ පාර්ශ්වකරුට එකී සාක්ෂිවල ස්වභාවය තේරුම් ගත හැකි වන සේ ඒ සාක්ෂි පිළිබඳ ප්‍රමාණවත් විස්තර සහිතව, අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; නැතහොත්, ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(ආ) ඉහත දැක්වෙන විධිවිධාන යටතේ දැන්වීමක් කරන ලද්දේ යම් පාර්ශ්වකරුවකු වෙත ද ඒ පාර්ශ්වකරු විසින්, ඒ දැන්වීම ලැබීමෙන් දින පහළොවක් ඇතුළත,

(i) ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සාක්ෂිවලට;

(ii) අවස්ථාවෝචිත පරිදි, සාක්ෂි උත්පාදනය කිරීමට හා ඉදිරිපත් කිරීමට භාවිත කරනු ලබන යන්ත්‍රයට, උපක්‍රමයට හෝ පරිගණකයට;

(iii) සාක්ෂි උත්පාදනය කිරීමට අදාළ යම් වාර්තාවලට හෝ ඒ උත්පාදනය කිරීමේ දී භාවිතා කරනු ලබන පද්ධතියට;

ප්‍රවේශය ලබාගැනීමට සහ, එය පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාගැනීමේ අවසරය, ඒ දැන්වීම කළ පාර්ශ්වකරුගෙන් ඉල්ලුම් කරනු ලැබිය යුතු ය;

(ඇ) ඒ සාක්ෂිවලට, යන්ත්‍රයට, උපක්‍රමයට, පරිගණකයට, වාර්තාවට හෝ පද්ධතියට ප්‍රවේශයක් ලැබ, පරීක්ෂා කිරීමේ අවස්ථාවක් ලබාගැනීමේ අවසරය සඳහා වූ ඉල්ලීම ලැබුණුවිට, ඒ සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන පාර්ශ්වකරු විසින්, යුක්තිසහගත කාලයක් ඇතුළත, එහෙත් ඉල්ලීම ලැබීමෙන් පසු දින පහළොවක් පසු වීමට පෙර, ඒ ඉල්ලීමට අනුකූලව කටයුතු කළ යුතු අතර, ඒ ඉල්ලීමෙහි සඳහන් ඒ සාක්ෂියට, යන්ත්‍රයට, උපක්‍රමයට, පරිගණකයට හෝ පද්ධතියට ප්‍රවේශයක් ලබා ඒවා පරීක්ෂා කිරීමට යුක්තිසහගත අවස්ථාවක් එසේ ඉල්ලුම් කරන පාර්ශවකරුට හෝ ඔහුගේ අනුයෝජිතයන්ට හෝ ඔහුගේ නාමිකයන්ට ලබාදිය යුතු ය;

(ඈ) ඒ සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන පාර්ශ්වකරුට ප්‍රවේශයක් ලබා පරීක්ෂා කිරීම සඳහා වූ ඉල්ලීමට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වන්නා වූ හෝ කටයුතු නොකරන්නා වූ හෝ අවස්ථාවක හෝ දැන්වීමට හෝ ප්‍රවේශය ලබාගෙන පරීක්ෂා කිරීම සඳහා වූ ඉල්ලීමට හෝ පරීක්ෂා කළ යුතු ආකාරය සහ ප්‍රමාණයට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එකඟවීමට පාර්ශ්වකරුවන්ට නොහැකි වන්නා වූ අවස්ථාවක, කවර පාර්ශ්වකරුකු විසින් හෝ කරන ලද ඉල්ලීමක් මත, අධිකරණය විසින්, යුක්තිය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය වන ආඥාවක් හෝ විධානයක් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ 9 වන සහ 10 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනතේ විවිධිධාන යටතේ යම් සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අදහස් කරන යම් පාර්ශවකරුකු ඉහතකී පරිදි දැන්වීමක් කිරීම පැහැර හරින්නා වූ හෝ ප්‍රවේශය සහ පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබ, ඒ සඳහා සාධාරණ අවස්ථාවක් සලස්වාදීම පැහැර හරින්නා වූ හෝ (ඈ) ඡේදය යටතේ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින්නා වූ හෝ අවස්ථාවක, ඒ පැහැර හැරීම සිදු වූයේ යම් සාක්ෂි සම්බන්ධයෙන් ද ඒවා ඉදිරිපත් කිරීමට ඒ පාර්ශවකරුට අවසර නොදිය යුතු ය.

**පිළිගැනීම්**

8. (1) යම් නඩු කටයුත්තක දී විරුද්ධ පාර්ශ්වකරු විසින් පිළිගන්නා ලද යම් සිද්ධියක් පිළිබඳව යම් සාක්ෂියක් යම් පාර්ශ්වකරුවකු විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(2) යම් නඩු කටයුත්තක දී යම් සිද්ධියක් තහවුරු කිරීම සඳහා මේ පනතේ යම් විධිවිධානයක් යටතේ යම් සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නා වූ අවස්ථාවක, ඒ සාක්ෂිය ආවේශ්‍ය කිරීමට අදාළ, මේ පනතේ ඉහත කී විධිවිධානවල දක්වා ඇති කොන්දේසි කිසිවක් ඉටු කරනු ලැබීද යන්න විවාදයට භාජනය නොවන්නේ නම්, ඒවා ඉටු කරනු ලැබ ඇතැයි ඒ සාක්ෂිය ඉදිරිපත් කරන පාර්ශ්වකරු විසින් පෙන්වාදීම අවශ්‍ය නොවන්නේ ය.

(3) යම් නඩු කටයුත්තක දී, යම් සිද්ධියක් ඔප්පු කිරීම සඳහා මේ පනත යටතේ යම් සාක්ෂියක් ඒ නඩු කටයුත්තේ පාර්ශ්වකරුවකු විසින් ඉදිරිපත් කරන්නා වූ ද ඒ සිද්ධිය ප්‍රතිවිරුද්ධ පාර්ශවකරු දැන සිටිය ද ඒ නඩු කටයුත්තේ දී ඔහු විසින් එය පිළිගෙන නොමැති බව පෙන්වා දෙනු ලබන්නා වූ ද අවස්ථාවක දී, ඒ සාක්ෂිය ඉදිරිපත් කරන පාර්ශ්වකරු විසින් ඒ සාක්ෂිය ඉදිරිපත් කිරීම සඳහා දරන ලද සම්පූර්ණ වියදම (ඒ නඩු කටයුත්තේ දී ඒ පාර්ශ්වකරුට ප්‍රදානය කරනු ලබන වෙනත් යම් ගාස්තුවකට අමතරව), ඒ නඩු කටයුත්තේ දී දෙනු ලබන අවසාන නඩු තීන්දුව හෝ ආඥාව ඒ පාර්ශ්වකරුට පක්ෂව දෙනු ලැබුව ද එසේ නොවුව ද, ඒ පාර්ශ්වකරුට ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

9. පොදු වශයෙන් භාවිතා කරනු ලබන යන්ත්‍රයක්, උපක්‍රමයක් හෝ පරිගණකයක් මගින් හෝ එය භාවිතයෙන් හෝ උත්පාදනය කෙරෙන යම් රෙකෝඩනයක, ප්‍රත්‍යුත්පාදනයක හෝ ප්‍රකාශයක නිරවද්‍යතාව අධිකරණය විසින් පූර්ව නිගමනය කරනු ලැබිය හැකි අතර. යම් රෙකෝඩනයක්, ප්‍රත්‍යුත්පාදනයක් හෝ ප්‍රකාශයක් සම්බන්ධයෙන් අධිකරණය ඒ පූර්ව නිගමනයට එළඹෙන විට සහ ඊට පටහැනි සාක්ෂියක් නැති විට සාක්ෂියේ දී ඒ රෙකෝඩනය, ප්‍රත්‍යුත්පාදනය හෝ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අදහස් කරන යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ රෙකෝඩනය, ප්‍රත්‍යුත්පාදනය හෝ ප්‍රකාශය ආවේශ්‍ය කිරීමට අදාළ, මේ පනතේ ඉහත කී විධිවිධානවල දැක්වෙන කොන්දේසි කිසිවක් සපුරාලනු ලැබ ඇතැයි පෙන්වාදීම අවශ්‍ය නොවන්නේ ය.

10. (1) 6 වන වගන්තිය ප්‍රකාර යම් නඩු කටයුත්තක දී දිවුරුම් ප්‍රකාශයක් සාක්ෂියෙහි ලා ඉදිරිපත් කරන යම් තැනැත්තකු විසින්, අසත්‍ය යයි තමා දන්නා වූ හෝ විශ්වාස කරන්නා වූ හෝ සත්‍ය යයි තමා විශ්වාස නොකරන්නා වූ හෝ යම් ප්‍රකාශයක් ඕනෑකමින්ම කරනු ලබන අවස්ථාවක, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ දඩයකට හෝ ඔහු යටත් වන්නේ ය.

(2) මේ වගන්තියේ කිසිවක් එමගින් යම් අධිකරණයක් සතු එම අධිකරණයට හෝ වෙනත් යම් අධිකරණයකට අපහාස කිරීමක් සම්බන්ධයෙන් දඬුවම් කිරීමේ බලතල හීන කිරීමක් හෝ සීමා කිරීමක් සිදු කෙරෙන ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## IV වන කොටස
## අර්ථ නිරූපණය

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"පරිගණකය" යන්නෙන්, තොරතුරු රැස්කිරීම හා සකස් කිරීම එහි කර්තව්‍යවලට ඇතුළත් වන්නා වූ යම් උපක්‍රමයක් අදහස් වේ;

"අනුපිටපත" යන්නෙන්, මුල් පිටපත මෙන් වූ එකම මුද්‍රණාංකය මගින් හෝ එකම අච්චුවෙන් හෝ (විශාලන, ඌනන සහ ක්ෂුද්‍රරූප ඇතුළුව) ඡායාරූප ශිල්පය මගින් හෝ ඉලෙක්ට්‍රෝනික, යාන්ත්‍රික හෝ රසායනික ප්‍රත්‍යුත්පාදන හෝ ප්‍රත්‍යාභිලේඛන මගින් හෝ මුල් පිටපත නිවැරදිව ප්‍රත්‍යුත්පාදනය කරන වෙනත් සමාන ශිල්පීය ක්‍රම මගින් ඉදිරිපත් කෙරෙන ප්‍රතිරූපයක් අදහස් වේ;

"මුල් පිටපත" යන්නෙන්, පරිගණකයක් මගින් උත්පාදනය කරන ලද යම් රෙකෝඩනයකට හෝ ප්‍රත්‍යුත්පාදනයකට හෝ ප්‍රකාශයකට අදාළ වන විට, එම රෙකෝඩනයම හෝ ප්‍රත්‍යුත්පාදනයම හෝ ප්‍රකාශයම හෝ එය සාදන්නා වූ හෝ නිකුත් කරන්නා වූ තැනැත්තා විසින් එම ප්‍රතිඵලයම ඇති කිරීමට බලාපොරොත්තු වන්නා වූ යම් පිටපතක්, පරිවර්තනයක්, අනුවර්තනයක්, රූපාන්තර කරණයක් හෝ අනුපිටපතක් අදහස් වන අතර, යම් ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය රෙකෝඩනයක් සම්බන්ධයෙන් වන විට ඉන් ලැබෙන ප්‍රති චිත්‍රය හෝ යම් මුද්‍රණාංකයක් සහ පරිගණකයක් මගින් උත්පාදනය කෙරෙන යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් වන විට අවස්ථාවෝචිත පරිදි දැකීමෙන් කියවිය හැකි හෝ කතිත් ඇසිය හැකි මුද්‍රිතයන් හෝ වෙනත් ප්‍රතිදානයන් හෝ ඊට ඇතුළත් වේ;

"ප්‍රකාශය" යන්නට වචනවලින් හෝ අන්‍යාකාරයකින්, යම් සිද්ධියක් පිළිබඳව කරනු ලබන යම් නියෝජනයක් ඇතුළත් වේ.

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

**[සහතිකය සටහන් කලේ 1995 අගෝස්තු මස 25 වන දින]**

**ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ඇති කිරීම සඳහා ද, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණ සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) ව්‍යාපාරික ව්‍යවසායවල ගිණුම් පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී ඒකාකාරී සහ උසස් තත්ත්වයන් පවත්වාගෙනයාමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ (මෙහි මින් මතු "ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිණුම් ප්‍රමිති (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය මගින් කලින් කල සම්මත කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින, හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක හෝ සිට සහ ඉන් පසුව ඒ ප්‍රමිති බලාත්මක විය යුතු ය.

3. (1) ආයතනය විසින්, ව්‍යාපාරික ව්‍යවසාය වල ගිණුම් විගණනය කිරීම පැවැත්වීම පාලනය කිරීමේ ලා අවශ්‍ය විය හැකි (මෙහි මින් මතු "ශ්‍රී ලංකා විගණන ප්‍රමිති" යනුවෙන් සඳහන් කරනු ලබන) යෝග්‍ය විගණන ප්‍රමිති කලින් කල සම්මත කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින, හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක හෝ සිට සහ ඉන් පසුව ඒ ප්‍රමිති බලාත්මක විය යුතු ය.

4. (1) ආයතනය විසින්, මේ පනත යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී ප්‍රතිශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි අතර, එසේ ප්‍රතිශෝධනය කරන ලද, වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද ප්‍රමිති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට ද සැලැස්විය යුතු ය. තවද ඒ ප්‍රතිශෝධනය, වෙනස් කිරීම හා සංශෝධන එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක හෝ සිට සහ ඉන් පසුව ඒ ප්‍රමිති බලාත්මක විය යුතු ය.

(2) ආයතනය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් හෝ ඒවා ප්‍රසිද්ධ කළ හැකි වෙනත් ආකාර මගින්, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ද ඒවාට කරන ලද ප්‍රතිශෝධන වෙනස් කිරීම් සහ සංශෝධන පිළිබඳව මහජනතාවට දැනුම්දෙනු ලැබිය යුතු ය.

5. මේ පනතේ 2 වන හා 3 වන වගන්ති යටතේ ආයතනය විසින් සම්මත කරනු ලැබූ ප්‍රමිති, මේ පනතේ උපලේඛනයෙහි සඳහන් (මෙහි මින් මතු "නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය" යනුවෙන් සඳහන් කරනු ලබන) සියලු ව්‍යාපාරික ව්‍යවසාය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

6. (1) යම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ඉදිරිපත් කිරීමේ අරමුණ ඇතිව, ඒ ව්‍යාපාරික ව්‍යවසායයේ ගිණුම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම ද එම ගිණුම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය කිරීම ද එවැනි සෑම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක වගකීම විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

7. (1) සෑම නිශ්චිත ව්‍යාපාර ආයතනයකම ගිණුම්, ආයතනයේ සාමාජිකයන් විය යුතු වූ ද වෘත්තිය සුදුසුකම් ඇත්තා වූ ද වෘත්තිය කටයුතුවල යෙදීම සඳහා ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද විගණකවරුන් විසින් විගණනය කළ යුතු අතර, විගණනය කරනු ලැබුවේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව බවට ද ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව බවට ද ස්වකීය විගණන වාර්තාවේ සහතික කිරීම එම විගණකවරුන්ගේ වගකීම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් නියම කරනු ලැබූ පරිදි ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට හා විගණන ප්‍රමිති වලට අනුකූලව ක්‍රියාකිරීමට සුදුසුකම් ලත් යම් විගණකවරයකු අපොහොසත් වන අවස්ථාවක දී, කවර ප්‍රමිති වලින් වෙන්ව ක්‍රියාකර තිබේදැයි ඔහු විසින් පැහැදිලිව දැක්විය යුතු අතර, එසේ කිරීම සම්බන්ධයෙන් හේතු ද දැක්විය යුතු ය.

8. (1) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ සාමාජිකයන්ගෙන් සමන්විත ගිණුම් ප්‍රමිති කමිටුවක් මෙයින් පිහිටුවනු ලබන අතර එම කමිටුව මගින්, මේ පනතේ 2 වන වගන්තිය යටතේ ගිණුම් ප්‍රමිති සම්මත කිරීමෙහි ලා අදාළ ආයතනයට නිර්දේශ කිරීම ද අන්‍යාකාරයෙන් සහාය වීම ද කළ යුතු ය.

(2) ගිණුම් ප්‍රමිති කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ආයතනයේ සභාපතිවරයා සහ එම ආයතනයේ සභාව විසින් නම් කරනු ලබන එම ආයතනයේ වෙනත් සාමාජිකයන් පස්දෙනෙක්;

(ආ) එක්සත් රාජධානියේ චරලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයේ (CIMA) ශ්‍රී ලංකා ශාඛාව විසින් නම් කරන ලද එක් සාමාජිකයෙක්;

(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා;

(ඈ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඉ) මහ බැංකුවේ අධිපති විසින් නම් කරනු ලබන මහ බැංකුව නියෝජනය කරන එක් සාමාජිකයෙක්;

(ඊ) ලංකා වාණිජ මණ්ඩලය මගින් නම් කරනු ලබන, සමාගම් අධ්‍යක්ෂවරයෙක් වන හෝ නිශ්චිත වෙළෙඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වයේ දීර්ඝ පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තකු වන එක් සාමාජිකයෙක්; සහ

(උ) ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් නම් කරනු ලබන, සමාගම් අධ්‍යක්ෂවරයකු හෝ නිශ්චිත ව්‍යාපාර ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තත්ත්වයේ දීර්ඝ පළපුරුද්දක් ඇත්තා වූ තැනැත්තකු වන එක් සාමාජිකයෙක්.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද බලපත්‍රලත් වාණිජ බැංකු සම්බන්ධයෙන් හෝ මහ බැංකුවේ අධීක්ෂණ පාලනය යටතට වැටෙන වෙනත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගිණුම් ප්‍රමිති සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට, ගිණුම් ප්‍රමිති කමිටුවෙන් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක දී එම කමිටුව විසින්, ඒ නිර්දේශ කිරීමට පෙර මහ බැංකුව විමසා එහි එකඟත්වය ලබාගත යුතු ය.

9. (1) (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන පරිදි වූ සාමාජිකයන්ගෙන් සමන්විත විගණන ප්‍රමිති කමිටුවක් මෙයින් පිහිටුවනු ලබන අතර, එම කමිටුව විසින් මේ පනතේ 3 වන වගන්තිය යටතේ විගණන ප්‍රමිති සම්මත කිරීමෙහි ලා ආයතනයට නිර්දේශ කිරීම ද අන්‍යාකාරයකින් සහාය වීම ද කළ යුතු ය.

(2) විගණන ප්‍රමිති කමිටුව, ආයතනයේ සභාව විසින් නම් කරනු ලබන ආයතනයේ සාමාජිකයන් අටදෙනකු ගෙන් සමන්විත විය යුතු අතර, අවම වශයෙන් ඉන් හතර දෙනෙක් 8(2) (අ) වගන්තිය යටතේ නම් කරනු ලැබූ ගිණුම් ප්‍රමිති කමිටුවේ සාමාජිකයන් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ආයතනය විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හි දී, විගණන ක්ෂේත්‍රයේ විශේෂ පළපුරුද්දක් ඇති යම් තැනැත්තකු විගණන ප්‍රමිති කමිටුවේ සේවය කිරීම සඳහා යොදවා ගනු ලැබිය හැකිය.

10. (1) (මේ වගන්තියෙහි "නම් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ගිණුම් ප්‍රමිති කමිටුවට පත් කරනු ලැබූ සාමාජිකයකු හෝ විගණන ප්‍රමිති කමිටුවට පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් තමා පත් කළ තැනැත්තා වෙත අමතන ලද ලිපියක් මගින් එම කමිටුවෙන් ඉල්ලා අස්විය හැකිය.

(2) ගිණුම් ප්‍රමිති කමිටුවේ හෝ විගණන ප්‍රමිති කමිටුවේ නම් කළ සාමාජිකයකු අවුරුදු හතරක කාලයක් කමිටුවේ සේවය කළ යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(3) මියගිය හෝ කමිටුවෙන් ඉල්ලා අස්වූ නම් කළ සාමාජිකයකු වෙනුවට ගිණුම් ප්‍රමිති කමිටුවට හෝ විගණන ප්‍රමිති කමිටුවට නම් කරන ලද සාමාජිකයකු විසින් තමා අනුප්‍රාප්ත වන නම් කළ සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා කමිටුවේ සේවය කළ යුතු ය.

11. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ගිණුම් හා විගණන සමීක්ෂණ මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් මණ්ඩලයට පවරන ලද නමින්, එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි සංස්ථාපිත නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම හා ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

12. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) (මෙහි මින් මතු "නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන ධූර දරන තැනැත්තන් වන සාමාජිකයන් තුන්දෙනෙක් -

(i) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා;

(ii) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ; සහ

(iii) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ආ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන හා පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු සාමාජිකයන් දස දෙනෙක්ː-

(i) මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන මහ බැංකුවේ නිලධරයෙක්;

(ii) ආයතනය විසින් නම් කරනු ලැබූ තැනැත්තන් අතුරින් තෝරා ගනු ලැබූ ආයතනයේ සාමාජිකයන් තිදෙනෙක්;

(iii) එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරින්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් නම් කරන ලද තැනැත්තන් තුන්දෙනකු අතුරින් තෝරාගන්නා ලද එම ආයතනයේ සාමාජිකයෙක්;

(iv) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් තුන්දෙනකු අතුරින් තෝරාගන්නා ලද එක් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක්;

(v) සමාගම් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් හෝ නිශ්චිත ව්‍යාපාර ආයතනයක ජ්‍යෙෂ්ඨ තත්ත්වයේ දීර්ඝ කළමනාකරණ පළපුරුද්දක් ඇති වෙනත් තැනැත්තන් දෙදෙනෙක්; ඔවුන් අතුරින් එක් තැනැත්තකු ලංකා වාණිජ මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද නම් තුනකින් තෝරා ගනු ලැබූ එක් සාමාජිකයෙකු විය යුතු අතර අනෙක් තැනැත්තා ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් ඉදිරිපත් කරනු ලබන නම් තුනකින් තෝරා ගනු ලබන තැනැත්තෙක්;

(vi) ශ්‍රී ලංකා බැංකු සම්මේලනය විසින් නම් කරන ලද බැංකුකරුවන් තුන්දෙනකුගේ මණ්ඩලයක් අතුරින් තෝරාගත් එක් ජ්‍යෙෂ්ඨ බැංකුකරුවෙක්; සහ

(vii) එහි විෂය පථය යටතට වැටෙන විශ්වවිද්‍යාලවල ගණකාධිකරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලන අංශ, පීඨ සහ පශ්චාත් උපාධි ආයතන නියෝජනය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන තැනැත්තන් තුන්දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයකින් තෝරා ගනු ලැබූ එක් තැනැත්තෙක් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

13. මණ්ඩලයේ සෑම පත්කළ සාමාජිකයෙක්ම මිය යෑමෙන් ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන්, කලින් ධූරය අත් හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් ධූරය දැරිය යුතු ය.

14. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, කිසිදු හේතුවක් නොදක්වා, මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, එම සාමාජිකයා ගැසට් පත්‍රයේ එම නියමය පළ කරනු ලැබූ දින සිට එම ධූරය අත්හැර ගියා සේ සලකනු ලැබිය යුතු ය.

15. පත්කළ සාමාජිකයකු විසින් තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එම ලිපිය භාරගනු ලැබීමේ දී බලාත්මක විය යුතු ය.

16. ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හැර, සිය ධුරය අත්හරින පත්කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

17. මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුරය පුරප්පාඩුවීමේ දී අමාත්‍යවරයා විසින් 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. එම සාමාජිකයා වෙනුවෙන් පත් කරන ලද යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

18. මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතුය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය මණ්ඩලයේ සාමාජිකයන් හය දෙනකුට වඩා අඩු නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල වැඩ කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කරගනු හැකි ය.

(4) මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව පමණක් නිසා හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දී සිදු වූ යම් දෝෂයක් නිසා හෝ අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරණ ඡන්දයක් ද තිබිය යුතු ය.

19. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

20. (1) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වේ නම්, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදන්වා සභාපතිවරයා සිය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින් ඕනෑම අවස්ථාවක අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාල සීමාව විය යුතු ය.

21. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඊට අත්සන් තබන මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකුගේ ඉදිරිපිට දී හැර නොකරනු ලැබිය යුතු ය.

22. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්-

(අ) මණ්ඩලයේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) එසේ පත් කරන ලද නිලධරයන් හා සේවකයන්ට පාරිශ්‍රමික වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණ නියම කළ යුතු ය.

(ඇ) එම නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කරනු ලැබිය යුතු ය.

(ඈ) එම නිලධරයන්ගේ සහ සේවකයන්ගේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් හා යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කර, එම අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

23. නිශ්චිත ව්‍යාපාර ආයතන මගින් ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකගව ක්‍රියා කරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කර්තව්‍ය විය යුතු ය.

24. මණ්ඩලයට-

(අ) යම් මිලදී ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට ද එය විකිණීමට, උකස් කිරීමට, පැවරීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට;

(ආ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි ගිවිසුම් හා එකඟවීම් ඇතිකර ගැනීමට;

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා හා දේවල් කිරීමට

බලය තිබිය යුතු ය.

25. (1) යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක ගිණුම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇද්ද යන්න තීරණය කිරීමට මණ්ඩලයට හැකිවන පරිදි, එම ආයතනයේ වාර්ෂික ගිණුම්වල පිටපතක් මණ්ඩලය වෙත සැපයීම එවැනි සෑම නිශ්චිත ව්‍යාපාර ආයතනයකම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම් සඳහා, මණ්ඩලය විසින් හෝ තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, නිශ්චිත ව්‍යාපාරික ආයතනයක් විසින් එහි අදාළ ගිණුම් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අවුරුද්දකට වඩා පසු නොවී නිකුත් කරන ලිඛිත දැන්වීමක් මගින් එහි නිශ්චිතව දක්වා ඇති කාලයක් තුළ යම් නිශ්චිත ව්‍යාපාරික ආයතනයක ගිණුම් වලට අදාළව යම් තොරතුරක් මණ්ඩලය වෙත සපයන ලෙස ඒ ව්‍යාපාරික ආයතනයට හෝ එහි විගණකවරුන්ට නියම කරනු ලැබිය හැකි අතර එම දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව තුළ එම නියමයට එකගව ක්‍රියා කිරීම අවස්ථාවෝචිත පරිදි එම ව්‍යාපාර ආයතනයේ හෝ එම ආයතනයේ විගණකවරුන්ගේ කාර්යය විය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම් සඳහා යම් නිශ්චිත ව්‍යාපාරික ආයතනයක ගිණුම් පිළියෙල කිරීමට හෝ ඉදිරිපත් කිරීමට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එම නිශ්චිත ව්‍යාපාරික ආයතනයේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ විගණකවරයකු කැඳවීමට හා ඔහුගෙන් ප්‍රශ්න කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

26. මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන විමර්ශන හෝ පරීක්ෂණ මණ්ඩලය විසින් හෝ තත්කාර්ය සඳහා යථා පරිදි බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ කරනු ලැබිය හැකි අතර එම විමර්ශනය හෝ පරීක්ෂණය සඳහා, යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක යම් අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ විගණකවරයකු ලිඛිත දැන්වීමක් මගින් මණ්ඩලය ඉදිරියට කැඳවනු ලැබිය හැකි ය. නැතහොත් එම විමර්ශනයේ හෝ පරීක්ෂණයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වූ ද එම අධ්‍යක්ෂවරයාගේ, නිලධරයාගේ හෝ විගණකවරයාගේ සන්තකයේ ඇත්තා වූ ද යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

27. (1) (අ) 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 6 වන වගන්තියේ හෝ 7 වන වගන්තියේ විධිවිධානවලට එකගව ක්‍රියා කිරීම පැහැර හරින හෝ උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්;

(ආ) 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තමා වෙත පනවන ලද යම් නියමයකට එකගව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ එවැනි යම් නියමයකට අනුව ක්‍රියා කරමින් හිතාමතාම යම් අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කරන, සෑම තැනැත්තෙක්;

(ඇ) 25 වන හෝ 26 වන වගන්තිවල (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමට නියම කරනු ලැබූ විට එසේ පෙනීසිටීමට අපොහොසත් වන්නා වූ හෝ මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු විසින් තමාගෙන් අසන ලද යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ තමන් සන්තකයේ ඇති පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට එසේ කිරීමට අපොහොසත් වන්නා වූ හෝ මණ්ඩලය විසින් හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනලද තැනැත්තකු විසින් තමාගෙන් අසන ලද යම් ප්‍රශ්නයකට හිතාමතාම අසත්‍ය පිළිතුරු දෙන්නා වූ යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ විගණකවරයකු.

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පත් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ එම වරද සංයුක්ත වන ක්‍රියාව කරන ලද්දේ නිශ්චිත ව්‍යාපාර ආයතනයක කොටස්කරුවන් හෝ එම නිශ්චිත ව්‍යාපාර ආයතනයක හා ගනුදෙනු කරන යම් මූල්‍ය ආයතනයක හෝ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව හෝ නොමඟ යැවී මේ අරමුණ ඇතිව බවට අධිකරණය තීරණය කරන අවස්ථාවක දී, හෝ මේ පනත යටතේ වූ වරදකට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී එම වරද සංයුක්ත වන ක්‍රියාව කරන ලද්දේ එම බැංකුවේ මුදල් තැන්පත් කර ඇති තැනැත්තන් නොමඟ යැවීමේ අදහසින් බවට අධිකරණය තීරණය කරන අවස්ථාවක දී, අධිකරණය විසින් වරදකරු අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වූ වරදක් සංස්ථාවක් විසින් කරනු ලැබූ අවස්ථාවක දී වරද සිදුකරනු අවස්ථාවේ දී සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු, එම වරද සිදු කරන ලද්දේ තමාගේ අනු දැනුම හෝ සහභාගිත්වය නොමැතිව බවට ඔප්පු කරන්නේ නම් මිස හෝ ඔහුගේ කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන එම වරද වැළැක්වීමට ඔහු විසින් ක්‍රියා කළ යුතුව තිබූ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කර ඇත්නම් මිස, එම අධ්‍යක්ෂවරයා, කළමනාකරු, ලේකම්වරයා හෝ වෙනත් නිලධරයා, වරදකට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

28. (1) මණ්ඩලය විසින්, මේ පනත යටතේ වූ වරදක් සිදු කරනු ලැබූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, එම වරද සඳහා නියම කරනු ලැබිය හැකි දඩ මුදලින් තුනෙන් එකකට නොවැඩි මුදලක් සඳහා එම වරද සමථයකට පත් කරනු ලැබිය හැකි අතර මේ වගන්තිය යටතේ වරද සමථයට පත් කිරීමේ දී මණ්ඩලයට ලැබුන සියලු මුදල් මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) නිශ්චිත ව්‍යාපාර ආයතනයක් විසින් හෝ විගණකවරයකු විසින් මේ පනත යටතේ වූ විධිවිධානයක් උල්ලංඝනය කර ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක දී සහ එකී උල්ලංඝනය බරපතල ස්වාභාවික නොවන අවස්ථාවක දී, මණ්ඩලය විසින්-

(අ) එම නිශ්චිත ව්‍යාපාර ආයතනයේ ගිණුම් නැවත විගණනය කරන ලෙස හෝ එම ගිණුම් ප්‍රකාශනය කරනු ලැබූ අවස්ථාවක දී ඒවා නැවත ප්‍රකාශනය කරන ලෙස හෝ එම ගිණුම් පිළිබඳ සුදුසු නිවැරදි කිරීමක් ඊළඟ වර්ෂයේ එහි ගිණුම් වලට ඇතුළත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම නිශ්චිත ව්‍යාපාර ආයතනය පොදු සමාගමක් වන අවස්ථාවක දී එසේ එකඟව ක්‍රියා නොකිරීම සඳහා වූ හේතු පැහැදිලි කරමින් ද, එසේ එකඟව ක්‍රියා නොකිරීමේ හේතුවෙන් එකී සමාගමේ ගිණුම් කෙරෙහි වූ මූල්‍ය බලපෑම පැහැදිලි කරමින් ද ලිඛිත දැන්වීමක් සියලු කොටස් හිමියන් වෙත යවනු ලැබිය යුතු ය. තව ද එම නිශ්චිත ව්‍යාපාර ආයතනය ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබා දී ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත පොදු සමාගමක් වූ අවස්ථාවක දී එම දැන්වීමේ පිටපත් එම කොමිෂන් සභාවට හා එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට ද යැවීමට ද නියම කළ හැකි ය.

29. යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක යම් ගණකාධිකාරීවරයකු විසින් මේ පනතේ යම් විධිවිධානයන් කඩ කරන ලද අවස්ථාවක දී, එම ගණකාධිකාරීවරයාට එරෙහිව සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට ඔහු සාමාජිකත්වය දරන වෘත්තිය ආයතනයට හැකිවන පරිදි එම කඩ කිරීම පිළිබඳව එම වෘත්තිය ආයතනයට දැනුම්දීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

30. යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක් මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී එම කරුණු -

(අ) එම නිශ්චිත ව්‍යාපාර ආයතනයේ කටයුතු පාලනය කිරීමට හෝ අධීක්ෂණය කිරීමට නීතිය මගින් බලය පවරා ඇති යම් අධිකාරියකට දැනුම් දීම; සහ

(ආ) එසේ අනුකූලව ක්‍රියා නොකිරීමේ හේතුවෙන් එම ව්‍යාපාර ආයතනයේ බදු වගකීම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති බව මණ්ඩලය විසින් සලකනු ලබන්නේ නම්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම

මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

31. (1) අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් වූ ද යම් නිශ්චිත ව්‍යාපාර ආයතනයක කලින් වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රයේ පෙන්වා ඇති පරිදි කොටස් හිමියන්ගේ සමකොටස් වල ප්‍රතිශතයක් හෝ කලින් වර්ෂය සඳහා එම ව්‍යාපාර ආයතනයේ ලාභාලාභ ගිණුමේ පෙන්වා ඇති පරිදි බදු ගෙවීමෙන් පසු ලාභයේ ප්‍රතිශතයක් යන දෙකෙන් වඩා වැඩි මුදල වූ ද මුදලක් සෙස් බද්දක් වශයෙන් සෑම නිශ්චිත ව්‍යාපාර ආයතනයකින් ම අයකර ගනු ලැබ පනවනු ලැබ, ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතු අතර එසේ පළකරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් එසේ අනුමත නොවූ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද යම් ක්‍රියාවක වලංගු භාවයට එමගින් හානියක් නොවිය යුතු ය. නියම යත් අනුමත කරනු නොලැබූ දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

32. (1) මණ්ඩලයට මණ්ඩලයේ ම අරමුදලක් තිබිය යුතු ය.
මණ්ඩලයේ අරමුදලට-

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) 31 වන වගන්තිය යටතේ පනවනු ලැබූ සෙස් බද්ද වශයෙන් මණ්ඩලයට ලැබුණු සියලු මුදල්; සහ

(ඇ) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී මණ්ඩලයට ලැබුණු සියලු මුදල්,

බැරකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

33. (1) මණ්ඩයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

34. එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී මණ්ඩලය විසින් එම වර්ෂය ඇතුළත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් පළ කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ විට අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

35. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව හෝ

කිසිම අපරාධ හෝ සිවිල් නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලබතොත් හැර, මණ්ඩලයේ අරමුදලින් ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබිය යුතු ය.

36. මණ්ඩලයේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

37. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

38. (1) නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු අනුමතය සඳහා පහසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

39. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"සමාගම" යන්නෙහි 1982 අංක 17 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ලංකා වාණිජ මණ්ඩලය" යන්නෙන් වෙළෙඳ සංගම් ආඥාපනත මගින් සංස්ථාපිත ලංකා වෙළඳ සංගමය අදහස් වේ;

"ණය නිශ්කාෂණ සමාගම" යන්නෙන්-

(අ) සේවා දායක සමාගමක වෙළෙඳ ණය සඳහා වගකීම භාර ගන්නා සමාගමක් ද;

(ආ) සේවා දායක සමාගමකට අයවිය යුතු වෙළෙඳ ණය සඳහා වගකීම භාරගෙන එමගින් පාඩු විදීමේ අවදානමින් සේවාදායක සමාගම නිදහස් කරන සමාගමක් ද;

(ඇ) සේවා දායකයකුගේ වෙළෙඳ ණය භාරගෙන ඇතැම් අවස්ථාවල දී එම ණය ප්‍රමාණයෙන් කොටසක් වහාම ගෙවා ඉතිරි මුදල ණය මුදල කල් පිරීමෙන් පසු ගෙවීමට භාර ගන්නා සමාගමක් ද;

(ඈ) සාමාන්‍යයෙන් සේවා දායකයකුගේ මුදල් ලැබීම වැඩි දියුණු කිරීම සඳහා එම සේවා දායකයාගේ ණය මුදලක් හෝ ණය කීපයක් මිල දී ගන්නා සමාගමක් ; හෝ

(ඉ) කොන්දේසි සහිතව හෝ රහිතව සේවා දායකයකුගේ ණයක් රක්ෂණය කරන සමාගමක් ද අදහස් වේ;

"අරමුදල් කළමනාකරණ සමාගම" යන්නෙන්, තම සේවා දායකයාගේ මනාපය හා අවශ්‍යතා අනුව සුදුසු පරිදි වත්කම් පරාසයක ආයෝජනය කරමින්, එම සේවා දායකයාගේ ආයෝජන කළමනාකරණය කරන සමාගමක් අදහස් වේ;

"වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය" යන්නෙන්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය පනත මගින් පිහිටුවන ලද වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය අදහස් වේ;

"බලපත්‍රලාභී වානිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බැංකු ව්‍යාපාර කටයුතු පවත්වාගෙනයාමට බලපත්‍ර ලබා ඇති පොදු සමාගමක් අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් පනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"කොටස් හිමියන්ගේ සම කොටස්" යන යෙදුම, පොදු සමාගමක් සම්බන්ධයෙන් යොදනු ලබන විට එම සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය හා එහි සංචිතය අදහස් වේ.

40. මේ පනතේ සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති සමාගම්
රක්ෂණ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත යටතේ බලය පවරන ලද සමාගම්.

බදු ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම්.

ණය නිශ්කාෂණ සමාගම්.

1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්.

ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දී ඇති සමාගම්.

**අරමුදල් පාලක සමාගම්**

ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දෙන ලද සමාගම්.

ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දී ඇති සමාගම්.

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දී ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානගත ලැයිස්තුගත සමාගම්.

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානගත ලැයිස්තුගත නොවූ-

(අ) නියමිත සීමාව ඉක්ම වූ පිරිවැටුමක් ඇති සමාගම්;

(ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී නියමිත සීමාව ඉක්ම වූ කොටස් හිමියන්ගේ සම කොටස් ප්‍රමාණයක් පැවති සමාගම්;

(ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දී මුළු වත්කම නියමිත සීමාව ඉක්මවා ඇති සමාගම්;

(ඈ) ඉකුත් වර්ෂය අවසානයේ දී නියමිත සීමාව ඉක්මවූ බැංකුවලට හා මූල්‍ය ආයතනවලට බැරකම් පැවැති සමාගම්;

(ඉ) නියමිත සීමාව ඉක්මවන කාර්ය මණ්ඩලයක් ඇති සමාගම්;
භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි යෙදී සිටින රාජ්‍ය සංස්ථා

ඉහත සඳහන් වර්ග වලින් කවර වූ හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක් මේ උපලේඛනයේ කාර්ය සඳහා "සමාගම් සමූහය" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 147 වන වගන්තිය යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළයුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

**1995 අංක 16 දරන මුදල් පනත**

**[සහතිකය සටහන් කළේ 1995 අගෝස්තු මස 31 වන දින]**

**1995 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන මුදල් වර්ෂය සඳහා වූ ඇතැම් මූල්‍යමය හෝ අන්‍යාකාර යෝජනාවලට නීතිමය බලය ලබාදීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන පැනවීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 16 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන පරිච්ඡේදය**

**I වන කොටස**

**ඩීසල් මෝටර් වාහන බද්ද පැනවීම**

2. 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සෑම මුදල් වර්ෂයක් සඳහා සෑම ඩීසල් මෝටර් වාහනයක් වෙනුවෙන්ම, (මේ කොටසෙහි 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් දසදහසකට සමාන මුදල් ප්‍රමාණයක ඩීසල් මෝටර් වාහන බද්දක්, නියම කර අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේය. ඒ සෑම වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද ඩීසල් මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින්, අදාළ දිනයේ දී හෝ එදිනට පෙර ගෙවිය යුතු ය:

එසේ වුව ද පාසැල් දක්වා සහ පාසැල්වල සිට ළමුන් ප්‍රවාහනය සඳහා හෝ කාර්යාල හෝ සේවා ස්ථානවලට සහ කාර්යාල හෝ සේවා ස්ථානවල සිට කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා හෝ යොදා ගන්නා වාහන ලෙස, කිසියම් වර්ෂයක දී, මේ පරිච්ඡේදය යටතේ, මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් යම් ඩීසල් මෝටර් වාහනයක් ලියාපදිංචි කරන අවස්ථාවක, ඒ ඩීසල් මෝටර් වාහනය සඳහා ඒ වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද රුපියල් පන්දහසක් විය යුතු ය.

**II වන කොටස**

**සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක් සහ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක් සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්දක් පැනවීම.**

3. 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සෑම මුදල් වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් මේ වගන්තියේ 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක්, මේ පනතේ පළමුවන උපලේඛනයේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත, නියම කර අය කළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද, සුඛෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින්, අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

4. 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සෑම මුදල් වර්ෂයක් සඳහා එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම (මේ වගන්තියේ 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක්, මේ පනතේ දෙවන උපලේඛනයේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණයන් මත නියම කර අයකළ යුතු අතර, ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද, අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින්, අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

5. 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම මුදල් වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් වෙනුවෙන් ම (මේ වගන්තියේ 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය වාහන බද්දක්, මේ පනතේ තුන්වන උපලේඛනයේ පිළිවෙලින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණයන් මත, නියම කර අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

**III වන කොටස**

**බද්ද එකතු කිරීම**

6. මේ පරිච්ඡේදයේ මේ කොටසේ කාර්ය සඳහා 'බද්ද' යන්නට ඩීසල් මෝටර් වාහන බද්ද, සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද, අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් ඇතුළත් වේ.

7. 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් වර්ෂයක් සඳහා, කොමසාරිස්වරයාට ගෙවිය යුතු බද්ද, සෑම නිශ්චිත මෝටර් වාහනයකම ලියාපදිංචි අයිතිකරු විසින්, 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

8. (1) යම් නිශ්චිත මෝටර් වාහනයක් රක්ෂණය කරන්නා වූ හෝ ඒ වාහනයක් සඳහා රක්ෂණ ඔප්පුවක් අලුත් කරන්නා වූ සෑම රක්ෂකයකුම-

(අ) යම් නිශ්චිත මෝටර් වාහනයක් රක්ෂණය කරන්නා වූ හෝ ඒ වාහනයක් සඳහා රක්ෂණ ඔප්පුවක් අලුත් කරන්නා වූ අවස්ථාවේ දී, ඒ වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් ඒ නිශ්චිත වාහනය සඳහා ගෙවියයුතු බද්දට සමාන මුදල් ප්‍රමාණයක් ඒ නිශ්චිත වාහනයේ ලියාපදිංචි අයිතිකරුගෙන් අය කර ගත යුතු ය;

(ආ) එසේ එකතුකරගත් මුදල එම මුදල් ප්‍රමාණය එකතුකර ගත් මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පසළොස්වන දින හෝ ඊට ප්‍රථම, කොමසාරිස්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ආකෘතියක, එසේ නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් ප්‍රකාශයක් ද සමඟ, කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් මුදල් ප්‍රමාණයක් එකතු කරන සෑම රක්ෂකයකු විසින්ම, එසේ අයකරගත් මුදල ලැබුණු බව කොමසාරිස්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි ආකාරයකට, දැන්විය යුතු ය.

(3) (1)වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් නිශ්චිත මෝටර් වාහනයක යම් ලියාපදිංචි අයිතිකරුවකුගෙන් යම් රක්ෂකයකු විසින් එකතුකර ගත් යම් මුදලක් ඒ මුදල ඒ රක්ෂකයා එකතු කරගත් දිනයේ දී, ඒ ලියාපදිංචි අයිතිකරු විසින් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ යම් රක්ෂකයකු විසින් එකතු කරගනු ලැබ කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරීම සඳහා ඒ රක්ෂකයා විසින් දරනු ලබන යම් මුදලක් ඒ රක්ෂකයාගේ ව්‍යාපාරය වස්තු භංගත්වයට පත්වීමේ දී, ඈවර කිරීමේ දී හෝ විසුරුවා හැරීමේ දී ක්‍රියාවේ යොදවනු ලැබීමට හෝ පාලනය කරනු ලැබීමට නැතහොත් ණය හිමියන්ගේ ප්‍රතිලාභය සඳහා පවරන ලැබීමට යටත්වන ඒ රක්ෂකයාගේ දේපළක් නොවන ලෙස සලකනු ලැබිය යුතුය.; තවද ඒ මුදල, එකී රක්ෂකයාගේ වස්තු භංගත්වයට පත් හෝ ඈවර කරනු ලැබූ හෝ පවරනු ලැබූ දේපළින් වෙන්ව තිබිය යුතු අතර, එකී දේපළෙහි කොටසක් ද නොවිය යුතු ය.

(5) යම් නිශ්චිත මෝටර් වාහනයක යම් ලියාපදිංචි අයිතිකරුවකුගෙන් මේ පනත යටතේ එකතු කරගත යුතු බද්ද ඒ අයිතිකරුගෙන් එකතුකර ගැනීමට යම් රක්ෂකයකු අපොහොසත් වන අවස්ථාවක හෝ යම් රක්ෂකයකු විසින් ඒ මුදල අයකරනු ලැබ, එසේ අයකරනු ලැබූ මුදල, එම මුදල එකතුකරනු ලැබුවේ යම් මාසයක දී ද ඒ මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කර නොමැති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ එකතුකර ගැනීමට ඒ රක්ෂකයාට නියම කරනු ලැබුවා වූ එහෙත් එකතුකර නොමැති වූ බද්ද, නැතහොත් අවස්ථාවෝචිත පරිදි, එසේ එකතුකරගනු ලැබ කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කර නොමැති මුදලට හෝ එහි කොටසට ඒ රක්ෂකයා යටත් විය යුතු ය. තවද, අවස්ථාවෝචිත පරිදි, එසේ එකතු කරනු නොලැබූ හෝ එකතු කරගෙන ඒවා ප්‍රේෂණය කරනු නොලැබූ යම් මුදලක්, ඒ මුදල කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබීමට ඒ දිනයට පසුව වූ දින සිට ගෙවීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර,ඒ දින සිට ඒ රක්ෂකයා මේ පනතේ අර්ථානුකූලව ගෙවීම පැහැර හරිනු ලැබූවකු ලෙස සලකනු ලැබිය යුතුය.

(6) යම් රක්ෂකයකු (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පැහැර හරිනු ලැබූවකු ලෙස සැලකෙන අවස්ථාවක, එසේ පැහැර හැරි මුදල් ප්‍රමාණය, 10 වන වගන්තියෙන් සහ 11 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති ආකාරයට, ඒ රක්ෂකයාගෙන් අයකරගනු ලැබිය යුතු ය.

9. සෑම නිශ්චිත මෝටර් වාහනයකම ලියාපදිංචි අයිතිකරු විසින්, ඒ මෝටර් වාහනය සඳහා යම් වර්ෂයක් වෙනුවෙන් රක්ෂණ ඔප්පුවක් නිකුත් කරන ලෙස හෝ අලුත් කරන ලෙස හෝ අයදුම් කරන විට, ඒ නිශ්චිත මෝටර් වාහනය සඳහා ඒ වර්ෂය වෙනුවෙන් බද්ද ගෙවූ බවට සාක්ෂි, රක්ෂකයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

10 (1) 1995 අප්‍රියෙල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භවන යම් වර්ෂයක් සඳහා යම් නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු ගෙවිය යුතු බද්ද, ඔහු විසින් නියමිත දිනයේ දී හෝ ඊට ප්‍රථම ගෙවනු නොලැබූ අවස්ථාවක, එම බද්ද ගෙවීම පැහැර හැර ඇතැයි සලකනු ලැබිය යුතු අතර, ඒ ලියාපදිංචි අයිතිකරු ඒ දිනයේ සිට, පැහැර හැරියකු සේ සැලකිය යුතුය.

(2) යම් බද්දක්, ගෙවීම (1) වන උපවගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පැහැරහරිනු ලැබ ඇතැයි සැලකෙන අවස්ථාවක, එම බද්දට අමතරව, එම බද්දෙන් සියයට පණහකට සමාන දණ්ඩන මුදලක් ගෙවීමට, එම පැහැරහැරි තැනැත්තා යටත් විය යුතුය.

(3) මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, 11 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි එය අය කර ගැනීම සඳහා කටයුතු කිරීමට පෙර, කොමසාරිස්වරයා විසින්, දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත, එසේ පැහැර හැරී ඇති මුදල ගෙවන ලෙස, එය පැහැර හ රිනු ලැබූ තැනැත්තාට නියම කළ යුතු ය.

(4) දැන්වීමක් යම් නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු වෙත පෞද්ගලිකව භාර කරනු ලැබුවහොත් හෝ ඒ වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ එය එම ලියාපදිංචි අයිතිකරු වෙත යථා පරිදි භාර දෙනු ලැබුවාක් සේ සැලකිය යුතු ය. ලියාපදිංචි තැපැලෙන් යවන ලද දැන්වීමක් සම්බන්ධයෙන් වන විට, එය ඔහුට සාමාන්‍යයෙන් භාර දෙනු ලැබිය හැකිව තිබුණු දින දී එය පැහැර හැරී තැනැත්තා වෙත ලැබුණු සේ සැලකිය යුතු ය.

11. 10 වන වගන්තිය යටතේ යවන ලද දැන්වීමක සඳහන් දිනය ඉකුත්වීමට පෙරාතුව බදු මුදල ගෙවා නොමැති අවස්ථාවක, එම බදු මුදල් ප්‍රමාණය සහ එම බදු මුදල ගෙවීම පැහැර හරිනුලැබූ ලියාපදිංචි අයිතිකරුගේ නම සහ අන්තිමට දැනසිටි පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ඒ ගෙවීම පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වූවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා එම පැහැර හැරිය තැනැත්තාට මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ), සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි යම් විධානයක් ඔහු විසින් කළ හැකි ය.

## IV කොටස - විවිධ විධිවිධාන

12. (1) ඩීසල් මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් ඒ වාහනය සංඛ්‍යාවෙන් හයකට නොඅඩු පාසැල් ළමුන් පාසැල දක්වා සහ පාසැලේ සිට ප්‍රවාහනය කිරීම සඳහා හෝ සංඛ්‍යාවෙන් හයකට නොඅඩු කාර්යාල සේවක මණ්ඩලය කාර්යාලය හෝ වැඩකරන ස්ථානය දක්වා සහ කාර්යාලයේ හෝ වැඩකරන ස්ථානයේ සිට ආපසු ප්‍රවාහනය සඳහා හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා හෝ නිරතුරුවම යොදා ගන්නා වාහනයක් ලෙස ලියාපදිංචි කරවා ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළහැකිය. එවැනි යම් වාහනයක් ඒ කාර්යය සඳහා නිරතුරුව යොදාගන්නා බවට සහ අවස්ථාවෝචිත පරිදි ඒ වාහනයේ ප්‍රවාහනය කරන ළමුන් හෝ නිලධරයන් සංඛ්‍යාව පිළිබඳ ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතුය.

(2)(1) වන උපවගන්තිය යටතේ නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලුම් පත්‍රයක් සහ ප්‍රකාශයක් ලැබුණු විට, එහි කර තිබෙන සම්ප්‍රකාශවල සත්‍යතාව පිළිබඳව සෑහීමට පත්වන්නේ නම්, ඒ වාහනය, ඒ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂය තුළ ඒ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කාර්යය සඳහා නිරතුරුව පාවිච්චි කරනු ලබන ලෙසට කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) ඩීසල් මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක හෝ කරන ලද ප්‍රකාශයක අසත්‍ය හෝ සාවද්‍ය ප්‍රකාශයක් කර තිබෙන බව හෝ ඒ ඩීසල් මෝටර් වාහනය එය ලියාපදිංචි කර තිබෙන කාර්යය සඳහා පාවිච්චි නොකරන බව කොමසාරිස්වරයාට දැනගන්නට ලැබුණු අවස්ථාවක, කරුණු කියා සිටීමට ඒ ලියාපදිංචි අයිතිකරුට අවස්ථාවක් දීමෙන් පසු, කොමසාරිස්වරයා විසින් (2) වන වගන්තිය යටතේ ඒ ඩීසල් මෝටර් වාහනය සඳහා කර තිබෙන ලියාපදිංචිය අවලංගු කළ හැකි ය. ඒ සෑම අවලංගු කිරීමක් ම, ඒ ලියාපදිංචිය කරන ලද්දේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂය ආරම්භ වන දිනයේ සිට බලාත්මක විය යුතු ය.

13. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලබන පසුදිනයක දී හෝ බලාත්මක විය යුතු අතර, ඒ නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිටමාස තුනක කාලසීමාවක් ඇතුළත හෝ ඒ කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වන නොලැබුවහොත්, ඒ කාලසීමාව ඉකුත්වීමෙන් පසුව පැවැත්වෙන පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේ දී ඒ නියෝග අනුමත කරන මෙන් යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතුය. එවැනි සෑම අවස්ථාවකම උපලේඛනයෙහි, ඒ යෝජනාව අදාළ වන නියෝගයේ පෙළ ගෙනහැර දැක්විය යුතු ය.

(3) අනුමත කිරීම පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන (1) වන උපවගන්තිය යටතේ වූ යම් නියෝගයක්, ඒ යටතේ කරන ලද කිසිවක වලංගු භාවයට හානියක් නොමැතිව, එම ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සැලකිය යුතු ය. එවැනි යම් නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

14. යම් නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුවක් හෝ එක්සත් ජාතීන්ගේ මණ්ඩලය හෝ එහි යම් නියෝජිත ආයතනයක් නැතහොත් (කවර නමකින්, තනතුරු නාමයකින් හෝ පදවි නාමයකින් හැඳින්වුවද) යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුවේ හෝ එක්සත් ජාතීන්ගේ ආයතනයේ හෝ එහි යම් නියෝජිත ආයතනයක හෝ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන ශ්‍රී ලංකාවේ නියෝජිතයකු හෝ එවැනි යම් ආණ්ඩුවක හෝ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ හෝ එහි යම් නියෝජිත ආයතනයක හෝ ශ්‍රී ලංකාවෙහි වෙළෙඳ කොමසාරිස්වරයා නැතහොත් කොන්සල් නිලධරයා හෝ එවැනි යම් විදේශීය රාජ්‍යයක යම් ආණ්ඩුවක හෝ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ හෝ එහි යම් නියෝජිත ආයතනයක හෝ එවැනි යම් නියෝජිතයකුගේ හෝ කොමසාරිස්වරයකුගේ හෝ කොන්සල් නිලධරයකුගේ හෝ කාර්ය මණ්ඩලයට අයත් ශ්‍රී ලංකා පුරවැසියකු නොවන යම් තැනැත්තකු හෝ යම් නිශ්චිත ජාත්‍යන්තර සංවිධානයක් හෝ ඒ සංවිධානයක ශ්‍රී ලංකා පුරවැසියකු නොවන යම් නියෝජිතයකු වන අවස්ථාවක, ඒ ලියාපදිංචි අයිතිකරු කෙරෙහි මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ජාත්‍යන්තර සංවිධානය" යන්නෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් එවැනි සංවිධානයක් බවට ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් නිශ්චය කොට දැක්වෙන සංවිධානයක් අදහස්වේ.

15. කොමසාරිස්වරයා, මේ පනතේ කාර්ය පරිපාලනය භාරව සිටිය යුතු ය.

16. නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් 1995 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව එහෙත් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙර ඒ, මෝටර් වාහනය වෙනුවෙන් බද්දක් ගෙවීමට නියමිතව ඇති අවස්ථාවක, ඔහු විසින් එම බද්ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් මාස තුනක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ගෙවුවහොත්, ඒ ලියාපදිංචි අයිතිකරු විසින්, එකී නියමය අනුව ක්‍රියාකර ඇත්තාක්සේ සැලකිය යුතු ය. එවැනි බද්දක් එසේ ගෙවනු නොලැබූ අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස තුනක් ඉකුත් වූ පසු එම බද්ද පැහැර හැර ඇති ලෙස සැලකිය යුතු අතර, එම දිනයේ සිට මේ. පනතේ අර්ථානුකූලව ඒ ලියාපදිංචි අයිතිකරු ගෙවීම පැහැර හැරි අයෙකු ලෙස සැලකිය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ මේ පරිච්ඡේදයෙහි, –

"කොමසාරිස්වරයා" යන්නෙන් මෝටර් වාහන පනත යටතේ පත් කරන ලද මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයා අදහස්වේ;

"ඩීසල් මෝටර් වාහනය" යන්නෙන් ඩීසල් ඉන්ධන පාවිච්චිකරන හෝ එම ඉන්ධන පාවිච්චි කිරීමට සකසා ඇති මෝටර් වාහනයක් අදහස් වේ;

"රක්ෂක" යන්නෙන් 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ 1993 පෙබරවාරි මස 16 වන දින හා අංක 754/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් පොදු සමාගමක් බවට පත්කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනත යටතේ පිහිටුවන ලද අනු සංස්ථාවක් හෝ ස්වාධීන සංස්ථාවක් හෝ රක්ෂණ ව්‍යාපාරය කිරීම සඳහා බලය දී ඇති සමාගමක් ලෙස 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත යටතේ ලියාපදිංචිකර ඇති යම් සමාගමක් අදහස් වේ;

"ගොඩබිම වාහනය" යන්නෙන් කවර හෝ භූමියක පාවිච්චිය සඳහා සකස් කර ඇත්තා වූ ද මෝස්තරය සහ සිලින්ඩර් ධාරිතාව නියම කර ඇත්තා වූ ද යම් මෝටර් වාහනයක් අදහස් වේ;

"සුඛෝපභෝගී මෝටර් වාහනය" යන්නෙන්, ගොඩබිම වාහන හැර, සිලින්ඩර් ධාරිතාව සී.සී. 2500 ඉක්මවන යම් ඩීසල් වාහනයක් හෝ සිලින්ඩර් ධාරිතාව සී.සී. 2000ක් ඉක්මවන යම් පැට්රල් මෝටර් වාහනයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"මෝටර් බයිසිකලය" මෝටර් ට්‍රයිසිකලය, මෝටර් ගිලන්රථය, 'මෝටර් අවමංගල රථය' සහ 'ගිලන් වාහනය' යන යෙදුම්වල, මෝටර් වාහන පනතෙහි පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"මෝටර් වාහනය" යන්නෙන් මෝටර් බයිසිකලයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ගිලන් රථයක්, මෝටර් අවමංගල රථයක්, ගිලන් වාහනයක්, ලොරියක්, ට්‍රැක්ටරයක්, අත් ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් නොවන්නා වූ ද (රියැදුරු ඇතුළුව) නව දෙනෙකුට නොවැඩි වූ සංඛ්‍යාවක් හා ඔවුන්ගේ බඩුබාහිරාදිය ගෙනයාම සඳහා තනා ඇති හෝ සකසා ඇත්තා වූ ද යාන්ත්‍රිකව ධාවනය වන කවර හෝ වාහනයක් අදහස් වේ;

"පැට්‍රෝල් මෝටර් වාහනය" යන්නෙන් පැට්‍රෝල් ඉන්ධන පාවිච්චි කරන හෝ එම ඉන්ධන පාවිච්චි කිරීමට සකසා ඇති මෝටර් වාහනයක් අදහස් වේ;

"ලියාපදිංචි කළ" යන්නෙන්, මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කළ යන්න අදහස් වේ:

"අදාළ දිනය" යන්නෙන්-

(අ) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ලියාපදිංචිකරන ලද නිශ්චිත මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට සහ එය ලියාපදිංචි කරන ලද වර්ෂය සම්බන්ධයෙන් වන විට, ඒ මෝටර් වාහනය ලියාපදිංචි කළ දිනය අදහස් වේ;

(ආ) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ලියාපදිංචි කරන ලද නිශ්චිත මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට සහ එය ලියාපදිංචි කරන ලද වර්ෂයට පසු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, ඒ නිශ්චිත මෝටර් වාහනය ලියාපදිංචි කළ දිනයට අනුරූප, එම පසු වර්ෂයේ දිනය හෝ ඒ පසු වර්ෂයේ එවැනි අනුරූප දිනයක් නොමැති විට ඒ නිශ්චිත මෝටර් වාහනය ලියාපදිංචි කළ දිනයට පසු දිනට අනුරූප එම පසු වර්ෂයේ දිනය අදහස් වේ;

(ඇ) 1995 අප්‍රේල් මස 1 වන දිනයට පෙර ලියාපදිංචි කරන ලද නිශ්චිත මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන විට, සහ 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන දිනයෙන් පසුව ආරම්භ වන යම් වර්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ වර්ෂයේ ඒ මෝටර් වාහනය ලියාපදිංචි කළ දිනයට අනුරූප දිනය හෝ ඒ වර්ෂයේ අනුරූප දිනයක් නොමැති විට, ඒ නිශ්චිත මෝටර් වාහනය ලියාපදිංචි කළ දිනයට පසු දිනට අනුරූප ඒ වර්ෂයේ දිනය අදහස් වේ;

"අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන්නෙන් ද්විත්ව කාර්ය සඳහා ලියාපදිංචි කර තිබෙන සුඛෝපභෝගී මෝටර් වාහනයක් අදහස් වේ;

"අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය" යන්නෙන් සිලින්ඩර් ධාරිතාව සී.සී. 2200 ඉක්මවන්නා වූ එහෙත් සී.සී. 2500 නොඉක්ම වන්නා වූ යම් ඩීසල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර් ධාරිතාව සී.සී. 1800 ඉක්මවන්නා වූ එහෙත් සී.සී 2000 නොඉක්මවන්නා වූ යම් පැට්‍රෝල් මෝටර් වාහනයක් අදහස් වන අතර, එයට ගොඩබිම් වාහනයක් ඇතුළත් වන්නාක් සේ සැලකිය යුතු ය;

"නිශ්චිත මෝටර් වාහනය" යන්නෙන් යම් ඩීසල් මෝටර් වාහනයක්, යම් සුඛෝපභෝගී මෝටර් වාහනයක්, යම් අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් හෝ යම් අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් අදහස් වේ;

"වර්ෂය" යන්නෙන් ඕනෑම වර්ෂයක අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව අනුප්‍රාප්තික වර්ෂයේ මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වේ.

## II වන පරිච්ඡේදය

**රෙදිපිළි පංගු වෙන්කිරීමක් යටතේ අපනයනය කරන රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත මත සෙස් බද්ද නියම කිරීම සහ එකතු කිරීම**

18. 1995 අප්‍රේල් මස 1 වන දින සිට, රෙදිපිළි පංගු වෙන් කිරීමක් යටතේ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන සෑම රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිතයක් සඳහාම, මේ පනතේ හතරවන උපලේඛනයේ ගෙන හැර දැක්වෙන ගෙවීම් ප්‍රමාණයන් අනුව, සෙස් බද්දක් නියම කර අය කළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය.

19. (1) යම් රෙදිපිළි පංගු වෙන් කිරීමක් යටතේ අපනයනය කරන ලද යම් රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිතයන් මත 18 වන වගන්තිය යටතේ ගෙවිය යුතු සෙස් බද්ද එම රෙදිපිළි පංගු වෙන්කිරීම නිකුත් කර ඇත්තේ යම් ලියාපදිංචි අපනයනකරුවකුට ද ඒ අපනයනකරු විසින් අදාළ බලධරයාට ගෙවනු ලැබිය යුතු ය. එම සෙස් බද්ද, ලියාපදිංචි අපනයනකරු විසින් එම රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිතයන් අපනයනය කිරීමෙන් පසුව අපනයන බලපත්‍රයක් සඳහා හෝ එම අපනයනය රෙදිපිළි පංගු වෙන් කරදීමක් යටතේ කරන ලද බව ඔප්පු කිරීම සඳහා, වෙනත් ලේඛනයක් සකසා ගැනීම සඳහා අදාළ බලධරයා වෙත ඉල්ලුම් කරන අවස්ථාවේ දී එම ලියාපදිංචි අපනයනකරු විසින් ගෙවිය යුතු ය.

(2) මේ පනත යටතේ අදාළ බලධරයා වෙත ලැබෙන සියලු සෙස්බදු ලැබුණු බව අධිකාරිය විසින් නියම කරන ආකාරයට අදාළ බලධරයා විසින් දැනුම් දිය යුතු ය.

20. 19 වන වගන්තියේ සඳහන් බලපත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී අදාළ බලධරයාට 18 වන වගන්තිය යටතේ ගෙවීමට බැඳී සිටින යම් සෙස් බද්දක් ගෙවීම, ලියාපදිංචි අපනයනකරුවකු විසින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ ලියාපදිංචි අපනයනකරුට එම බලපත්‍රය හෝ වෙනත් ලේඛනය නිකුත් කිරීම අදාළ බලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීම සහ ඒ ලියාපදිංචි අපනයනකරුට නිකුත් කරන ලද සහ තත්කාලයේ වලංගුව පවත්නා යම් රෙදිපිළි පංගු වෙන්කරදීමක් රෙදිපිළි පංගු මණ්ඩලය විසින් අවලංගු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

21. අදාළ බලධරයා විසින් මේ පනත යටතේ එකතු කරන සියලු සෙස් බදු ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඔහු විසින් සලස්වනු ලැබිය යුතු ය.

22. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිතයන් සඳහා 1995 අප්‍රේල් මස 1 වන දිනට පසු සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර ගෙවිය යුතු හා ලියාපදිංචි අපනයන කරුවකුගෙන්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර අයකර ගන්නා ලද සියලු සෙස් බදු, වලංගු ආකාරයෙන් අයකර ගන්නා ලද හා අයකර ගනු ලබන සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

23. 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ අපනයනය කරන ලද යම් රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිත සඳහා මේ පනත යටතේ යම් සෙස් බද්දක් ගෙවීමට යටත් යම් ලියාපදිංචි අපනයන කරුවකු විසින් එම සෙස් බද්ද මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වී මාස තුනක් ඇතුළත, අදාළ බලධරයාට ගෙවිය යුතු ය. එම සෙස් බද්ද එම කාලසීමාව ඇතුළත ගෙවීම යම් ලියාපදිංචි අපනයනකරුවකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ ලියාපදිංචි අපනයනකරුට නිකුත් කරනු ලැබ තිබෙන සහ තත්කාලයේ වලංගුව පවත්නා යම් රෙදිපිළි පංගු වෙන්කර දීමක්, රෙදිපිළි පංගු මණ්ඩලය විසින් අවලංගු කළ හැකි ය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ මේ පරිච්ඡේදයෙහි

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"ලියාපදිංචි අපනයනකරු" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි පේෂ කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ ලියාපදිංචි වී ඇති රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිත අපනයනකරුවෙක් අදහස් වේ;

"අදාළ බලධරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි අපනයන කරුවකු සම්බන්ධයෙන් වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

(ආ) පේෂ කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලියාපදිංචි අපනයනකරුවකු සම්බන්ධයෙන් වන විට ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

"රෙදිපිළි අපනයන පංගුව" යන්නෙන් ශ්‍රී ලංකාවෙන්, වෙනත් යම් රටකට, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඒ වෙනත් රට අතර ඇති ගිවිසුමක් යටතේ සහ ඊට අනුකූලව, යම් නිශ්චිත රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිත ප්‍රමාණයක්, යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත අපනයනය කිරීමේ හිමිකම අදහස් වේ;

"රෙදිපිළි නිෂ්පාදිතය" යන්නෙන් මෙහි පහත සඳහන් කිසිවකින් සාදන ලද නිෂ්පාදිතයක් අදහස් වේ:-
එනම්-
කපු, ලෝම, මිනිසා විසින් නිෂ්පාදිත කෙඳි, සේද මූඩු කෙඳි හෝ වෙනත් ශාඛ කෙඳි;

"රෙදිපිළි පංගු වෙන්කරදීම්" යන්නෙන් නිශ්චිත රෙදිපිළි ප්‍රමාණයක් හෝ රෙදිපිළි නිෂ්පාදිත ප්‍රමාණයක්, නිශ්චිත කාලසීමාවක් තුළ, වෙනත් යම් රටකට, ඒ රටට අදාළ රෙදිපිළි අපනයන පංගුව යටතේ, අපනයනය කිරීමට ඉඩ සලසමින්, ලියාපදිංචි අපනයනකරුවකු වෙත රෙදිපිළි පංගු මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලය දීමක් අදහස් වේ;

"රෙදිපිළි පංගු මණ්ඩලය" යන්නෙන් රෙදිපිළි අපනයන පංගු පරිපාලනය සහ කළමනාකරණය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද රෙදිපිළි පංගු මණ්ඩලය අදහස් වන අතර, එහි අනු කමිටුවක්ද ඊට ඇතුළත් වේ.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

[3 වන වගන්තිය]

**සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා බදු ගෙවීම් ප්‍රමාණ**

| වර්ෂය | | ගෙවීම ප්‍රමාණය | |
|---|---|---|---|
| | | රු. | ශත |
| සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (1995 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | ... | 50,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | ... | 45,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | ... | 40,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | ... | 35,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | ... | 30,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | ... | 25,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | ... | 20,000 | |
| ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | ... | නැත | |

**නිදර්ශනය**

සුඛෝපභෝගී මෝටර් වාහනයක් 1991 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන සිව්වන වර්ෂය වන) 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රු. 30,000ක් වේ.

සුඛෝපභෝගී මෝටර් වාහනයක් 1995 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී වාහනය වෙනුවෙන් 1995 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රු. 50,000ක් වේ.

සුඛෝපභෝගී මෝටර් වාහනයක් 1996 අගෝස්තු මාසයේ දී ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන ප්‍රථම වර්ෂය වන) 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රු. 45,000ක් වේ.

## දෙවන උපලේඛනය

**[4 වන වගන්තිය]**

**(අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන නොවන)**
**අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන සඳහා බදු ගෙවීම ප්‍රමාණ**

| වර්ෂය | | ගෙවීම ප්‍රමාණය<br>රු. |
|---|---|---|
| අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | ... | 25,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | ... | 22,500 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | ... | 20,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | ... | 17,500 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | ... | 15,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | ... | 12,500 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | ... | 10,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | ... | නැත |

## තුන්වන උපලේඛනය

**[5 වන වගන්තිය]**

**අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන සඳහා බදු ගෙවීම් ප්‍රමාණ**

| වර්ෂය | | ගෙවීම් ප්‍රමාණය<br>රු. |
|---|---|---|
| අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | ... | 10,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | ... | 9,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | ... | 8,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | ... | 7,000 |

| වර්ෂය | | ගෙවීම් ප්‍රමාණය රු. |
|---|---|---|
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | ... | 6,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | ... | 5,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | ... | 4,000 |
| ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය (ලියාපදිංචි කළ වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන වර්ෂයක් වුව ද පසුව ආරම්භ වන වර්ෂයක් වුව ද) ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | ... | නැත |

## හතරවන උපලේඛනය

[18 වන වගන්තිය]

### රෙදිපිළි නිෂ්පාදිත සඳහා සෙස් බදු ගෙවීම් ප්‍රමාණය

| රෙදිපිළි නිෂ්පාදිතය | | | | ගෙවීම් ප්‍රමාණය |
|---|---|---|---|---|
| යට ඇඳුම් නොවන ඇඟළුම් සහ වෙනත් රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත | | | ... | දුසිමකට රු. 12/- |
| අත්මේස් | ... | ... | ... | කුට්ටම් දුසිම් දහයකට රු. 12/- |
| වර්ග මීටර වශයෙන් අපනයනය කරන රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත | | | ... | වර්ග මීටර් දහයකට රු. 3/- |
| බර අනුව අපනයනය කරන රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත | | | ... | කිලෝ ග්‍රෑමයකට රු. 2/- |
| තුවා හා කොට්ට උර | ... | ... | ... | කැලි හතළිහක් සඳහා රු. 12/- |
| යට ඇඳුම් | ... | ... | ... | දුසිම් පහකට 12/- |

**1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 16 වන දින]**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධන කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 22 වන වගන්තියේ "බැංකුව" යන වචනයේ අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"බැංකුව" යන්නෙන් -

(අ) 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද යම් බැංකුවක් හැර 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල බලපත්‍රලත් වාණිජ බැංකුවක් ;

(ආ) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව පනතින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව; සහ

(ඇ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුව

අදහස් වේ.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින]**

**තොග සහ සිල්ලර විකිණීම් සම්බන්ධයෙන් පළාත් සභා විසින් පිරිවැටුම් බදු පැනවිය හැක්කේ යම් සීමා ඇතුළත ද සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව ද ඒ සීමා හා නිදහස් කිරීම් නියම කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත, 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) තොග සහ සිල්ලර විකිණීම සම්බන්ධයෙන්, පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්තියක් මගින් පනවනු ලබන පිරිවැටුම් බද්දක්, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ දැක්වෙන සීමා ඇතුළත ද, මේ පනතේ උපලේඛනය සමඟ කියවිය යුතු, මේ වගන්තියේ (3) වන උපවගන්තියේ දැක්වෙන නිදහස් කිරීම් වලට යටත්ව ද, විය යුතු ය.

(2) ඒ පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි අනුප්‍රමාණය කිසිම අවස්ථාවක දී ඒ බද්ද අය කෙරෙන පිරිවැටුමෙන් සියයට පහක් නොඉක්මවිය යුතුය.

(3) මේ පනතේ උපලේඛනයේ දැක්වෙන තොග සහ සිල්ලරට විකිණීම්වලින් ලැබෙන පිරිවැටුම, ඒ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි "භාණ්ඩය" සහ "නිෂ්පාදකයා" යන යෙදුම්වල, 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි ඒ යෙදුම් සඳහා දී ඇති අර්ථම ඇත්තේය.

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදයෙන් පිහිටුවා ඇති පළාත් සභාවක් අදහස් වේ.

**2. 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත**

**I වන උපලේඛනය**

[ (2) (1) වගන්තිය]

නිෂ්පාදකයකු විසින්, ඔහු නිෂ්පාදනය කළ භාණ්ඩ කිසිවක් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම්.

ශ්‍රී ලංකාවෙන් පිටත ගැණුම්කරුවන්ට භාණ්ඩ කිසිවක් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් විසින් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම්.

**1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින]**

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

1. මේ පනත 1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ Vඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය.

**"Vඅ පරිච්ඡේදය**

මහ බැංකුව විසින් යම් සමාගම්වල කොටස් මිල දී ගැනීම.

මහබැංකුවට සමාගම්වල කොටස් මිලදී ගත හැකි බව.

105අ. මේ පනතේ යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මුදල් මණ්ඩලයේ මතය අනුව ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය අංශවල මානව සම්පත් හා තාක්ෂණික සංවර්ධනය දියුණු කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා පිහිටුවනු ලැබූ හෝ මේ පනතේ 98 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 112අ වගන්තියේ සඳහන් පහසුකම් සියල්ලම හෝ ඉන් යම් පහසුකමක් සඳහා විධිවිධාන සලස්වා ඇති යම් සමාගමක කොටස්, මහ බැංකුව විසින් මිල දී ගෙන දරා සිටිය හැකි ය".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ සහ 112ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතුය:-

වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම්.

112අ. මහ බැංකුව විසින්-

(අ) සුරැකුම්පත් ගනුදෙනු බේරුම් කිරීමේ කාර්ය සඳහා, වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යාම සඳහා;

(ආ) සහතික රහිත සුරැකුම්පත් දැරීම, සෘජු සහභාගිකරුවන් අතර සහතික රහිත සුරැකුම්පත් නිශ්කාෂණය කිරීමේ සහ එම ගනුදෙනු බේරුම් කිරීමේ කාර්යය සඳහා වාණිජ බැංකු නොවන යම් සෘජු සහභාගිකරුවන් ඇතුළුව සෘජු සහභාගකරුවන්ට මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යාම සඳහා

පහසුකම් සලසනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා:

"සෘජු සහභාගිකරු" යන්නෙන් ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 21ඈ වගන්තිය යටතේ හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ සෘජු සහභාගිකරුවකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ;

"වාණිජ බැංකුවක් නොවන ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන් වාණිජ බැංකුවක් නොවන ප්‍රාථමික අලෙවිකරුවකු අදහස් වේ:

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන් ස්කන්ධ හා සුරැකම්පත් පිළිබඳ ප්‍රාථමික හා ද්විතීය වෙළෙඳපලේ ප්‍රතිපක්ෂය වශයෙන් මහ බැංකුව සමග ගනුදෙනු කිරීමේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත් කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"සහතික රහිත සුරැකම්පත්" යන්නෙන් සහතික රහිත ආකාරයට නිකුත් කරනු ලබන සුරැකුම්පත් අදහස් වේ;

"සුරැකුම්පත්" යන්නෙන්-

(i) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව සහතික රහිත ආකාරයට හෝ අන්‍යාකාරයකින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්;

(ii) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව සහතික රහිත ආකාරයට හෝ අන්‍යාකාරයකින් නිකුත් කරනු ලබන ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත්:

(iii) සහතික රහිත ආකාරයට හෝ අන්‍යාකාරයකින් මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් ප්‍රුරාකුම්පත් අදහස් වේ.

96 (1) හෝ 112ඇ වගන්තිය යටතේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා යම් සංස්ථාවක් විසින් පහසුකම් සැලැස්විය යුතු බව

112ආ. 98 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් හෝ 112ඇ වගන්තිය මගින් පවරනු ලැබූ කාර්යය ඉටු කිරීමේ කාර්යය සඳහා, එම වගන්තිවල සඳහන් පහසුකම් සියල්ලම හෝ ඉන් යම් පහසුකමක් සැලසීමට මහ බැංකුව විසින් යම් සංස්ථාවකට බලය පවරනු ලැබිය හැකිය".

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**1995 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත**

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 22 වන දින]**

1. මේ පනත 1995 අංක 27 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 9 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "නිල පඩිනඩි, යම් විශ්‍රාම වැටුප් හෝ 4(1) වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් සේවා නියුක්තියකින් ලැබෙන යම් ලාභ වශයෙන් -" යන වචන සහ ඉලක්කම් වෙනුවට "නිල පඩිනඩි හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් සේවා නියුක්තියකින් ලැබෙන ලාභ වශයෙන් -" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (i) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-
"(1) ජනරජය යටතේ යම් වැටුප් ලබන ධුරයක් දරන යම් පුද්ගලයකුට ඒකාබද්ධ අරමුදලින් ගෙවීම්;";

(3) ඒ ඡේදයේ (ix) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් -
" (x)සියලුම සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ පත් කරනු ලබන මණ්ඩලයක් හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක් වන, යම් පනතක් මගින් හෝ යම් පනතක් යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක හෝ පරීක්ෂණ කොමිෂන් සභාවක සමාජිකයකුට හෝ සේවා නියුක්තයකුට ගෙවීම්;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-
"(අඅ) (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ ඇති) ප්ලැග්ෂිප් සමාගමක් විසින් ඒ ගිවිසුමේ නියමය යටතේ ඒ සමාගමේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කර ඇති කාලය තුළ හෝ ඉන්පසුව එක් අවුරුද්දක් ඇතුළත ඒ සමාගමේ ආදායම් බද්දෙන් නිදහස් ලාභ සහ ආදායමින් යම් කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්.

මේ ඡේදයෙහි " ප්ලැග්ෂිප් සමාගම " යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමක් ඇති කර ගෙන ඇත්තා වූ ද , ඒ ගිවිසුමට අනුකූලව ඒ ගිවිසුමේ සඳහන් කාලය ඇතුළත ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා -

(අ) යම් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම හෝ ඉදිකිරීම හෝ යම් ඉඩමක්, පිරියත, යන්ත්‍රෝපකරණ හෝ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම; සහ

(ආ) (අ) ඡේදයෙහි ඇතුළත් කර නොමැති යම් වත්කමක් අත්කර ගැනීම

සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන පනහක් හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කර ඇත්තා වූ ද යම් සමාගමක් අදහස් වේ";

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "17 ඈ, 18" යන ඉලක්කම් වෙනුවට "17ඈ, 17ඒ, 18" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්.

4 ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඌ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තිය 17ඒ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය.:-

දියුණු තාක්ෂණය භාවිත කරමින් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන කාර්මික ව්‍යවසායයක ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ඒ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම්, ඒ සමාගම විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයක ද ඒ ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට අවුරුදු පහක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2)(1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබූ;

(ආ) තත්කාර්ය සඳහා 1996 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත,1997 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරන ලද නියමයක් මගින් මේ වගන්තිය අදාළ වන සමාගමක් බවට, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද;

(ඇ) දියුණු තාක්ෂණය භාවිත කරමින් හුදෙක් -
(i) යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදය කිරීම හෝ සෑදීම; හෝ
(ii) යම් සේවයක් සැලසීම සඳහා යම් කාර්මික ව්‍යවසායක් පවත්වා ගෙන යාමෙහි ලා යෙදී සිටින;

(ඈ) සමාගමක සංස්ථාගත කළ දින සිට වසර දෙකක කාලයක් ඉකුත්වීමට පෙර සමාගම විසින් කරගෙන යනු ලබන ව්‍යවසායේ ප්‍රයෝජනය පිණිස යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම හෝ උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන දහයකට නොඅඩු ප්‍රමාණයක් ආයෝජනය කර ඇති;

(ඉ) මේ සමාගමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරන ලද දිනයේ සිට මාස හයකට වැඩි නොවන කාලයක් ඇතුළත දිනයක සිට, (1) වන උපවගන්තියෙහි සඳහන් අවුරුදු පහක කාලය අවසන් වනතෙක් ඒ සමාගමේ අධ්‍යක්ෂවරු හැර, සේවා නියුක්තයන් පනස් දෙනකුට අඩු නොවන සංඛ්‍යාවක් දිගටම සේවයේ නියුක්ත කරන්නාවූ ; සහ

(ඊ) කලින් පැවතියා වූ යම් ව්‍යාපාරයක් බෙදීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන් හෝ අත්කර ගැනීමෙන් පිහිටුවනු නොලැබූ යම් සමාගමකට අදාළ විය යුතුය.
මේ උපවගන්තියේ (ඉ) ඡේදයේ කාර්ය සඳහා "සේවා නියුක්තයා" යන්නෙහි, 16 ඇ වගන්තියේ (2) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඉ වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයෙහි "17ඈ වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 22 ඇ වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "17ඈ වගන්තිය, 17ඒ වගන්තිය, 20 වන වගන්තිය සහ 22 ඇ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි පාර්ශව සටහනෙහි " 17ඈ, 20 වන" යන වචන හා ඉලක්කම් වෙනුවට "17ඈ, 17ඒ, 20 වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "17උ වගන්තිය හෝ 17 ඌ වගන්තිය හෝ 22අ වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "17උ වගන්තිය හෝ 17ඌ වගන්තිය හෝ 17 ඒ වගන්තිය හෝ 22 අ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) (අඅඅඅ) ඡේදයෙහි "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (අඅඅඅ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුලත් කිරීමෙන් :-

"(අඅඅඅඅ) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හැට දහසක දීමනාවක් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ අතුරු විධානයෙහි "(අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි හෝ " යන වචන වෙනුවට "(අඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅ) ඡේදයෙහි හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි -

(අ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ -

(i) (ඊ) ඡේදයෙහි " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(උ) 1995 අප්‍රෙල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් හැට දහසක දීමනාවක්;

(ආ) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයෙහි -

(i) ඒ අතුරු විධානයේ (i) වන අනුඡේදයෙහි "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් විසිහත් දහසකට; සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1987 අප්‍රේල් මස 1වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් විසිහත් දහසකට;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) ඒ අතුරු විධානයේ (ii) වන අනුඡේදයෙහි "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතළිස් දෙදහසකට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතළිස් දෙදහසකට; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(iii) ඒ අතුරු විධානයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:-

"(iii) ඒ තක්සේරු වර්ෂය 1995 අප්‍රෙල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට, රුපියල් හැට දහසකට".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැකවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (i) වන උපවගන්තියේ අතුරු විධානයෙහි -

(අ) ඒ අතුරු විධානයේ (iv) වන අනුඡේදයෙහි " 1986 අප්‍රේල් මස1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසි හත්දහසක් සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1986 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසිහත් දහසක් ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන;

(ආ) ඒ අතුරු විධානයේ (v) වන අනුඡේදයෙහි " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතළිස් දෙදහසක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතළිස් දෙදහසක්; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ අතුරු විධානයේ (v) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(vi) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක් ";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (iv) වන අනුඡේදයෙහි "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඇ කොටසෙහි උචිත අනුප්‍රමාණ අනුව" යන වචන හා ඉලක්කම් වෙනුවට "1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඇ කොටසෙහි උචිත අනුප්‍රමාණ අනුව හෝ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (vi) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන්:-

"(vii) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඉ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව හෝ;

"(viii) 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඊ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇඇ වගන්තියේ "සියයට පහළොවක අනුප්‍රමාණයක් අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතුය". යන වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" සියයට පහළොවක අනුප්‍රමාණයක් අනුව ආදායම් බදු අය කරනු ලැබිය යුතුය:

එසේ වුවද, ශ්‍රී ලංකාවේ එම තැනැත්තා 11 වන වගන්තියේ (අඅ) ඡේදයේ අර්ථානුකූලව ජ්‍යෙෂ්ඨ සමාගමක් වන අවස්ථාවක, එම රාජ්‍ය භාගයෙන් සියයට දහයක අනුප්‍රමාණයක් අනුව ආදායම් බද්දක් අය කරනු ලැබිය යුතුය".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තියේ (අ) ඡේදය පහත දැකවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් නම්" යන වචන හා ඉලක්කම් වෙනුවට " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1993 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා නම්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කිරීමෙන්.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

1993 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තියෙන් ලබන ලාභ මත වූ බද්දට ප්‍රතිපක්ෂව බදු බැර.

32ඉඉඉ. (1) 67 වන වගන්තියේ (7) වන උප වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නා වූ යම් පුද්ගලයකුගේ, 1993 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කළ හැකි ආදායමෙහි සේවා නියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක –

(අ) ඒ තක්සේරු වර්ෂය 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය නම් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ ප්‍රමාණය -

(i) රුපියල් එක්ලක්ෂ හතළිස් හතර දහස නොඉක්මවන අවස්ථාවක රුපියල් විසිපන්දහස් හයසිය පනහක්, හෝ

එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට ආරෝපණය කල හැකි ආදායම් බදු මුදල,

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලකට සමාන මුදලක්;

(ii) රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහසක් ඉක්මවන අවස්ථාවක රුපියල් එක් දහස් අටසිය, හෝ

එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කල හැකි ආදායම් බදු මුදල,

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක්;

(ආ) ඒ තක්සේරු වර්ෂය 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය වන විට සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ ප්‍රමාණය.

(i) රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහස නොඉක්මවන අවස්ථාවක –

රුපියල් විසි එක් දහස් නවසිය පනහක මුදලක් හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ත ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල,

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට, සමාන මුදලක්;

(ii) රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක් ඉක්මවන නමුත් රුපියල් එක් ලක්ෂ අසූදහසක් නොඉක්මවන අවස්ථාවක -

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහස ඉක්මවන අදාළ සේවා නියුක්ති ලාභ වලින් සියයට තිස් දෙකයි පහෙන් හතරක මුදලක් රුපියල් දාහත් දහස් නවසිය දහ අටෙන් අඩු කළ පසු ඉතිරි මුදල, හෝ එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක්;

(iii) රුපියල් එක් ලක්ෂ අසූ දහස ඉක්මවන අවස්ථාවක-
රුපියල් හය දහසක් හෝ, එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල, යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක්;

(ඇ) ඒ තක්සේරු වර්ෂය 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක, සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ ප්‍රමාණය -

(i) රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහස නොඉක්මවන අවස්ථාවක -

රුපියල් පහළොස් දහස් හත්සියයක් , හෝ
ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල,
යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලකට සමාන මුදලක්;

(ii) රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහස ඉක්මවන නමුත් රුපියල් එක් ලක්ෂ හැත්තෑ දහස් හාරසියය නොඉක්මවන අවස්ථාවක -

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ රුපියල් එක්ලක්ෂ හතලිස් හතර දහස ඉක්මවන අදාළ සේවා නියුක්ති ලාභ වලින් ලාභ සියයට තිස්පහක් වූ මුදල රුපියල් දොළොස් දහස් දෙසිය හතලිස් හතරින් අඩු කළ පසු ඉතිරි වන මුදල, හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල,

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක්;

(iii) රුපියල් එක් ලක්ෂ හැත්තෑදහස් හාරසියය ඉක්මවන අවස්ථාවක -

රුපියල් තුන් දහසකට සමාන මුදලක්, හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවානියුක්ති ලාභ වලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල,

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක්;

ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුගේ "අදාළ සේවා නියුක්ති ලාභ" යන්නෙන්-

(i) මේ පනතේ පළමුවන උප ලේඛනයේ IV වන කොටස් නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණ අනුව ආදායම් බදු අය කළ හැකි යම් ලාභ ඇත්නම් එම ලාභ කොටස ; සහ

(ii) 32 වගන්තියේ (2) වන උප වගන්තියේ අතුරු විධානයෙන් විධිවිධාන සලසා ඇති පරිදි 32 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව ආදායම් බදු අය කළ හැකි යම් ලාභ ඇත්නම් ඒ ලාභ කොටස

යන දෙකේ එකතුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ වලින් අඩු කිරීමෙන් පසු ඉතිරි වන ලාභය අදහස් වේ;

(ආ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුගේ "අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල" යන්නෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ තක්සේරු කල හැකි ආදායම, දරන අනුපාතයම වන අනුපාතයක් යම් මුදල් ප්‍රමාණයකට එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු අදාළ ආදායම් බදු මුදල දරන්නේ ද ඒ මුදල් ප්‍රමාණය අදහස් වේ;

(ඇ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුගේ " අදාළ ආදායම් බද්ද" යන්නෙන් මේ පනතේ මේ වගන්තිය යටතේ හෝ වෙනත් යම් වගන්තියක් යටතේ යම් සහනයක් ලබාදීමට පෙර ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් මේ උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන හා (ii) වන අනු ඡේදවල සඳහන් සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ මත ආදායම් බදු මුදල් අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල අදහස් වේ;

(ඈ) යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකුගේ "අදාළ තක්සේරු කළ හැකි ආදායම" යන්නෙන්- ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමින් මේ උප වගන්තියේ (අ) ඡේදයේ (i)හා (ii)වන අනුඡේද වල සඳහන් සේවා නියුක්තියෙන් ලබන යම් ලාභ වල එකතුව අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල, හෝ
එම තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ වලට සමාන මුදලක් යන දෙකෙන් කවර වූ හෝ වැඩි මුදල අදහස් වේ".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ක වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා "යන වචන වෙනුවට "යම් වෙළෙඳ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම, සැදීම හෝ ඇසිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැකවෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ)(i)(1) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත ව්‍යවසාය කර ගෙන ගිය තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකුගේ හෝ බදු අය කළ හැකි අදායම, මේ පරිච්ඡේදයේ විධිවිධාන වලට අනකූලව ආදායම් බද්දට යටත් කළ හැකි කාල සීමාව තුළ කරනු ලැබුවේ නම්; හෝ
(ii)(1) වන උපවගන්තයේ සඳහන් නිශ්චිත ව්‍යවසායේ අපනයන ලාභ සහ අදායම, 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ ඒ නිශ්චිත ව්‍යවසාය විසින් ජාතික රාජ්‍ය සභාවේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකර ගත් ගිවිසුමක් ප්‍රකාර හෝ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන කාලසීමාව තුළ කරනු ලැබුවේ නම් ; සහ".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තියේ (2) වන උපවගන්තියේ (i)වන ඡේදයේ "33(1) වගන්තිය යටතේ: සහ " යන වචන හා ඉලක්කම් වෙනුවට "33(1) (අ) වගන්තිය යටතේ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (7) වන උප වගන්තියෙහි " නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය:

එසේ වුවද, ඒ පුද්ගලයා 11 වන වගන්තියේ (අඅ) ඡේදයේ අර්ථානුකූලව ප්ලැග්ෂිප් සමාගමක සේවයෙහි නියුක්ත පුද්ගලයකු වන අවස්ථාවක, ඔහු ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ආරම්භ කළ දිනයේ සිට ගණන් බලනු ලැබූ අවුරුදු පහක කාලයක් සඳහා නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතුය".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (v) වන ඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන" යන වචන හා ඉලක්කම් වෙනුවට " 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව නමුත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (v) වන ඡේදයට ඉක්බිතිවම පහත දැකවෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(vi) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැටදහසක්".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1)(අ) මාසයකට රුපියල් පන්දහසකට හෝ වර්ෂයකට රුපියල් හැට දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූ පහකට හෝ වර්ෂයකට රුපියල් එක්දහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් නිර්වාසික පුද්ගලයකු

සේවයෙහි නියුක්ත කරන්නා වූද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107 ඇ වගන්තිය යටතේ හෝ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල් වරයා වෙත දැනුම්දීමක් කර නොමැත්තා වූ ද, සෑම සේවා යෝජකයකු විසින්ම (මේ පරිච්ඡේදයේ මින් මතු "නියමිත සේවා නියුක්තයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගයකු තම සේවයෙහි සිටින බව 1995 දෙසැම්බර් මස 31 වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීම කළ යුතුය."

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඇතැම් සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමිකයෙන් අඩු කරගන්නා ලද බදු සේවා යෝජක විසින් ආපසු ගෙවීම සඳහා විශේෂ විධිවිධාන.

112අ. (1) 1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් නිශ්චිත සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයේ ඇතුළත් (32 ඉඉඉ වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථානුකූල) අදාළ සේවා නියුක්ති ලාභ කොටස් වල එකතුව රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක් නොඉක්මවන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය සඳහා මේ පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව ඒ සේවා නියුක්තයාගේ ඒ පාරිශ්‍රමිකයේ ඒ කොටසින් සේවායෝජක විසින් අඩු කර ගෙන කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන ලද ආදායම් බද්ද, ඒ සේවායෝජක විසින් ඒ සේවා නියුක්තයා වෙත ආපසු ගෙවීම නිත්‍යානුකූල වන්නේය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන යටතේ සේවායෝජකයකු විසින් යම් සේවා නියුක්තයකුට ආදායම් බද්ද ආපසු ගෙවනු ලැබූ අවස්ථාවක -

(අ) යම් ගෙවීම් කාල සීමාවක් සම්බන්ධයෙන් ඒ සේවායෝජකයා විසින් කල යුතුව ඇති යම් පසු ප්‍රේෂණය කිරීමට ප්‍රතිපක්ෂව එසේ ආපසු ගෙවන ලද මුදල හෝ එහි යම් කොටසක් හිලවු කිරීමට ; සහ

(ආ) (අ) ඡේදයේ විධිවිධාන යටතේ හිලවු කරන ලද මුදල්වල මුළු එකතුවට වඩා වැඩිවන එසේ ආපසු ගෙවන ලද මුදල් අතිරික්තයක් වේ නම්, තත් කාර්යය සඳහා 1997 මාර්තු මස 31 වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ අතිරික්ත මුදල ආපසු ගෙවනු ලැබීමට ඒ සේවා යෝජකයා හිමිකම් ලබන්නේය.

(3) (2) වන උපවගන්තිය යටතේ හිලවු කිරීමකට අවසර දීම සඳහා හෝ ආපසු ගෙවීමක් ලබාදීම සඳහා, (1) වන උප වගන්තියෙහි සඳහන් ආදායම් බද්ද ආපසු ගෙවීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන ලෙස, කොමසාරිස් ජනරාල් වරයා විසින් ඒ සේවා යෝජකයාට නියම කරනු ලැබිය හැකිය.

(4) සේවා යෝජකයකු විසින් කළ යුතුව ඇති යම් පසු ප්‍රේෂණය කිරීමකට ප්‍රතිපක්ෂව (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ආදායම් බද්දක් ඔහු විසින් (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ හිලවු කර ඇති අවස්ථාවක, එසේ හිලවු කරන ලද බද්ද සම්බන්ධයෙන් 107 වන වගන්තියේ

(1) වන උපවගන්තිය සහ 108 වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ඒ සේවායෝජකයාට අදාළ නොවිය යුතුය.

(5) නිශ්චිත සේවා නියුක්තයකුට (1) වන උපවගන්තිය යටතේ ආපසු ගෙවීමක් ලැබී ඇති අවස්ථාවක -

(අ) මේ පරිච්ඡේදය යටතේ අඩු කරගනු ලැබ (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ආපසු ගෙවනු ලැබූ ආදායම් බදු මුදල 111 වන වගන්තිය යටතේ හිලව් කිරීමකට ; හෝ

(ආ) එම මුදල 149 වන වගන්තිය යටතේ ආපසු ගෙවීමකට
ඒ සේවා නියුක්තයා හිමිකම් නොලබන්නේය".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 ක වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " වෙනත් ආදායම් බද්දකට අතිරේකව, ඒ සේවායෝජකයා විසින් ගෙවිය යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"වෙනත් ආදායම් බද්දකට අතිරේකව, ඒ සේවායෝජකයා විසින් ගෙවිය යුතුය:
එසේ වුවද , 1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සේවා නියුක්තයාගේ නිල පඩිනඩිවල එකතුව, රුපියල් එක් ලක්ෂ හතලිස් හතර දහසක් නොඉක්මවන්නේ නම්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සේවා නියුක්තයාගේ ඒ නිල පඩිනඩි සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් ආදායම් බදු කිසිවක් ගෙවිය යුතු නොවේ "; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "99 වන වගන්තිය, 102 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට "99 වන වගන්තිය, 100 වන වගන්තිය, 102 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි -

(අ) "1994 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට " 1994 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "මුදල් ප්‍රමාණය විය යුතුය", යන වචන වෙනුවට " මුදල් ප්‍රමාණය විය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන්;".

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

(ඇ) 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට -

(i) ඒ සේවා නියුක්තයාගේ එකී පඩිනඩි වලින් රුපියල් හැට දහසක් අඩු කිරීමෙන් පසු, මේ පනතේ පළමුවන උපලේඛනයේ 11ඊ කොටසේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණ අනුව ඒ මත ගණන් බලන ලද ආදායම් බද්ද,

(ii) රුපියල් තුන් දහස
ඉක්මවන්නා වූ මුදල් ප්‍රමාණය විය යුතුය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ " සුදුසුකම් ලබන බෙදා හැරීම" යන අර්ථ කථනයේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

"(i) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ලාභ මත බදු අය කළ හැකි නම්,

(අ) ඒ සමාගම අයත් පන්තියේ සමාගම්වලට අදාළ වන අනු ප්‍රමාණය වශයෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උචිත අනුප්‍රමාණය අනුව; හෝ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සාදනු ලැබූ ඒ පනතේ 17 වනවගන්තිය යටතේ ඒ මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් සමාගමකට අදාළ වන බවට ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක සඳහන් උචිත අනුප්‍රමාණය අනුව; හෝ

බදු අය කරනු ලැබිය හැකි ලාභ ; හෝ

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "32 උ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "32 ඌ වගන්තියේ හෝ 32ඔ වගන්තියේ හෝ 32 ක වගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ ඡේදයේ (අ) අනුඡේදයෙහි -

(i) ඒ අනුඡේදයේ (iii) වන විෂයෙහි " බෙදා හරින ලද ලාභාංශයක් ; හෝ " යන වචන වෙනුවට"බෙදා හරිනලද ලාභාංශයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අනුඡේදයේ (iii) වන විෂයට ඉක්බිතිවම පහත දැක්වෙන විෂයය ඇතුළත් කිරීමෙන් :-

"(iv) වන වගන්තියේ 33 (1) උපවගන්තියේ (අ) ඡේදය යටතේ බදු ගෙවිය යුත්තේ යම් ලාභ සහ ආදායම් මත ද ඒ ලාභ සහ ආදායම මත බද්ද, ඒ මත ශ්‍රී ලංකාවෙන් පිටතදී ගෙවන ලද යම් බද්දක් වෙනුවෙන් 82 වන වගන්තියේ සඳහන් බදු බැර වශයෙන් ඉඩ දෙන ප්‍රමාණය නොඉක්මවන්නේ නම්, ඒ ලාභ සහ අදායම් හෝ"

21. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

**"හත්වන උපලේඛනය"**

[33අ (1) වන වගන්තිය]

1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනයට පෙර ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය:-

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් හෝ , කුඩා සමාගමක් හෝ (නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන) සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 50

1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය.:-

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 25

(ii) නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 33 1/3

(iii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් හෝ කුඩා සමාගමක් හෝ (නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ජනතා සමාගමක් නොවන) සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 40

1993 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතුය;

(i) කුඩා සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 25

(ii) ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් හෝ , (කුඩා සමාගමක් නොවන) සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 33 1/3

1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණය පහත දැක්වෙන පරිදි විය යුතුය:-

(i) 32ඊ වගන්තියේ, 32උෟ වගන්තියේ, 32ඕ වගන්තියේ හෝ 32ක වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභවලින් හැර වෙනත් ලාභවලින් ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් හෝ වෙනත් යම් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 27

(ii) 32උං වගන්තියේ, 32ඖ වගන්තියේ හෝ 32ක වගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අය කරනු ලබන ලාභ වලින් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 8

(iii) 32ඊ වගන්තියේ විධිවිධාන වලට අනුකූලව බදු අය කරනු ලබන ලාභ වලින් සමාගමක් විසින් කරනු ලබන සෑම සුදුසුකම් ලබන බෙදා හැරීමක මුදලට සමාන මුදල මත; සියයට 5"

22. මේ පනතේ පිළිවෙලින් 10 වන 12 වන 13 වන සහ 21 වන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉ, 32ක සහ 33ළ වගන්ති වලට කරන ලද සංශෝධන, සහ ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම සියලු කාර්ය සඳහා 1994 ඔක්තෝබර් මස 31 දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

23. 1994 මැයි මස 18 වන දිනයෙන් ආරම්භ ව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ යම් සේවායෝජකයකු විසින් 112ළ වන වගන්තියේ (i) වන උපවගන්තිය යටතේ ආදායම් බදු කිසිවක් ආපසු ගෙවා හෝ 112ළ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හිලවු කර ඇති අවස්ථාවක -

(අ) එසේ ආපසු ගෙවන ලද හෝ හිලවු කරන ලද ඒ බද්ද අවස්ථාවෝචිත පරිදි වලංගු ලෙස ආපසු ගෙවා ඇති බව හෝ හිලවු කර ඇති බව ; සහ

(ආ) 107 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන වල කුමක් සඳහන්ව ඇත ද එසේ හිලවු කරන ලද බද්ද සම්බන්ධයෙන් ඔහු ගෙවීම පැහැර හැරිය තැනැත්තකු නොවන බව සලකනු ලැබිය හැකිය.

24. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට. සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 28 වන දින]**

**1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත, 1995 අංක 28 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "(මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ඉතිරි කිරීමේ බැංකුව යනුවෙන් හැඳින්වෙන්නා වූ ද 6 වන වගන්තිය යටතේ තත්කාලයෙහි බැංකුවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද සංස්ථාවක්" යන වචන වෙනුවට,"(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ඉතිරි කිරීමේ බැංකුව යනුවෙන් හැඳින්වෙන බැංකුවක් " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. පනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

"බැංකුවේ අරමුණ

2.අ ශ්‍රී ලංකාවේ ජනතාව අතර, විශේෂයෙන්ම සීමිත මුදල් සම්පත් ඇති තැනැත්තන් අතර ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ එසේ ලබාගන්නා ඉතිරි කිරීමේ ලාභදායි ලෙස ආයෝජනය කිරීම බැංකුවේ අරමුණ වන්නේය."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

බැංකුවේ ප්‍රාග්ධනය.

5. (1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය එකක් රුපියල් දහය බැගින් වූ කොටස් එක් බිලියනයකට බෙදන ලද, රුපියල් බිලියන දහයක් වන්නේය.

(2) බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනය, අමාත්‍ය වරයා විසින් මණ්ඩලය විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි වන්නේය. එසේ වුව ද ඒ නිකුත් කළ ප්‍රාග්ධනය, එකක් රුපියල් දහය බැගින් වූ කොටස් මිලියන එකසිය විස්සකට බෙදන ලද, රුපියල් බිලියන එකකුත් මිලියන දෙසියයකට අඩු නොවන මුදලක් විය යුතු ය.

(3) බැංකුවේ සියලු කොටස්, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ නිල තත්ත්වයෙන් ඔහුගේ නාමයෙන් නිකුත් කළ යුතු අතර, ඔහු විසින් ඒ කොටස් කවරාකාර වූ හෝ ආකාරයකින් බැහැර නොකළ යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"බැංකුවේ බලයලත් කටයුතු හා කර්තව්‍ය.

6. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත සඳහන් කර්තව්‍යයන් හෝ කටයුතු සියල්ලෙහි හෝ ඉන් කිසිවක හෝ යෙදීමට බැංකුවට බලය දෙනු ලැබේ:-

(අ) ශ්‍රී ලංකාවෙහි ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම හා යෙදවීම හා තැන්පතු ගිණුම් විවෘත කිරීම, ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කිරීම, ඉතිරි කිරීමේ සහතික නිකුත් කිරීම ඇතුළුව ඊට ආනුෂංගික කටයුතු:

(ආ) ආණ්ඩුව නිකුත් කරන හෝ ආණ්ඩුව ඇප වන සුරැකුම්පත්, ණය පත්‍ර, භාණ්ඩාගාර බිල්පත් හෝ වෙනත් යම් මුදල් සාධන පත්‍ර මිලට ගැනීම සහ විකිණීම:

(ඇ) මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි පොදු උපරිම සීමාවන්ට යටත්ව, අන්තර් බැංකු කැඳවුම් මුදල් වෙළෙඳපළෙහි මුදල් ණයට දීම:

(ඈ) බලපත්‍රලාභි වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවලින්, ඒවායේ ගනුදෙනුකරුවන්ට ණය දීම සඳහා එම වාණිජ බැංකු හා ආයතනවලට තොග වශයෙන් මුදල් ණයට දීම භාර ගැනීම:

(ඉ) ස්වකීය ගනුදෙනුකරුවන්ගේ තැන්පතු වල ඇපය මත එම ගනුදෙනුකරුවන්ට සිල්ලර ණය දීමෙහි යෙදීම:

(ඊ) නිශ්චල දේපළ උකස් මගින් සැපයෙන ඇප මත, නිවාස ණය සැපයීම:

(උ) වෙනත් බැංකු හා මූල්‍ය ආයතන සමග ඒකාබද්ධ ණයදීම්වලට සහභාගි වීම:

(ඌ) යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකම් අත් කර ගැනීම සහ ඒ දේපළ බදු දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

(එ) බැංකුව විසින් මිලට ගන්නා ලද, බද්දට ගන්නා ලද හෝ අන්‍යාකාරයකින් අත්කර ගන්නා ලද ඉඩම්වල ගොඩනැගිලි ඉදි කිරීම;

(ඒ) ඉහත සඳහන් කර්තව්‍යයන්ට සහ කටයුතු වලට ආනුෂංගික හෝ හිතකර විය හැකි වෙනත් යම් ක්‍රියාකාරකම්වල යෙදීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් මුදල් සාධනපත්‍රවල බැංකුව විසින් කරන ලද ආයෝජන, මුදල් මණ්ඩලය අන්‍යාකාරව නිශ්චයක් කළහොත් මිස, බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම්වල සහ තැන්පතු ගිණුම්වල තැන්පත් කර ඇති මුදලින් සියයට හැටකට අඩු නොවිය යුතුය".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"මණ්ඩලයේ සංයුතිය.

8. (1) මණ්ඩලය අධ්‍යක්ෂවරයන් හත් දෙනකුගෙන් සමන්විත විය යුතුය. ඔවුන් අතුරින්-

(අ) (මෙහි මින්මතු "පත්කළ අධ්‍යක්ෂවරයන්" යනුවෙන්) සඳහන් කරනු ලබන පස්දෙනකු අමාත්‍යවරයා විසින්, බැංකුවට, එහි අරමුණ සාක්ෂාත් කර ගැනීමට හැකිවන ආකාරයෙන් බැංකුවේ කටයුතු කාර්යක්ෂමව සහ සාර්ථකව මෙහෙයවීමට හැකි තැනැත්තන් ලෙස අමාත්‍යවරයා සලකන තැනැත්තන් අතුරින් පත් කරනු ලැබිය යුතුය;

ඒ එක් එක් තැනැත්තාට-

(i) බැංකු, වාණිජ ව්‍යාපාරික හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ පළපුරුද්ද හෝ පරිපාලන පළපුරුද්ද හෝ තිබිය යුතුය;
නැතහොත්

(ii) බැංකු කටයුතු, ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, නීතිය, ගණකාධිකරණය, ව්‍යාපාර කළමනාකරනය හෝ වෙනත් විෂයක වෘත්තීය සුදුසුකම් තිබිය යුතු ය; තවද

(ආ) එක් අධ්‍යක්ෂවරයකු භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා විය යුතුය;

(ඇ) එක් අධ්‍යක්ෂවරයකු පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයා විය යුතුය.

(2) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් කළ හොත් මිස, පත්කළ අධ්‍යක්ෂවරයකු අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතුය.

(3) යම් පත්කළ අධ්‍යක්ෂවරයකු තවදුරටත් ධූරයේ සිටීම බැංකුවේ යහපතට හානිකර බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින්, ඒ පත්කළ අධ්‍යක්ෂවරයා, හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) පත්කළ අධ්‍යක්ෂවරයකු විසින්, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින්, සිය ධූරයෙන් කවර වූ හෝ අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින්, ලියවිල්ලක් මගින් භාරගත් විට බලාත්මක විය යුතුය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ ධූර කාලය ඉකුත් වීමෙන් හෝ ධූරය හිස් කරන පත්කළ අධ්‍යක්ෂවරයෙක් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේය.

(6) පත්කළ අධ්‍යක්ෂවරයකු ඔහුගේ ධූර කාලය ඉකුත් වීම හැර අන්‍යාකාරයකින් ධූරය හිස් කළහොත්, ඔහු වෙනුවට අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයකු පත් කළ හැකි අතර එසේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා, ඉහත කී පරිදි ධූරය හිස් කරන අධ්‍යක්ෂවරයාගේ ධූර කාලයෙන් ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතුය.

(7) පත්කල අධ්‍යක්ෂවරයකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ඔහු ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් සුදුසුකම් ඇති වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය."

(7) ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කරනු ලැබීමට නුසුදුසුකම්.

9. යම් තැනැත්තෙකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු ලෙස තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ සිටී නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ බංකොලොත්කරුවකු හෝ බුන්වත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොලත් බංකොලොත්කරුවකු හෝ බුන්වත් වූවකු ව සිටී නම්; හෝ

(ඈ) චරිත දූෂණය ඇතුළත් වන්නා වූ ද බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැක්කා වූ ද වරදකට වරදකරු කරනු ලැබ සිටී නම්,

ඒ තැනැත්තා, 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ දිගටම තනතුරු දැරීමට නුසුදුස්සෙක් වන්නේය."

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"මණ්ඩලයේ සභාපතිවරයා.

11. (1) මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතුය.

(2) සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් ඔහු මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතුය. සභාපතිවරයකු පත්කර නොමැති නම් හෝ මණ්ඩයේ රැස්වීමක් පැවැත්වීමට නියමිත වේලාවේදී සභාපතිවරයා පැමිණ නොමැති නම් පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් තමන් අතුරින් එක් තැනැත්තකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරාගත යුතුය.

(3) සභාපතිවරයා තවදුරටත් ධුරයේ සිටීම බැංකුවේ යහපතට අහිතකර බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් සිය ධුරයෙන් කවර වූ හෝ අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකිය. එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් භාරගනු ලැබූ විට බලාත්මක විය යුතුය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වයේ කාලසීමාව විය යුතුය."

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) මේ පනතේ 26 වන වගන්තිය යටතේ පත් කරනු ලබන බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයාට සාමාන්‍යාධිකාරීවරයා ගේ වැඩ කටයුතු හෝ ඔහුගේ සාමාන්‍ය ක්‍රියා කලාපය හෝ සාකච්ඡාවට භාජන යම් රැස්වීමක් හැර, මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටීමට හා එම රැස්වීම්වලට සහභාගි වීමට අයිතිවාසිකම ඇත්තේය."

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 17වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"මුදල් අනුග්‍රහ ප්‍රදානය කිරීම.

17. (1) ණය දීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය වාණිජ උපමානවල පදනම මත, බැංකුව විසින්, මේ පනත යටතේ මුදල් අනුග්‍රහ ප්‍රදානය කළ යුතු අතර, ණය සඳහා අය කළ හැකි තත්කාලීන වෙළඳපල පොලී අනුපාතික මත, එම මුදල් අනුග්‍රහ ප්‍රදානය සඳහා ආදායමක් ලැබීමට ප්‍රයත්න දැරිය යුතුය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන එසේ තිබුණ ද අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින්, සහ මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීම ආර්ථිකයේ යම් අංශයකට හෝ උප අංශයකට ආධාර කිරීම සඳහා අවශ්‍ය බව ඔහුගේ මතය වන්නා වූ අවස්ථාවක, එම මුදල් අනුග්‍රහය සඳහා වූ ඉල්ලීම හා සම්බන්ධ යම් විශේෂ අවස්ථාගත කරුණු ගැන සැලකිලිමත්ව-

(අ) මණ්ඩලයේ මතය අනුව, බැංකු කටයුතු වලට අදාළ සාමාන්‍ය ප්‍රඥාගෝචර උපමාන වලට අනුකූල නොවන්නා වූ හෝ

(ආ) එවැනි අනුග්‍රහයක් සඳහා බැංකුව සාමාන්‍යයෙන් අයකරන පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් මත වූ

මුදල් අනුග්‍රහයක් ප්‍රදානය කරන ලෙස මණ්ඩලය වෙත ලියවිල්ලකින් විධානයක් කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් -

(අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් විධානයක් කරන අවස්ථාවක, එම මුදල් අනුග්‍රහය ආපසු ගෙවිය යුතු වන හෝ ඒ සඳහා පොලිය ගෙවිය යුතු වන අවස්ථාවේ දී එම මුදල් සහ පොලිය ආපසු ගෙවීම සඳහා, මණ්ඩලයට පිළිගත හැකි නියමයන් මත, අවලංගු කළ නොහැකි, කාල නිශ්චිත ඇපකරයක් එම මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීමට පෙර ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සැපයිය යුතුය; හෝ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් විධානයක් කරන අවස්ථාවක, එවැනි මුදල් අනුග්‍රහයක් සඳහා අයකරනු ලබන පොලිය සහ බැංකුව විසින් සාමාන්‍යයෙන් අයකරනු ලැබිය හැකි වූ පොලිය අතර වෙනස, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සහනාධාරයක් ලෙස බැංකුවට ගෙවිය යුතු අතර, එම සහනාධාරය භාණ්ඩාගාරයේ ලේකම්වරයා සහ මණ්ඩලය එකඟ වන පරිදි වාර්ෂිකව හෝ වෙනත් කාලසීමාවකට වරක් වශයෙන් හෝ ගෙවිය යුතුය ; හෝ

(ඇ) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ විධානයක් කරන අවස්ථාවක, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් පරිදි වූ ඇපකරයක්, එම මුදල් අනුග්‍රහය ප්‍රදානය කිරීමට පෙර සැපයිය යුතු අතර, මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සහනාධාරය ද ගෙවිය යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඇපකරයක් සපයනු ලැබ ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, පහසු මුල්ම අවස්ථාවේ දී, එම ඇපකරය පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතුය.

(5) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපකරයක් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන යම් මුදලක්, බැංකුව විසින් ඒ සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබ, දවස් එකසිය අසූවක් ඇතුළත, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතුය."

11. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 17 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුයː-

"අමාත්‍යවරයා වෙත තොරතුරු සැපයිය යුතු බව.

17අ. බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට විධාන කළ හැකි අතර, මණ්ඩලය විසින් ඒ සෑම විධානයක් ම අනුව ක්‍රියා කළ යුතුය."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කොට මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:-

"බැංකුවේ වියදම

19. බැංකුවේ කර්තව්‍ය සහ ක්‍රියාකාරකම් කර ගෙන යාමෙහි ලා බැංකුව විසින් දරනු ලබනු සියලු වියදම්, බැංකුවේ මුදලින් පියවිය යුතුය."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) බැංකුව විසින්-

(අ) පොදු සංචිතයක් ; සහ

(ආ) සුදුසු යයි මණ්ඩලය අදහස් කරන කාර්ය සඳහා වෙනත් යම් විශේෂ සංචිත පිහිටුවිය යුතුයː තවද,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "බැංකුවේ සංචිත සඳහා ප්‍රතිපාදන කිරීමෙන් පසුව" යන වචන වෙනුවට "බැංකුවේ සංචිතවලට මාරු කිරීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන්.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 21, 22 සහ 23 යන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"සාමාන්‍යාධිකාරීවරයා පත් කිරීම

26.(1) මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය තැනැත්තකු බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා ලෙස පත් කළ යුතුය.

(2) බැංකුවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් මණ්ඩලය විසින් පත් කළ හැකිය.

(3) බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයාගේ, නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප්, දීමනා හා වෙනත් ප්‍රතිලාභ ද ඔවුන්ගේ සේවා කොන්දේසි ද මණ්ඩලය විසින් නිශ්චය කළ යුතුය"

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"උපදේශකයන් සහ විශේෂ උපදේශකවරයෙන් පත්කිරීම.

27. මේ පනතේ යටතේ බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ බැංකුවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය, ගණකාධිකාරීන්, නීතිඥයන්, විගණකවරුන් සහ තක්සේරුකරුවන් වැනි විශේෂ නිපුණතා හෝ වෘත්තීය සුදුසුකම් ඇති තැනැත්තන් බැංකුවේ උපදේශකයන් සහ විශේෂ උපදේශකයන් වශයෙන් මණ්ඩලය විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ උපදේශකයන්ට සහ විශේෂ උපදේශකයන්ට මණ්ඩලය නිශ්චය කරන ආකාරයෙන් හා එසේ නිශ්චය කරන ගෙවීම් ප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවිය යුතුය."

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 සහ 29 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විෂමාචාරය හෝ සිතා මතා පැහැර හැරීම නිසා හැර අන්‍යාකාරයන් සිදුවන හානි හා අලාභ සඳහා වගකීමක් නොමැති බව.

30. තමන්ගේ විෂමාචාරය හෝ තමන් විසින් සිතා මතා පැහැර හැරීම හේතුකොටගෙන සිදු වී ඇති අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් මිස, බැංකුවේ කිසිම අධ්‍යක්ෂකවරයකු, නිලධරයකු හෝ සේවකයකු හෝ මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද බැංකුවේ උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු බැංකුවට විඳින්නට සිදු වී ඇති යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් වගකීමට යටත් නොවිය යුතුය."

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය එහි "සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, විගණකවරයකු, ලේකම්වරයකු, උපදේශකයකු හෝ බැංකුවේ වෙනත් නිලධරයකු හෝ සේවකයකු" යන වචන වෙනුවට "බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු හා මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත්කරන ලද සෑම උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය එහි වූ "සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවකයකු, නියෝජිත ආයතනයක සාමාජිකයකු, ගණකාධිකාරීවරයකු හෝ බැංකුවේ ව්‍යාපාරයෙහි සේවයේ යොදවා සිටින වෙනත් යම් තැනැත්තකු" යන වචන වෙනුවට, "බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු ද රහස්‍යතා ප්‍රකාශය අත්සන් කරන ලෙස මණ්ඩලය විසින් නියම කරනු ලැබූ, මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම උපදේශකයකු හෝ විශේෂ උපදේශකයකු ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය, එහි වූ "බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, විගණකවරයකු, ලේකම්, උපදේශකයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවකයකු" යන වචන වෙනුවට, "බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු සහ සේවකයකු සහ මේ පනතේ 27 වන වගන්තිය යටතේ පත් කරන ලද සෑම උපදේශකයකු සහ විශේෂ උපදේශකයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) විශ්‍රාම වැටුප් අරමුදල වෙනම අරමුදලක් ලෙස පිහිටුවනු ලැබිය යුතු අතර, එය ශේෂ පත්‍රයෙන් වෙන්කර තැබිය යුතු ය.

(1ආ) විශ්‍රාම වැටුප් අරමුදලේ බැදීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අරමුදලේ තිබීම සහතික කිරීම සඳහා, සෑම අවුරුදු දෙකකට වරක් විශ්‍රාම වැටුප් අරමුදලේ ජීවගණක තක්සේරුවක් කළ යුතු ය." තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "නිශ්චල දේපළ ඇපයක්" යන වචන වෙනුවට "චංචල හෝ නිශ්චල දේපළ ඇපයක්" යන වචන ආදේශ කිරීමෙන්.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන" යන වචන වෙනුවට "මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"බැංකුවේ ගිණුම් විගණනය.

37. (1) බැංකුවේ, එක් එක් මුදල් වර්ෂය සඳහා වූ ගිණුම්, ඒ ඒ මුදල් වර්ෂය අවසාන වී මාස තුනක් ඇතුළත, විගණකාධිපතිවරයා වෙත, විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, බැංකුවේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 සහ 40 වන වගන්ති, මෙයින් ඉවත්කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ගිණුම් සඳහා පොළිය.

41. බැංකුවේ තැන්පත් කරන ලද මුදල් සඳහා, මණ්ඩලය නිශ්චය කරන අනුපාතික මත බැංකුව විසින් පොළිය ගෙවිය යුතු ය. එසේ වුවද හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කළ මුදල් සඳහා කිසි පොළියක් නොගෙවිය යුතු ය.".

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය. එහි (5), (6), (7), (8), (9), සහ (10) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) බැංකුව විසින් කිසිම නාමිකයකුට කිසිම ගෙවීමක් කිරීම ඒ නාමිකයා විසින්, ඔහුගේ අනන්‍යතාව සම්බන්ධයෙන් බැංකුවට පිළිගත හැකි සාක්ෂි මගින් සනාථ කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හොත් මිස, නොකළ යුතු ය.

(6) මියගිය නාමයෝජකයකගේ නාමිකයකුට කරන ගෙවීමක්, ඒ නාමයෝජකගේ බැරට තිබෙන මුදල් සම්බන්ධයෙන් බැංකුවේ බැඳීම සම්පූර්ණයෙන් ඉටු කිරීමක් වන්නේ ය."

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය එහි වූ "ඔහුගේ බැරට ඇති මුදල්, සුදුසු යයි බැංකුව කල්පනා කරන ආකාරයට ඒ වෙනත් තැනැත්තාට, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ගෙවිය යුතු ය." යන වචන වෙනුවට, "ඔහුගේ බැරට ඇති මුදල් සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන ආකාරයට, ඒ වෙනත් තැනැත්තාට, මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගෙවිය යුතු ය." යන වචන ආදේශ කරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

30. 1982 අංක 8 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"හිමිකම් නොපෑ තැන්පතු සංචිතය

47. (1) ගිණුමක් අක්‍රියව පැවති ඇති වීම, එනම්-

(අ) ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධයෙන් වන විට එය වයස අවුරුදු දහසයට එළඹීමේ දී හෝ ඉන් පසුව ආරම්භ කරන ලද ගිණුමක් නම්, ඒ ගිණුම ආරම්භ කළ තැනැත්තා විසින්, මුදල් ආපසු ගැනීම සඳහා හෝ ගිණුමෙහි මුදල් තැන්පත් කිරීම සඳහා හෝ පොළිය ඇතුළත් කිරීම සඳහා හෝ එම ඉතිරි කිරීමේ පොත අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති විට හෝ වයස අවුරුදු දහසයට එළඹීමට පෙර ගිණුම ආරම්භ කළ තැනැත්තකු සම්බන්ධයෙන් නම් වයස අවුරුදු දහසයට එළඹි විට හෝ ඉන් පසු අවුරුදු දහයක කාළ සීමාවක් ඇතුළත, මුදල් ආපසු ගැනීම සඳහා හෝ ගිණුමෙහි මුදල් තැන්පත් කිරීම සඳහා හෝ පොළිය ඇතුළත් කිරීම සඳහා හෝ එම ඉතිරි කිරීමේ පොත බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති විට;

(ආ) තැන්පතු ගිණුමක් සම්බන්ධයෙන් වන විට එය වයස අවුරුදු දහසයකට එළඹීමේ දී හෝ ඉන් පසුව ආරම්භ කළ ගිණුමක් නම්, ඒ ගිණුම ආරම්භ කළ තැනැත්තා විසින් එය කල්පිරීමේදී නිරායාසයෙන් අලුත් කිරීම සඳහා බැංකුවට උපදෙස් දී නොමැතිව සහ තැන්පතු ලදුපත අවුරුදු දහයක කාලසීමාවක් තුළ අලුත් කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති විට, හෝ වයස අවුරුදු දහසයට එළඹීමට පෙර ගිණුම් ආරම්භ කළ තැනැත්තකු සම්බන්ධයෙන් නම්, වයස අවුරුදු දහසයට එළඹීමෙන් පසු අවුරුදු දහයක කාල සීමාවක් ඇතුළත ගිණුම් කල්පිරීමේ දී නිරායාසයෙන් අලුත් කිරීම සඳහා බැංකුවට උපදෙස් දී නොමැතිව සහ තැන්පතු ලදුපත අලුත් කිරීම සඳහා ඉදිරිපත් කර නොමැති විට

ඒ ගිණුමේ බැරට තිබෙන මුදල්, "හිමිකම් නොපෑ තැන්පතු සංචිතය" යනුවෙන් හැඳින්වෙන විශේෂ සංචිතයකට මාරු කළ යුතු ය.

(2) හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මුදල් මාරු කරන ලද්දේ යම් ගිණුමකින්ද, මුදල් එසේ මාරු කරනු ලැබූ දින සිට එම ගිණුම තවදුරටත් බැංකුවේ බැඳීමක් ලෙස නොසැලකිය යුතු ය.

(3) හිමිකම් නොපෑ තැන්පතු සංචිතයේ බැරට තිබෙන සම්පූර්ණ මුදල හෝ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එහි යම් කොටසක්, ප්‍රාග්ධනගතකර එසේ ප්‍රාග්ධනගත කරනු ලැබූ මුදල් ප්‍රමාණයේ වටිනාකමට කොටස් බැංකුව විසින් භාණ්ඩාගාරයේ ලේකම්වරයාට නිකුත් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුමක බැරට තිබුණු මුදල් සඳහා, යම් මුදලක් හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීමෙන් පසුව බැංකුව වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක බැංකුව විසින් එම හිමිකම් පෑම පරීක්ෂා කර බැලීමෙන් පසුව, එම ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණයට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා, එසේ ගෙවන ලද මුදල් ප්‍රතිපූරණය කරන ලෙස භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. එම ඉල්ලීම ලැබුණු පසු ඉල්ලුම්කර ඇති මුදල භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, හැකිතාක් ඉක්මණින් ඒකාබද්ධ අරමුදලෙන් බැංකුවට ගෙවිය යුතු ය.".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, (අ) ඡේදයේ "නිශ්චල දේපළ උකසක්: හෝ" යන වචන වෙනුවට "චංචල හෝ නිශ්චල දේපළ උකසක් හෝ ඇපකරයක පදනම මත: හෝ" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ වගන්තියේ, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "බැංකුව වෙත උකස් කරන ලද යම් නිශ්චල දේපළක්" යන වචන වෙනුවට "බැංකුව වෙත උකස් කරන ලද යම් චංචල හෝ නිශ්චල දේපළක්" යන වචන ආදේශ කිරීමෙන්.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ වූ "සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ" යන වචන වෙනුවට "ප්‍රමාණවත් නිශ්චල දේපළක් උකස් කිරීම මත නිවාසයක් මිල දී ගැනීමේ හෝ ඉදිකිරීමේ කාර්ය සඳහා හැර, සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ "යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, එහි "යම් නිශ්චල දේපළ උකසක් මත" යන වචන වෙනුවට "යම් චංචල හෝ නිශ්චල දේපළ උකසක් මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය හැර 52 සිට 74 තෙක් වූ වගන්ති (ඒ වගන්ති දෙකම ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු බැංකුවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු බැංකුවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය."

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය එහි වූ "ණය සහනදායක ආඥාපනතේ ඇතුළත් කිසිවක්" යන වචන වෙනුවට "ණය සහනදායක ආඥාපනතේ හෝ 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ ඇතුළත් කිසිවක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේද ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:-

"(ඈ) තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් ඇති තැනැත්තන් විසින් පාස් පොත් හෝ වෙනත් ඒ සමාන යම් ලේඛන පාවිච්චි කිරීම:

(ඉ) ගිණුම් ඇති තැනැත්තන් විසින් ගිණුම් වර්ගය, තැන්පත්කරුවන් අයත් පන්තිය, එක් වරකට ලබාගත හැකි උපරිම මුදල සහ මුදල් ලබාගත හැක්කේ කොපමණ කාලයකට වරක් ද යන කරුණු සම්බන්ධ පරිසීමා ඇතුළුව, මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පරිසීමාවලට සහ අනුසීමාවලට යටත්ව, චෙක්පත් නිකුත් කිරීම සඳහා පහසුකම්:" සහ

(2) එහි (2) වන උපවගන්තියේ (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට), (ඩ), (ණ), (ත), (ද), (න), (ප), (බ), (ම), (ය), සහ (ළ) යන ඡේද ඉවත් කිරීමෙන්.

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) පිළිවෙළින්, "අනුමත කළ ඉතිරිකිරීමේ කණ්ඩායම" "ලොතරැයිය", "තක්සේරුකාරවරයන්ගේ මූල මණ්ඩලය", සහ "තෑගි තරඟය" යන යෙදුම්වල අර්ථකථන ඉවත් කිරීමෙන්:

(2) "වාණිජ බැංකුව" යන්නෙහි අර්ථකථනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්;

"වාණිජ බැංකුව" යන්නෙන්, බැංකු ව්‍යාපාරය කරගෙන යන්නා වූ ද, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස බලපත්‍ර ලබා ඇත්තා වූ ද සමාගමක් අදහස් වේ;"

(3) "අධ්‍යක්ෂවරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"මුදල් අනුග්‍රහය" යන්නෙන් බැංකුව ගනුදෙනුකරුවකු වෙනුවෙන් ඇප සහතිකයක් දී හෝ අන්‍යාකාරයෙන් බැඳීමක් ඇති කරගෙන ඇති අවස්ථාවක ඒ ගනුදෙනුකරු වෙනුවෙන් බැංකුව විසින් කෙළින්ම හෝ අනියම් ලෙස ප්‍රදානය කරන ලද අත්තිකාරමක් අදහස් වේ;

(4) "නියම කිරීම" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:-

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;"

(5) "පළාත් පාලන ආයතනය" යන යෙදුමෙහි අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලම, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූපවන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ:".

(6) "ගැනුම්කරු" යන වචනයේ අර්ථකථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

"ගැනුම්කරු" යන්න ඉතිරිකිරීමේ සහතිකයක් හා සම්බන්ධව යෙදෙන විට, එයින් මේ පනත යටතේ ඉතිරිකිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ.".

41. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය යටතේ කරන ලද කවර හෝ යෝජනා සම්මතයක්, ඒ වගන්තිය ඉවත් කරනු ලැබුව ද ඒ නොතකා, සියලු කාර්යය සඳහා වලංගු හා බලසහිත බවත්, ඒ අනුව ඒ යෝජනා සම්මතය ප්‍රකාර කරන ලද සියලු ක්‍රියා, ඒ වගන්තිය ඉවත් කිරීමක් සිදු නොවූවා මෙන් තවදුරටත් කරගෙන ගොස් සම්පූර්ණ කළ හැකි බවත් සැක දුරුකිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

**1995 අංක 31 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත**
**[සහතිකය සටහන් කලේ 1995 දෙසැම්බර් මස 11 වන දින]**
**දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 31 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) මේ ආඥාපනත යටතේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ සහ මුදල් ආපසු ගෙවීමේ කාර්යය සඳහා සහ ඒ හා සම්බන්ධ අවශ්‍ය සියලු ක්‍රියා හෝ දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙනුවෙන්, කළ යුතුය";

(ආ) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්: සහ

(ඇ) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන (3) වන හා (4) වන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(3) භාණ්ඩාගාර බිල්පත් ලිඛිත සහතික ස්වරූපයේ බිල්පත් වශයෙන් හෝ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් වශයෙන් හෝ නිකුත් කරනු ලැබිය හැකිය.

(4) භාණ්ඩාගාර බිල්පත්, මිළදී ගැනීම සඳහා වූ කවර හෝ ඉල්ලුම් පත්‍රයක් හෝ ලන්සුවක් ජාතික ආර්ථිකයේ යහපත සලකා, ප්‍රාථමික අලෙවිකරුවන්ට සහ නාමොද්දිෂ්ට අලෙවිකරුවන් නොවන ලන්සු තබන්නනට සීමා කරනු ලැබිය හැකිය."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ " නියම කර නිශ්චය කළ යුතුය" යන වචන වෙනුවට " නියම කර නිශ්චය කළ යුතු නමුත් එය නිකුත් කළ දින සිට එක් වර්ෂයකට වඩා පසුව නොවිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නොවන භාණ්ඩාගාර බිල්පත්‍ර

7. (1) මේ ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නොවන, සෑම භාණ්ඩාගාර බිල්පත්‍රයක්ම, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අත්සන, ප්‍රතිකෘතියක් වශයෙන් , දැරිය යුතුය.

(2) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍රයක් නොවන, සෑම භාණ්ඩාගාර බිල්පත්‍රයක්ම හිමිකම, ඒ බිල්පත්‍රය පිටසන් කොට භාර දීමෙන් පැවරිය හැකි විය යුතුය.

(3) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්‍රයක් නොවන සෑම භාණ්ඩාගාර බිල්පත්‍රයක් සම්බන්ධයෙන්ම-

(අ) ලිඛිත සහතිකයක ස්වරූපයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්‍රයක කිසිම පිටසනක් එම බිල්පත්‍රයේ පසුපිටෙහි තත්කාර්යය සඳහා තබා ඇති ඉඩක ලියන ලද ඒ බිල්පත්‍රය දරන්නාගේ අත්සනින් පිටසන් කර ඇත්නම් හෝ නියෝග මගින් නියම කර ඇති ආකෘතියක වූ වෙනම පැවරීමක හෝ සාධන පත්‍රයක හෝ පිටසන් කර ඇත්නම් මිස, වලංගු නොවන්නේය.

(ආ) භාණ්ඩාගාර බිල්පත්‍රයක් යම් තැනැත්තකු විසින් පිටසන් කිරීමේ හෝ පිටසන් කර භාරදී තිබීමේ හේතුව මතම, ඒ මත ඉපයිය යුතු කිසි මුදලක් ගෙවීමට ඒ තැනැත්තා බැඳී නොසිටින්නේය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 8,9,10,11,12,13,14,15,16 සහ 17 වන වගන්ති ලෙස බලපැවැත්විය යුතුය:-

"සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම, අලෙවි ගනුදෙනු කිරීම සහ ඒ පිළිබඳ වාර්තා තබාගැනීම.

8. (1) මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සහ ඒවා පිළිබඳ අලෙවි ගනුදෙනු කිරීම සඳහා අවශ්‍ය කවර හෝ ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේය. මෙහි ඉහත විධිවිධානවල ව්‍යාප්තිය සීමා නොකොට මෙහි පහත දැක්වෙන දෑ භාරගෙන ඉටු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේය:-

(අ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සහ ඒවා පිළිබඳ අලෙවි ගනුදෙනු වාර්තාගත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවල සටහන් තැබීම හා එම සටහන් පවත්වාගෙන යාම;

(ආ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්වල හෝ ඒවායේ සම්බන්ධතා පිළිබඳව හිමිකම හෝ භාරකාරත්වයන් දැරීම සෘජු සහභාගිකරුවන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා හෝ වෙනුවෙන් වාර්තාගත කිරීම සඳහා ගිණුම් පවත්වා ගැනීම;

(ඇ) 9 වන වගන්තියේ සඳහන් සෘජු සහභාගිකරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳව ඔවුන්ගේ ගනුදෙනු සහ සෘජු සහභාගිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඈ) 10 වන වගන්තියේ සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳව ඔවුන්ගේ ගනුදෙනු සහ අලෙවිකාර සෘජු සහභාගිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්යය ඉටු කිරීම විධිමත කිරීම,අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඉ) අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ඔවුන්ගේ තැරැව් කටයුතු සහ අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඊ) ප්‍රාථමික අලෙවිකරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ගනුදෙනු සහ ප්‍රාථමික අලෙවිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(උ) අලෙවිකරුවන් නොවන නාමෝද්දිෂ්ට ලන්සු තබන්නන් පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ඒ අලෙවිකරුවන් නොවන නමෝදිෂ්ට ලන්සු තබන්නන්ගේ ගනුදෙනු සහ අලෙවිකරුවන් නොවන ලන්සු තබන්නන් වශයෙන් ඔවුන්ගේ කාර්යය ඉටු කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඌ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා ක්‍රමවත් වෙළෙඳපළක් ප්‍රවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා චර්යාධර්ම පද්ධතියක් සකස් කිරීම.

(2) 8, 9, 10 සහ 11 වන වගන්තිවල අන්‍යාකාර විධිවිධාන සලසා නොමැති තාක් දුරට, මෙහි පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස, සෘජු සහභාගිකරුවන්ට හෝ ඔවුන්ගේ යම් ගණයකට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධාන නිකුත් කළ හැකිය :-

(අ) අලෙවිකාර සෘජු සහභාගිකරුවන්ගේ, ගනුදෙනුකරුවන්ගේ ගිණුම් තබා ගත යුතු හා පරිපාලනය කළ යුතු ආකාරය;

(ආ) මුල් මුදල් ගෙවීම් සහ යම් නිදහස් කිරීම් වලින් ලැබෙන මුදල් ඒ ගිණුම්වලට බැර කළ යුතු වේලාවන්;

(ඇ) ඒ ගිණුම් පවත්වා ගැනීම හා පරිපාලනය කිරීම සඳහා අය කළ හැකි ගාස්තු;

(ඈ) සෘජු සහභාගිකරුවන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවන්, අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් හෝ ප්‍රාථමික අලෙවිකරුවන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඉ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්, හෝ ඒවායේ යම් අයිතිවාසිකම් මිළදී ගැනීම, විකිණීම, පැවරීම, ඔඩපනය කිරීම හෝ බැඳීම්වලට යටත් කිරීම කළ හැකි ආකාරය හා ක්‍රමය.

සෘජු සහභාගි කරුවෝ

9. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, යම් ප්‍රාථමික අලෙවිකරුවකු හෝ වෙනත් තැනැත්තකු, සෘජු සහභාගිකරුවකු ලෙස ලියවිල්ලක් මගින් පත් කළ හැකිය. මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සිය සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පවත්වා ගෙන යාමට සෑම සෘජු සහභාගිකරුවකුට ම හැකිවිය යුතු ය.

(2) සෘජු සහභාගිකරුවකු විසින් තමන් සඳහාම සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් දැරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තනි ගිණුමක් පවත්වාගෙන යායුතු ය. එම ගිණුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර ලියවිල්ලක් මගින් නිශ්චිතව නියම කරන ආකෘතියට අනුව සහ ආකාරයට, සෘජු සහභාගිකරුවකු විසින් පවත්වා ගෙන යා යුතු ය.

(3) සෘජු සහභාගිකරුවකුගේ ගිණුම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා තබාගත යුතු අතර එම වාර්තා ඒ ගිණුමේ තත්ත්වය පිළිබඳව අවසානාත්මක සාක්ෂිය විය යුතුය; තව ද ශ්‍රී ලංකා මහ බැංකුව සහ සෘජු සහභාගිකරු කෙරෙහි එය අනුගම්‍ය විය යුතු ය.

(4) සෘජු සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගිණුම්වලට අනුව (මුල් මුදල වශයෙන්, හෝ නිදහස් කිරීමේ මුදල වශයෙන් හෝ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් මත සෘජු සහභාගිකරුවන්ට අයවිය යුතු සියළු මුදල් ප්‍රමාණයන් සහ ගිණුම් ඔවුන් සඳහාමදරන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවන් සම්බන්ධයෙන් වන විට ඔවුන් සඳහාම දරන එවැනි යම් භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් සහ සමූහ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වල ඇති එවැනි භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් වුවද, ඒවා ගෙවිය යුතු වන දිනයන්හි දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජු සහභාගිකරුවන්ට ගෙවිය යුතුය. එම ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්‍රමයකින් සහ ආකාරයකින් කළ යුතුය.

(5) සෘජු සහභාගිකරුවකු විසින්, තමන්ගේම සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගිණුම සම්බන්ධයෙන් ද අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් වන විට, ඒ අලෙවිකාර සෘජු සහභාගිකරුගේ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගිණුම සහ එහි සමූහ ගණුදෙනුකරුවන්ගේ ගිණුම සම්බන්ධයෙන් හෝ එහි ගණුදෙනුකරුවන්ගේ හෝ එයටම අයත් ගිණුම සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි විස්තර, කරුණු හෝ තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(6) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, සෘජු සහභාගිකරුවකු ස්වකීය ගිණුමෙහි දරන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් පවත්වාගෙන යන යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම් ද ඇතුළුව යම් සහතික රහිත බිල්පත් සම්බන්ධව හෝ ඒවා කෙරෙහි බලපෑමක් ඇතිව පවත්වාගෙන යන්නා වූ ද අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් වන විට, ඔවුන්ගේම ගිණුමෙහි දරන සහතික රහිත බිල්පත් සම්බන්ධයෙන් මෙන්ම එහි සමූහ ගණුදෙනුකරුවන්ගේ ගිණුමෙහි දරන සහතික රහිත බිල්පත් සම්බන්ධව පවත්වාගෙන යන්නා වූ ද යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම් පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම, මුදල් මණ්ඩලය විසින් ලියවිල්ලක් මගින් බලය දී ඇති, ශ්‍රී ලංකා මහ බැංකුවේ කවර හෝ නිලධරයකු මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය විය හැකි සියලු පොත් පත්, වාර්තා, හුවමාරු වූ ලිපි, හෝ වෙනත් යම් ලේඛන, සෘජු සහභාගිකරු විසින් සහ එහි නිලධරයන්, අධ්‍යක්ෂවරුන්, සේවා නියුක්තයන්, සේවකයන් සහ අනුයෝජිතයන් විසින් සැපයිය යුතු අතර;මේ ආඥාපනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් නියම වී ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සහාය, ශ්‍රී ලංකා මහ බැංකුවට සැපයිය යුතුය.

(7) ආණ්ඩුව සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධව යම් වගකීමකට යටත් වන්නා වූ හෝ, මුල් මුදල ගෙවීමක් හෝ නිදහස් කිරීමේ ගෙවීමක් කරනු ලබන්නා වූ ද සෘජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ එය හේතුකොටගෙන එම වගකීම උද්ගත වන්නා වූ හෝ ඒ වගකීම කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ආණ්ඩුව විසින් ඉල්ලා සිටීමට ඒ වගකීම හෝ ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට හානිපූරණය කිරීමට ඒ සහභාගිකරු බැඳී සිටිය යුතුය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, "පැහැර හැරීම" යන්නට-

(අ) මේ ආඥාපනතින් යම් සෘජු සහභාගිකරුවකු වෙත හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකු වෙත පැවරී ඇති හෝ නියම වී ඇති යම් කර්තව්‍යයක් කිරීමෙහි ලා හෝ යම් කාර්යයක් ඉටු කිරීමෙහි ලා ඔහුගේ යම් නොසැලකිල්ලක් හෝ පැහැර හැරීමක් ; සහ

(ආ) මේ ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන හෝ මේ ආඥාපනත අදාළ වන යම් කාරණයක් සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ, වරදක් සංයුක්ත වන, සෘජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්-

(i) ඒ වරද සම්බන්ධව යම් නඩු පැවරීමක් සිදු වී තිබුණ ද නොතිබුණ ද, හෝ

(ii) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සෘජු සහභාගිකරු විසින් හෝ අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් හෝ ඒ සෘජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුගේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ කරන ලද්දක් වුව ද

ඇතුළත් වේ.

අලෙවිකාර සෘජු සහභාගිකරු.

10. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් සෘජු සහභාගිකරුවකු අලෙවිකාර සෘජු සහභාගිකරුවකු ලෙස ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් ස්වකීය සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගිණුමට අමතරව සහ එම ගිණුමෙන් වෙන්ව, සමූහ ගණුදෙනුකාර ගිණුමක් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යා යුතු අතර, එය එම අලෙවිකාර සෘජු සහභාගිකරු මගින් මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද සියලු පැවරීම් සම්බන්ධයෙන් වූ තනි සාමූහික ගිණුමක් විය යුතුය. සමූහ ගණුදෙනුකාර ගිණුම, අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව කලින් කළ ලියවිල්ලක් මගින් නිශ්චිතව නියම කරනු ලබන ආකෘතියක සහ ආකාරයකට පවත්වාගෙන යා යුතුය.

(3) අලෙවිකාර සෘජු සහභාගිකරුවන් විසින් පමණක් වෙනත් තැනැත්තන් වෙනුවෙන් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනු කළ හැකිය. සෘජු සහභාගිකරුවකු සහ ශ්‍රී ලංකා මහ බැංකුව හැර, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීමක් හෝ පවරා ගැනීමක් හෝ කිරීමට අදහස් කරන වෙනත් තැනැත්තකු අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් පමණක් එය කළ යුතුය.

(4) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් සිය එක් එක් ගණුදෙනුකරු වෙනුවෙන් වෙන්වෙන් ගිණුමක් පවත්වාගත යුතු අතර අලෙවිකාර සෘජු සහභාගිකරුට මේ ආඥාපනත යටතේ සිය කාර්යය ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය හෝ යෝග්‍ය වන්නා වූ වෙනත් පොත්පත් වාර්තා සහ ලිපි ගොනු ද සිය ගණුදෙනුකරුවන් සම්බන්ධයෙන් පවත්වා ගෙන යා යුතුය.

(5) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තත්කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයේ හෝ දිනවල දී හෝ ඊට පෙර අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් ස්වකීය, ගණුදෙනුකරුවන් අතරින් එක් එක් ගණුදෙනුකරුට ඒ ගණුදෙනුකරුගේ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් මාසික හෝ වෙනත් අන්තර් කාල ප්‍රකාශයක් හෝ ප්‍රකාශ, නිකුත් කළ යුතුය. ඒ එක් ප්‍රකාශය, ශ්‍රී ලංකා මහ බැංකුව නිශ්චිතව සඳහන් කරන කාලසීමාවක් සඳහා එසේ නියම කරන ආකෘතියක ද විය යුතු අතර, එසේ නියම කරන තොරතුරු එහි අන්තර්ගත විය යුතුය.

(6) අලෙවිකාර සෘජු සහභාගිකරුවකුගේ සමූහ ගණුදෙනුකාර ගිණුමේ ඇති සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් මත අය විය යුතු, 9 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුණු කල්හි ඒ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් මත මුල් මුදල නැතහොත් නිදහස් කිරීමේ ගෙවීම් වශයෙන් වූ සියලු මුදල්, ඒවා ගෙවිය යුතු දිනයේදී, ඒවා සඳහා හිමිකම තිබෙන පාර්ශ්වයට හෝ පාර්ශ්වයනට,අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් ගෙවිය යුතුය. එම ගෙවීම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්‍රමයට විය යුතු අතර එසේ නියම කරනු ලබන වේලාවකට සහ ආකාරයකට ද කළ යුතුය.

(7) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් කරන ලද සෑම සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීමක්ම, මේ වගන්තියේ සහ 11 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට සහ එහි විධිවිධාන සලසා ඇති කාර්යය සඳහා කළ යුතුය.

(8) මේ වගන්තියේ (2) සහ (4) වන උප වගන්ති යටතේ අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම, ගණුදෙනුකරුවකුට අදාළ වන තාක් දුරට, අලෙවිකාර සෘජු සහභාගිකරු සහ ගණුදෙනුකරු අතර රහස්‍ය විය යුතු අතර, ඒවා හෙළිදරව් කිරීම සඳහා ගණුදෙනුකරු විසින් ලියවිල්ලකින් බලය දී ඇත්නම් මිස, ශ්‍රී ලංකා මහ බැංකුවට හෝ ගණුදෙනුකරුගේ උරුමකරුවන්, පොල්මෑකරුවන් හෝ පැවරුම්ලාභින්ට හෝ නීතියෙන් නියමිත ආකාරයට හෝ හැර කිසිම තැනැත්තකුට හෙළිදරව් නොකළ යුතුය.

(9) ගණුදෙනුකරුවකු විසින් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් ලබාගන්නා වූ හෝ කරනු ලබන්නා වූ සියලු පැවරීම් සම්බන්ධයෙන් අලෙවිකාර සෘජු සහභාගිකරු ඒ ගණුදෙනුකරුට සම්පූර්ණයෙන් ම වගකිව යුතු අතර වගකීමට බැඳී සිටිය යුතුය.

සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීම.

11. (1) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු මගින් 10 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව කරන ලද පැවරීමක පාර්ශවකරු වන සෘජු සහභාගිකරුවකු හැර සෑම සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරුම්කරුවකු හා පැවරුම්ලාභියකු සම්බන්ධයෙන්ම, ගිණුමක් පවත්වාගෙන යා යුතුය. එහෙත් පැවරුම්ලාභියකු සම්බන්ධයෙන් වෙනත් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් ගණුදෙනුකාර ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවකදී පළමු කී අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් දෙවනු කී අලෙවිකාර සෘජු සහභාගිකරු වෙත ඇති පැවරුම්ලාභියාගේ ගිණුමට මාරු කළ යුතුය.

(2) යම් තැනැත්තකු විසින් 10 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් පැවරීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී ඒ පැවරීම සිදු කරනු ලබන්නේ යම් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් ද ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතිය අනුව සහ ආකාරයට, වහාම-

(i) එම පැවරීම ස්ථිර කිරීමේ හෝ පිළිගැනීමේ ලදුපතක් පැවරුම්කරුට නිකුත් කළ යුතුය.

(ii) පැවරුම්ලාභියාගේ භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් එම අලෙවිකාර සෘජු සහභාගිකරු ගිණුමක් පවත්වා ගෙන යන්නේ නම්, එම පැවරීම ස්ථිර කිරීමේ හෝ පිළිගැනීමේ ලදුපතක්, පැවරුම්ලාභියා වෙත නිකුත් කළ යුතුය.

එසේ වුවද ඉහත සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරු හැර වෙනත් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් පැවරුම්ලාභියාගේ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් ගණුදෙනුකාර ගිණුමක් පවත්වාගෙන යන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නිශ්චය කොට දක්වනු ලබන ආකාරයට, පළමු සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් දෙවනුව සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරුට පැවරුම පිළිබඳව වහාම දැනුම්දීමක් කළ යුතු අතර, ඒ දෙවනු සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් වහාම, ස්ථිර හෝ පිළිගැනීමේ ලදුපත් ශ්‍රී ලංකා මහ බැංකුව කලින් කල නිශ්චිතව නියම කරන ආකෘතිය අනුව සහ ආකාරයට පැවරුම්ලාභියා වෙත නිකුත් කළ යුතුය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ස්ථිර කිරීමේ හෝ පිළිගැනීමේ ලදුපත, ගණුදෙනු සඳහා භාවිතා කළ නොහැකි වන අතර, හුදෙක් එයට අදාළ වන සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් 10 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පැවරීම පිළිබඳ සාක්ෂියක් වශයෙන් එය නිකුත්කළ අලෙවිකාර සෘජු සහභාගිකරු සහ එය නිකුත් කරනු ලැබූ ගණුදෙනුකරු අතර ප්‍රයෝජනයට ගනු ලැබිය යුතුය.

(4) 10 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් සිදු කරනු ලබන පැවරීමකින්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් මහ බැංකුව සමග පවත්වාගෙන යන සමූහ ගණුදෙනුකාර ගිණුමක මුදල් ප්‍රමාණය කෙරෙහි බලපෑමක් ඇති වන අවස්ථාවක, එම පැවරීම හේතුවෙන් එම මුදල් ප්‍රමාණයේ සිදුවී ඇති වෙනස පිළිබඳව ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් වහාම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ නියමිත යම් නිවේදනයක් හෝ ස්ථිර කිරීමේ නැතහොත් පිළිගැනීමේ ලදුපතක් ලිඛිතව නොව වෙනත් ආකාරයකින් විය හැකි බවට සහ එය ශ්‍රී ලංකා මහ බැංකුව නිශ්චිතව නියම කරන විදුලි පණිවුඩ, දුරකථන, චන්ද්‍රිකා, කේබල් හෝ වෙනත් එවැනි යම් ඉලෙක්ට්‍රොනික් චුම්බක හෝ දෘශ්‍ය මාධ්‍යයන් මගින් සම්ප්‍රේෂණ කිරීම, හෝ බාරදීම් කළ හැකි බවට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලැබිය හැකිය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල නිලධරයන් විසින් ක්‍රියාත්මක කිරීම යනාදිය.

12. යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට මේ ආඥාපනතේ යම් විධිවිධානයකින් බලය දෙන ලැබ හෝ නියමිතව ඇති අවස්ථාවක, ඒ බලය කාර්යය හෝ කර්තව්‍ය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය; නැතහොත් ඉටු කරනු ලැබිය හැකිය.

නඩුවලින් ආරක්ෂාව.

13. මේ ආඥාපනත යටතේ ආණ්ඩුව, මුදල් මණ්ඩලය හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින් කරන ලද යම් ගෙවීමක් හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආණ්ඩුවට, මුදල් මණ්ඩලයට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුත්තේය.

වැරදි.

14.(1)(අ) මේ, ආඥාපනතේ යම් විධිවිධානයක් හෝ මේ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කරන ලද නියමයක් නැතහොත් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින;

(ආ) මේ ආඥාපනතේ කාර්යය සඳහා, තමාගේ දැනුම අනුව අසත්‍ය හෝ වැරදි තොරතුරක් සපයන හෝ තමාගේ දැනුම අනුව, අසත්‍ය හෝ වැරදි කරුණු අන්තර්ගත යම් වාර වාර්තා සපයන;

(ඇ) රැවටීමේ චේතනාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කවර හෝ වාර්තාවක හෝ යම් සෘජු සහභාගිකරුවකුගේ හෝ යම් ප්‍රාථමික අලෙවිකරුවකුගේ යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම්වල

(i) අසත්‍ය සටහනක් කරන හෝ කිරීමට සලස්වන; හෝ

(ii) යම් සටහනක් නොකරන හෝ නොකිරීමට සලස්වන; හෝ

(iii) යම් සටහනක් වෙනස් කරන, වසන් කරන හෝ විනාශ කරන හෝ වෙනස් කිරීමට, වසන් කිරීමට හෝ විනාශ කිරීමට සලස්වන

යම් තැනැත්තකු මේ ආඥාපනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ ආඥාපනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

අධ්‍යක්ෂවරයන් හා නිලධරයන් විසින් සිදුකරනු ලබන වැරදි.

15. මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක්, මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළ හොත් මිස,ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

නියෝග

16. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, මේ ආඥාපනතේ විධිවිධාන බලාත්මක කිරීම පිණිස නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම සහ මෙහි මීට ඉහතින් සඳහන් බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එම නියෝග මගින්, මෙහි පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා, විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය:-

(අ) මේ ආඥාපනත යටතේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට අදාළ නියම;

(ආ) භාණ්ඩාගාර බිල්පත් නිකුත් කළ හැකි ක්‍රමය හා ආකාරය;

(ඇ) ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම සහ ඔවුන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි, ඔවුන්ට හිමිකම් ඇති වරප්‍රසාද, සහ ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්යය;

(ඈ) සෘජු සහභාගිකරුවන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවන් සහ අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් පත් කිරීම, ඔවුන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඔවුන් පිළිබඳ සමීක්ෂණයන් පවත්වා ගැනීම;

(ඉ) මේ ආඥාපනත යටතේ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම, දැරීම සහ ඔවුන් පිළිබඳ පරිපාලනය;

(ඊ) සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව, භාණ්ඩාගාර බිල්පත් හෝ ඒවායේ සම්බන්ධකම් මිල දී ගත හැකි, විකිණිය හැකි, පැවරිය හැකි, ඔඩපනය කළ හැකි හෝ බැඳීම් වලට, යටත් කළ හැකි ආකාරය;

(උ) භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමිකව නිකුත් කිරීම සහ ඉන් පසුව ඒවා පැවරීම සහ ඒවා පිළිබඳ වෙනත් ගණුදෙනුවලට අදාළ කාර්ය පටිපාටිය සහ කොන්දේසි.

අර්ථ නිරූපණය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවේ නම් මිස මේ ආඥපනතෙහි :-

"සමූහ ගණුදෙනුකාර ගිණුම" යන්නෙන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් 10 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යන තනි ගිණුමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, මුදල් නීති පනතේ 5 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ගණුදෙනුකරු" යන්න, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු මගින්, සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් හෝ ඒවායේ යම් සම්බන්ධකමක් මිලදී ගන්නා හෝ විකුණන අන්‍යාකාරයකින් අත්කර ගන්නා හෝ බැහැර කරන යම් තැනැත්තකු හෝ ඒ බිල්පත් නැතහොත් ඒවායේ යම් සම්බන්ධකමක් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ ඉඩකඩ ගැන ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු සමග ගණුදෙන සාකච්ඡා පවත්වන යම් තැනැත්තකු ඉන් අදහස් වේ;

"අලෙවිකාර සෘජු සහභාගිකරු" යන්නෙන්, සෘජු සහභාගිකරුවකු ලෙස 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් පත් කරන යම් සෘජු සහභාගිකරුවකු අදහස් වේ;

"නාමොද්දිෂ්ට අලෙවිකරුවකු නොවන ලන්සු තබන්නා" යන්නෙන්,ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වල දී කෙළින්ම ලන්සු තැබීමට සුදුස්සන් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් නිශ්චිතව පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවකු නොවන යම් ආයෝජන ආයතනයක් අදහස් වේ;

"සෘජු සහභාගිකරු" යන්නෙන්, සෘජු සහභාගිකරුවකු ලෙස, 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද යම් ප්‍රාථමික අලෙවි කරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"අන්තර් අලෙවිකාර තැරැව්කරු" යන්නෙන්, 8 වන වගන්තියේ (1) (ඉ) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර් අලෙවිකාර තැරැව්කරුවකු ලෙස පත් කරන ලද යම් තැනැත්තකු හෝ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ;

"ස්වකීය සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ගිණුම" යන්නෙන්, සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, තමන් වෙනුවෙන් සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් දැරීම සඳහා, 9 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සෘජු සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යන නිති ගිණුම ඉන් අදහස් වේ;

"ඔඩපනය" යන්නට, ණය හෝ අත්තිකාරම සඳහා සමපාර්ශ්වික වශයෙන් හෝ මහජන මුදල් තැන්පතු සඳහා ඇප වශයෙන් හෝ බැඳීමක් ඉටු කිරීම සඳහා ඇප වශයෙන්, හෝ සහතික රහිත භාණ්ඩාගාර බිල්පත් ඔඩපනය කිරීම හෝ ඒ බිල්පත් විෂයයෙහි ඇප සම්බන්ධතාවන් ඇතුළත් වේ;

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන්, භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොල සඳහා ප්‍රතිපාර්ශ්විකයකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සමග ගණුදෙනු කිරීමේ කාර්යය සඳහා, ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස, මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් යම් තැනැත්තකු ඉන් අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා" යන්නට, වාර්තා තබා ගැනීමේ කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් තබා ගන්නා වාර්තා ඇතුළත්වන අතර, පරිගණක ඩිස්ක්, ටේප් හෝ වෙනත් චුම්බක, ඉලෙක්ට්‍රොනික හෝ දෘශ්‍ය මාධ්‍ය ස්වරූපයෙන් තබා ගන්නා, ගබඩා කරන, හෝ සම්ප්‍රේෂණය කරන වාර්තා ද ඊට ඇතුළත් වේ;

"සහතික රහිත භාණ්ඩාගාර බිල්පත්" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවල සටහන් ස්වරූපයෙන් නිකුත් කරන්නා වූ ද සහතිකයක හෝ වෙනත් භෞතික සාධන පත්‍රයක අන්තර්ගත හෝ ඒ යමකින් මූර්තිමත් නොවන්නා වූ ද භාණ්ඩාගාර බිල්පත්‍රයක් අදහස් වේ;

"භාණ්ඩාගාර බිල්පත්‍රය" යන්නෙන්, මේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්‍රයක් අදහස් වන අතර, සහතික රහිත බිල්පත්‍රයක් ද ඊට ඇතුළත් වේ

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 32 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් (සංශෝධන) පනත.**
**[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 14 වන දින]**

**ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 32 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ දීර්ඝ නාමය, එහි "ආණ්ඩුවේ පොරොන්දු නෝට්ටු සහ භාරක බැඳුම්කර" යන වචන වෙනුවට "ආණ්ඩුවේ පොරොන්දු නෝට්ටු, භාරක බැඳුම් කර සහ භාණ්ඩාගාර බැඳුම් කර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-

"(ඇ) භාරක බැඳුම්කර ස්වරූපයේ සුරැකුම්පත් නිකුත් කිරීමෙන්;

(ඈ) භාණ්ඩාගාර බැඳුම්කර ස්වරූපයේ සුරැකුම්පත් නිකුත් කිරීමෙන්" ;

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "පොරොන්දු නෝට්ටු සහ භාරක බැඳුම්කර" යන වචන වෙනුවට "පොරොන්දු නෝට්ටු, භාරක බැඳුම්කර සහ භාණ්ඩාගාර බැඳුම්කර" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ආ) ණය මුදල ලබා ගන්නා විධි සහ ඒ ණය මුදල ලබා ගන්නා ආකාරය;

(ඇ) ණය මුදල සඳහා ගෙවිය යුතු පොලී අනුපාතිකය හෝ ගෙවිය යුතු පොලී අනුපාතිකය නිශ්චය කරන ක්‍රමය;

(ඈ) ණය මුදල සඳහා පොලී ගෙවිය යුතු දිනයන්;

(ඉ) ඒ ණය මුදල බේරුම් කිරීමේ කාර්යය සඳහා පිහිටුවා තිබෙන නිදන් අරමුදලට දායක මුදලක් වශයෙන් ඒකාබද්ධ අරමුදලින් සහ ශ්‍රී ලංකාවේ වත්කම්වලින් විසර්ජනය කළ යුත්තේ කවර අනුපාතියකින් ද සහ කවර කාලසීමාවක් අවසානයේද යන වග සහ ඒ දායක මුදල් ගෙවීම් ආරම්භ විය යුතතේ කවර දිනයක සිටද යන වග."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"ස්කන්ධ සහ සුරැකුම්පත් මිල දී ගැනීම පිළිබඳ සීමා කිරීම.

5අ. ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා වූ යම් ඉල්ලීමක්, හෝ ලන්සු හෝ ජාතික ආර්ථිකයේ යහපත සලකා, ප්‍රාථමික අලෙවිකරුවන්ට සහ නාමෝද්දිෂ්ට අලෙවිකරුවන් නොවන ලන්සු තබන්නන්ට සීමා කරනු ලැබිය හැකිය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන ශීර්ෂ පාඨය හා අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 21අ, 21ආ, 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය.

**"භාණ්ඩාගාර බැඳුම්කර"**

"භාණ්ඩාගාර බැඳුම්කර"

21අ (1) සෑම භාණ්ඩාගාර බැඳුම්කරයක්ම නිකුත් කරනු ලැබූ විට, ඒ බැඳුම්කරය නිකුත් කරනු ලබන්නේ යම් මුල් මුදලක් සඳහා ද ඒ මුදල සහ ඒ මත වූ පොලිය, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, 4 වන වගන්තිය යටතේ වූ නියමයෙහි සඳහන් කරන ලද අනුපාතිකය මත සහ එහි සඳහන් කරන ලද දිනයන්හිදී හෝ ඒ බැඳුම්කරය නිදහස් කර ගැනීම සඳහා එම නියමයෙන් තබාගෙන ඇති විකල්පයක් ප්‍රකාර, ගෙවීමට ඒ බැඳුම්කරය අනුව ආණ්ඩුව බැඳී සිටින්නේය.

(2) මේ ආඥාපනතේ වෙනත් කවර විධිවිධානයක් තිබුණද, භාණ්ඩාගාර බැඳුම්කර, ලිඛිත සහතික ස්වරූපයේ බැඳුම්කර ලෙස හෝ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හෝ නිකුත් කරනු ලැබිය හැකිය. ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වන විට, 21ආ වගන්තියේ විධිවිධාන ඒ ලිඛිත සහතිකවලට අදාළ විය යුතුය. සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වන විට, එම සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරවලට 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වගන්තිවල විධිවිධාන අදාළ විය යුතුය.

ලිඛිත සහතික ස්වරූපයේ භාණ්ඩාගාර බැඳුම්කර

21ආ. (1) ලිඛිත සහතිකයක ස්වරූපයෙන් නිකුත් කරනු ලබන සෑම භාණ්ඩාගාර බැඳුම්කරයක්ම, ආණ්ඩුව වෙනුවෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කළ යුතු අතර බැඳුම්කරය පිටසන් කොට භාර දීමෙන් එහි හිමිකම පවරා දෙනු ලැබිය හැකිය.

(2) යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද-

(අ) ලිඛිත සහතිකයක ස්වරූපයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරයක කිසිම පිටසනක්, එම බැඳුම්කරයේ පසු පිටෙහි එම බැඳුම්කරය දරන්නාගේ අත්සන තත්කාර්යය සඳහා ඉඩ තබා ඇති එක් ඉඩක හෝ නියෝග මගින් නියමිත වෙනත් යම් ආකෘතියක හෝ ලියා ඇත්නම් මිස, බලසහිත නොවන්නේය;

(ආ) ලිඛිත සහතිකයක ස්වරූපයෙන් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරයක් යම් තැනැත්තකු විසින් පිටසන් කර තිබීමේ හෝ පිටසන් කර භාරදී තිබීමේ හේතුව මත පමණක් , මුල් මුදල, හෝ ඒ මත පොලී වශයෙන් හෝ අයවිය යුතු කිසි මුදලක් ගෙවීමට ඒ තැනැත්තා යටත් නොවන්නේය.

සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වෙළෙඳ කටයුතු කිරීම සහ ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම.

21ඇ.(1) මේ ආඥාපනතේ වෙනත් කවර විධිවිධානයක් තිබුණද, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලෙස, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය. ඒ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර මේ වගන්තියේ සහ මේ ආඥාපනතේ 21ඈ, 21ඉ සහ 21ඊ වගන්තිවල විධිවිධානවලට අනුකූලව නිකුත් කර, පවත්වා ගෙන යා යුතුය.

(2) මේ අඥාපනතේ විධිවිධානවලට අනුකූලව, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත්කිරීම සහ ඒවා පිළිබඳ වෙළෙඳ කටයුතු කිරීම සඳහා අවශ්‍ය කවර හෝ ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේය. ඉහත කී විධි විධාන වල ව්‍යාප්තිය සීමා නොකොට, මෙහි පහත සඳහන් දෑ කිරීම භාර ගැනීමට හා ඉටු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත්තේය.-

(අ) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සහ ඒවා පිළිබඳ වෙළෙඳ කටයුතු වාර්තාගත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවල සටහන් තැබීම හා එම සටහන් පවත්වා ගෙන යාම;

(ආ) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හෝ ඒවායේ සම්බන්ධතා පිළිබඳ හිමිකම හෝ භාරකාරත්වය දැරීම්, සෘජු සහභාගිකරුවන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා හෝ වෙනුවෙන් වාර්තාගත කිරීම සඳහා ගිණුම් පවත්වා ගෙන යාම;

(ඇ) 21ඈ වගන්තියෙහි සඳහන් සෘජු සහබභාගිකරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ඔවුන්ගේ ගනුදෙනු සහ සෘජු සහභාගිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඈ) 21ඉ වගන්තියෙහි සඳහන් අලෙවිකාර සෘජු සහභාගිකරුවන් කලින් කල පත් කිරීම සහ ඔවුන්ගේ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ඔවුන්ගේ ගනුදෙනු හා ඒ අලෙවිකාර සෘජු සහභාගිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඉ) අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් කලින් කල පත් කිරීම සහ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ඔවුන්ගේ තැරැව්කාර කටයුතු සහ අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඊ) ප්‍රාථමික අලෙවිකරුවන් කලින් කල පත් කිරීම සහ ඒ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් සහ ප්‍රාථමික අලෙවිකරුවන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(උ) අලෙවිකරුවන් නොවන නාමෝද්දිෂ්ට ලන්සු තබන්නන් පත් කිරීම සහ ඒ අලෙවිකරුවන් නොවන නාමෝද්දිෂ්ට ලන්සු තබන්නන්ගේ සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් සහ අලෙවිකරුවන් නොවන ලන්සු තබන්නන් වශයෙන් ඔවුන්ගේ කාර්ය ඉටු කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඌ) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ක්‍රමවත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කර වැඩිදියුණු කිරීම සඳහා චර්යාධර්ම සංග්‍රහයක් සකස් කිරීම.

(3) 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වගන්තිවල අන්‍යාකාර විධිවිධාන සලසා නොමැතිනාක් දුරට, මෙහි පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස, සෘජු සහභාගිකරුවන්ට හෝ ඔවුන්ගේ යම් ගණයකට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධාන නිකුත් කළ හැකිය :-

(අ) අලෙවිකාර සෘජු සහභාගිකරුවන්ගේ ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පවත්වා ගෙන යායුතු හා පරිපාලනය කළ යුතු ආකාරය;

(ආ) මුල් මුදල් ගෙවීම් හා පොලී ගෙවීම් සහ යම් නිදහස් කිරීම්වලින් ලැබෙන මුදල් ඒ ගිණුම්වලට බැර කළ යුතු කාලවේලා;

(ඇ) ඒ ගිණුම් පවත්වා ගෙන යාම හා පරිපාලනය කිරීම සඳහා අය කළ හැකි ගාස්තු;

(ඈ) සෘජු සහභාගිකරුවන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවන් හෝ අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඉ) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හෝ ඒවායේ යම් සම්බන්ධතා මිලදී ගැනීම, විකිණීම, පැවරීම, ඔඩපනය කිරීම හෝ බැඳීම්වලට යටත් කිරීම කළ හැකි ආකාරය හා ක්‍රමය.

සෘජු සහභාගි කරුවෝ

21ඇ (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, යම් ප්‍රාථමික අලෙවිකරුවකු හෝ වෙනත් තැනැත්තකු සෘජු සහභාගිකරුවකු ලෙස ලියවිල්ලක් මගින් පත් කළ හැකි ය. එක් එක් සෘජු සහභාගිකරුවකුට සිය සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම, මේ

වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි

පවත්වා ගෙන යාමේ හිමිකම් ලැබෙන්නේ ය.

(2) සෘජු සහභාගිකරුවකු විසින් තමන් සඳහාම සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර දැරීම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තනි ගිණුමක් පවත්වා ගෙන යායුතු ය. එම ගිණුම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල ලියවිල්ලක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියට අනුව සහ ආකාරයට සෘජු සහභාගිකරු විසින් පවත්වාගෙන යායුතු ය.

(3) සෘජු සහභාගිකරුවකුගේ ගිණුම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා පවත්වා ගෙන යායුතු අතර, ඒ වාර්තා ඒ ගිණුමේ තත්ත්වය පිළිබඳව අවසානාත්මක සාක්ෂිය විය යුතු ය; තව ද එය ශ්‍රී ලංකා මහ බැංකුව ද සෘජු සහභාගිකරු ද කෙරෙහි අනුගම්‍ය විය යුතු ය.

(4) සෘජු සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ගිණුම්වලට අනුව, මුල් මුදල වශයෙන්, පොලී වශයෙන් හෝ නිදහස් කිරීමේ මුදල වශයෙන් හෝ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර මත සෘජු සහභාගිකරුවන්ට අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන්. එම ගිණුම් අදාළවනුයේ ඔවුන් සඳහාම දරන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරවලට හෝ අලෙවිකාර සෘජු සහභාගිකරුවන් සම්බන්ධයෙන් වන විට, ඔවුන් සඳහා ම දරන එවැනි යම් භාණ්ඩාගාර බැඳුම්කර වලට සහ සමූහ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වල ඇති එවැනි භාණ්ඩාගාර බැඳුම්කරවලට වුව ද, ඒවා ගෙවිය යුතු වන දිනයන් හි දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජු පාර්ශ්වකරුවන්ට ගෙවිය යුතු ය. එම ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්‍රමයකින් සහ ආකාරයකින් කළ යුතු ය.

(5) සෑජු සහභාගිකරුවකු විසින්, තමන්ගේ ම සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම සම්බන්ධයෙන් සහ අලෙවිකාර සෑජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් වන විට, ඒ අලෙවිකාර සෑජු සහභාගිකරුගේම සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම සහ එහි සමූහ ගනුදෙනුකරුවන්ගේ ගිණුම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහබැංකුව විසින් කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වාර වාර්තා, විස්තර, කරුණු හෝ තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(6) සෑජු සහභාගිකරුවකු ස්වකීය ගිණුමෙහි දරනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ද අලෙවිකාර සෑජු සහභාගිකරුවකු සම්බන්යෙන් වන විට, ඔවුන්ගේම ගිණුමෙහි දරනු ලබන සහතික රහිත බැඳුම්කර සම්බන්ධයෙන් මෙන්ම එහි සමූහ ගණුදෙනුකරුවන්ගේ ගිණුමෙහි දරනු ලබන සහතික රහිත බැඳුම්කර සම්බන්ධයෙන් ද පවත්වා ගෙන යන යම් පොත්පත් වාර්තා හෝ ගිණුම් ද ඇතුළුව, යම් සහතික රහිත බැඳුම්කරවලට අදාළව හෝ ඒවා කෙරෙහි බලපෑමක් ඇතිව පවත්වාගෙන යන්නා වූ යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම් පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම මුදල් මණ්ඩලය විසින් ලියවිල්ලක් මගින් බලය දී ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ කවරහෝ නිලධරියකු මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළ හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය විය හැකි සියලු පොත්පත්, වාර්තා, හුවමාරු වූ ලිපි හෝ වෙනත් යම් ලේඛන, සෑජු සහභාගිකරු විසින් සහ එහි නිලධරයන්, අධ්‍යක්ෂවරුන්, සේවා නියුක්තයන්, සේවකයන් සහ අනුයෝජිතයන් විසින් සපයනු ලැබිය යුතු අතර, මේ ආඥපනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරසම්බන්ධයෙන් නියම වී ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සහාය, ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දිය යුතු ය.

(7) ආණ්ඩුව සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් සම්බන්ධව යම් වගකීමකට යටත් වන්නා වූ හෝ පොලී ගෙවීමක්, මූල් මුදල ගෙවීමක් හෝ නිදහස් කිරීමේ ගෙවීමක් කරනු ලබන්නා වූ ද සෑජු සහභාගිකරුවකුගේ පැහැර හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකුගේ පැහැරීමක ප්‍රතිඵලයක් වශයෙන් හෝ එය හේතු කොට ගෙන එම වගකීම උද්ගතවන්නා වූ හෝ ඒ ගෙවීම කරනු ලබන්නාවූ ද අවස්ථාවක, ආණ්ඩුව විසින් ඉල්ලා සිටි විට ඒ වගකීම හෝ ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට හානිපූරණය කිරීමට ඒ සහභාගිකරු බැඳී සිටිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, "පැහැර හැරීම" යන්නට -

(අ) මේ ආඥපනතින් යම් සෑජු සහභාගිකරුවකු වෙත හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකු වෙත පැවරී ඇති හෝ නියම වී ඇති යම් කර්තව්‍යයක් කිරීමෙහිලා හෝ යම් කාර්යයක් ඉටුකිරීමෙහිලා ඒ සහභාගිකරුගේ යම් නොසැලකිල්ලක් හෝ අසමත්වීමක් ; සහ

(ආ) මේ ආඥපනත යටතේ වරදක් සංයුක්තවන හෝ මේ ආඥපනත අදාළ වන යම් කාරණයක් සම්බන්ධව වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වරදක් සංයුක්ත වන සෑජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් -

(i) ඒ වරද සම්බන්ධව යම් නඩු පැවරීමක් සිදුවී තිබුණ ද නොතිබුණ ද ;

(ii) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සෑජු සහභාගිකරු විසින් හෝ, අලෙවිකාර සෑජු සහභාගිකරු විසින් හෝ, ඒ සෑජු සහභාගිකරුගේ හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුගේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකුහෝ අනුයෝජිතයකු විසින් හෝ කරන ලද්දක් වුවද

ඇතුළත් වේ.

අලෙවිකර සෑජු සහභාගිකරු

21ඉ. (1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, යම් සෑජු සහභාගිකරුවකු, අලෙවිකාර සෑජු සහභගිකරුවකු ලෙස, ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය හැකිය.

(2) අලෙවිකාර සෑජු සහභාගිකරුවකු විසින් ස්වකීය සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගිණුමට අමතරව සහ එම ගිණුමෙන් වෙන්ව, සමූහ ගනුදෙනුකාර ගිණුමක් ශ්‍රී ලංකා මහ බැංකු වෙහි පවත්වාගෙන යායුතු අතර, එය එම අලෙවිකාර සෑජු සහභාගිකරු මගින් මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද සියලු පැවරීම් සම්බන්ධයෙන් වූ තනි සාමූහික ගිණුමක් විය යුතු ය. සමූහ ගනුදෙනුකාර ගිණුම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල ලියවිල්ලක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියකින් සහ ආකාරයකට පවත්වා ගෙනයා යුතුය.

"(1) යම් ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත් මත අයවිය යුතු පොලිය, 4 වන වගන්තිය යටතේ කරන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනවල දී ගෙවිය යුතුය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"ආදායම නිදන් අරමුදල සඳහා විසර්ජනය කිරීම.

27. යම් ණයක් සඳහා නිදන් අරමුදලට දායක මුදල් ගෙවීම ආරම්භ විය යුතු දිනය ලෙස 4 වන වගන්තිය යටතේ වූ නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයෙන් පසුව, ඒ ණය මුදල වෙනුවෙන් නිකුත් කරන ලද යම් ස්කන්ධ හෝ සුරැකුම්පත් මත, පොලී ගෙවීම පිණිස ඒ නියමයේ නිශ්චිතව සඳහන් දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන්, ඒ ණය නිදහස් කිරීමේ කාර්යය සඳහා පිහිටුවන ලද නිදන් අරමුදලට දායක මුදල වශයෙන්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් අනුපාතිකයට අනුකූලව තීරණය කරන ලද මුදල් ප්‍රමාණයක්, ඒකාබද්ධ අරමුදලින් සහ ශ්‍රී ලංකාවේ වත්කම්වලින් විසර්ජනය කළ යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය, එහි "අර්ධ වාර්ෂික දායක මුදල් ගෙවීම" යන වචන වෙනුවට "දායක මුදල් ගෙවීම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"ස්කන්ධ සහතික හා සුරැකුම්පත් අලුත් කිරීම

38. විරූප වූ හෝ හානි වූ ස්කන්ධ සහතිකයක්, පොරොන්දු නෝට්ටුවක්, භාරක බැඳුම්කරයක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් නැතහොත් පිටසන් සඳහා වෙන් කළ ඉඩ සම්පූර්ණයෙන්ම ඒ කාර්යය සඳහා පාවිච්චි කර ඇති පොරොන්දු නෝට්ටුවක් නැතහොත් මුල දී යාකළ පොලී කුපනවලින් ආවරණය කිරීමට අරමුණු කළ කාලසීමාව අවසානයේ දී භාරක බැඳුම්කරයක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ආපසු භාරදුන් විට, ඒ සහතිකය, නෝට්ටුව හෝ බැඳුම්කරය ආපසු භාරදුන් තැනැත්තන්ගේ හිමිකම් පෑම යුක්තිසහගත හා නිත්‍යානුකූල බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වුවහොත්, නියමිත ගාස්තුවක් ඇත්නම් ඒ ගාස්තුව ගෙවූ විට, ඒ තැනැත්තාට එම පන්තියේ ම හෝ ශ්‍රේණියේම සහ එම වටිනාකමින්ම වූ අලුත් සහතිකයක්, නෝට්ටුවක් හෝ බැඳුම්කරයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ හැකි අතර, එසේ නිකුත් කළ පසු, අලුත් කිරීම සඳහා ඔහු වෙත භාරදුන් සහතිකය, නෝට්ටුව හෝ බැඳුම්කරය අවලංගු කළ හැකි ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය එහි "පොරොන්දු නෝට්ටුවක් හෝ භාරක බැඳුම්කරයක්" යන වචන වෙනුවට "පොරොන්දු නෝට්ටුවක්, භාරක බැඳුම්කරයක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ සහ 53ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :-

"ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල නිලධරයන් විසින් ක්‍රියාත්මක කිරීම යනාදිය

53.අ. යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට මේ ආඥාපනතේ යම් විධිවිධානයකින් බලය දෙනු ලැබ හෝ නියමිතව ඇති අවස්ථාවක, ඒ බලය, කාර්යය හෝ කර්තව්‍ය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය; නැතහොත් ඉටු කරනු ලැබිය හැකිය.

නඩුවලින් ආරක්ෂාව

53ආ. මේ ආඥාපනත යටතේ ආණ්ඩුව, මුදල් මණ්ඩලය, රෙජිස්ට්‍රාර්වරයා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු නැතහොත් සේවකයකු විසින් කරන ලද යම් ගෙවීමක් හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ආණ්ඩුව, මුදල් මණ්ඩලය, රෙජිස්ට්‍රාර්වරයාට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුත්තේය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (උ) ඡේදය (ක) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන් සහ එම වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, මින් සංශෝධනය කරනු ලැබේ :-

"(උ) ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම සහ ඔවුන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි, ඔවුන්ගේ වරප්‍රසාද සහ ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්ය;

(ඌ) සෘජු සහභාගිකරුවන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවන් සහ අන්තර් අලෙවිකාර තැරැව්කරුවන් පත් කිරීම, ඔවුන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ සමීක්ෂණය කිරීම;

(ඒ) මේ ආඥාපනත යටතේ, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත්කිරීම, දැරීම සහ ඒවා පිළිබඳ පරිපාලනය;

(ඔ) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හෝ ඒවා පිළිබඳ සම්බන්ධකම් ඇතුළුව ස්කන්ධ හා සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම, පැවරීම, ඔඩපනය කිරීම හෝ ප්‍රතිබන්ධනය කළ හැකි ආකාරය;

(ඕ) ස්කන්ධ හා සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික නිකුත් කිරීම සහ ඉන් පසුව පැවරීම් සහ වෙනත් ගණුදෙනු සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ කොන්දේසි; සහ."

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 56 අ සහ 56 ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය.-

"වැරදි

56අ.(1) (අ) මේ ආඥාපනතේ යම් විධිවිධානයක් හෝ මේ ආඥාපනත යටතේ වූ යම් නියෝගයක් හෝ නියමයක් හෝ විධිවිධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින;

(ආ) මේ ආඥාපනතේ කාර්ය සඳහා, තමාගේ දැනුම අනුව අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සපයන හෝ අසත්‍ය හෝ සාවද්‍ය කරුණු අන්තර්ගත යම් වාර්තාවක් සපයන;

(ඇ) රැවටීමේ චේතනාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කවර හෝ වාර්තාවක් හෝ යම් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු හෝ යම් ප්‍රාථමික අලෙවිකර ුවකු ඇතුළුව යම් සෘජු සහභාගිකරුවකුගේ යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම්වල-

(i) අසත්‍ය සටහනක් කරන හෝ කිරීමට සලස්වන;

(ii) යම් සටහනක් නොකර හරින හෝ නොකර හැරීමට සලස්වන; හෝ

(iii) යම් සටහනක් වෙනස් කරන, වසන් කරන හෝ විනාශ කරන හෝ වෙනස් කිරීමට, වසන් කිරීමට හෝ විනාශ කිරීමට සලස්වන

යම් තැනැත්තකු, මේ ආඥාපනත යටතේ වරදක් කරන්නේය.

(2) මේ ආඥාපනත යටතේ වරදක් කරන යම් තැනැත්තෙක්, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයක්ට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

අධ්‍යක්ෂවරයන් සහ නිලධරයන් විසින් සිදුකරනු ලබන වැරදි

56ආ. මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබුවේ සංස්ථාවක් වන අවස්ථාවක, ඒ වරදකරන අවස්ථාවේදී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව හෝ නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක්ම, ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද වැළැක්වීමට තමා තිබී සියලු උද්යෝගයෙන් ක්‍රියාකළ බව ඔප්පු කළහොත් මිස ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වන්නේය".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) "හාරක බැඳුම්කරය" යන්නෙහි අර්ථකථනයට පෙරාතුවම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :-

" සමූහ ගණුදෙනුකාර ගිණුම" යන්නෙන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින්, 21ඉ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යන තනි ගිණුමක් අදහස් වේ."

(ආ) "හාරක බැඳුම්කරය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"ගනුදෙනුකරු" යන්න, අලෙවිකාර සෘජු පාර්ශ්වකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, එම යෙදුමෙන්, ඒ අලෙවිකාර සෘජු පාර්ශ්වකරු මගින්, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හෝ ඒවායේ යම් සම්බන්ධකමක් මිලදී ගන්නා හෝ විකුණන හෝ අන්‍යාකාරයෙන් අත්කර ගන්නා හෝ බැහැර කරන යම් තැනැත්තෙක් හෝ, ඒ බැඳුම්කර හෝ සම්බන්ධකම් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ ඉඩකඩ ගැන ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු සමඟ සාකච්ඡා පවත්වන යම් තැනැත්තකු ඉන් අදහස් වේ;

"අලෙවිකාර සෘජු සහභාගිකරු" යන්නෙන්, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු ලෙස 21ඉ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් පත් කරනු ලබන යම් සෘජු සහභාගිකරුවකු අදහස් වේ;

"නාමොද්දිෂ්ට අලෙවිකරුවකු නොවන ලන්සු තබන්නා" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් වෙන්දේසිවල දී කෙලින්ම ලන්සු තැබීමට සුදුස්සන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් පත් කරන ලද සහ ප්‍රාථමික අලෙවිකරුවකු නොවන, යම් ආයතනයක් අදහස් වේ;

"සෘජු සහභාගිකරු" යන්නෙන්, සෘජු සහභාගිකරුවකු ලෙස 21 ඈ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියවිල්ලක් මගින් පත් කරනු ලබන යම් ප්‍රාථමික අලෙවිකරුවෙක් හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

"අන්තර් අලෙවිකාර තැරැව්කරු" යන්නෙන්, 21 ඈ වගන්තියේ (2) (ඉ) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර් අලෙවිකාර තැරැව්කරුවකු ලෙස පත් කරන ලද තැනැත්තෙක් හෝ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ;

"අලෙවිකරු නොවන සෘජු සහභාගිකරු" යන්නෙන් අලෙවිකාර සෘජු සහභාගිකරුවකු නොවන සෘජු සහභාගිකරුවකු අදහස් වේ;

"ඔඩපනය" යන්නට ණය හෝ අත්තිකාරම් සඳහා සමපාර්ශ්වික වශයෙන් හෝ, මහජන මුදල් තැන්පතු සඳහා ඇප වශයෙන් හෝ බැඳීමක් ඉටු කිරීම සඳහා ඇප වශයෙන් හෝ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ඔඩපනය කිරීම හෝ එම බැඳුම්කර විෂයෙහි ඇප සම්බන්ධතාවක් ඇතුළත් වේ";

(ඇ) "නියමිත; යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම, පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන් ස්කන්ධ හා සුරැකුම් පත් පිළිබඳ ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපළෙහි ප්‍රතිපාර්ශ්විකයකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ කටයුතු කිරීමේ කාර්යය සඳහා ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස, මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ";

(ඈ) "පොරොන්දු නෝට්ටුව" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"පොළී අනුපාතිකය" යන්නට 4 වන වගන්තියේ (1) (ඇ) උපවගන්තිය යටතේ වූ නියමයකට අනුකූලව නිශ්චිතව සඳහන් කරනු ලබන ක්‍රමයක් වේ නම්, ඒ ක්‍රමයට අනුකූලව තීරණය කරන ලද පොළී අනුපාතිකයක් ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තා" යන්නට, වාර්තා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන වාර්තා ඇතුළත් වන අතර, පරිගණක ගොණු, ඩිස්ක්, ටේප් හෝ වෙනත් චුම්බක, ඉලෙක්ට්‍රොනික හෝ දෘශ්‍ය මාධ්‍ය ස්වරූපයෙන් තබා ගැනෙන, ගබඩා කැරෙන හෝ සම්ප්‍රේෂණය කැරෙන වාර්තා ද ඊට ඇතුළත් වේ;

(ඉ) "ලියාපදිංචි ස්කන්ධ" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්-

"සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගිණුම" යන්නෙන්, 21ඇ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සෘජු සහභාගිකරුවකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවත්වාගෙන යන තනි ගිණුම අදහස් වේ;

"සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරය" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවල සටහන් ස්වරූපයෙන් නිකුත් කරන ලද්දා වූ සහ සහතිකයකින් හෝ වෙනත් සාධන පත්‍රයකින් මූර්තිමත් නොවන්නා වූ හෝ නොදැක්වෙන්නාවූ භාණ්ඩාගාර බැඳුම්කරයක් අදහස් වේ;

(ඊ) "ඇපය" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

"ඇපය" යන්නෙන් භාරක බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් අදහස් වේ;

(උ) "ඇපය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"භාණ්ඩාගාර බැඳුම්කරය" යන්නෙන්, මේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරයක් අදහස් වන අතර. 37, 38, 39, 42, 44, 46 (ආ) සහ (ඇ) 49, 52, සහ 55 (2) (ඇ) සහ (ඈ) වගන්තිවල හැර ඊට සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් ඇතුළත් වේ.;

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවූවහොත්, එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

**1995 අංක 33 දරන බැංකු (සංශෝධන) පනත**

**[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 19 වන දින]**

**1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 33 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1988 අංක 30 දරන (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බැංකු පනතේ දීර්ඝ නාමය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:-

"බැංකු ව්‍යාපාර කරගෙන යන සහ තැන්පතු භාරගැනීමේ සහ ඒ මුදල් ආයෝජනය කිරීමේ ව්‍යාපාර කරගෙන යන තැනැත්තන්ට බලපත්‍ර දීම සඳහා කාර්ය පටිපාටියක් ඉදිරිපත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද ඒ ව්‍යාපාරවලට අදාළ වූ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.;"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ අවසන් ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

"(6) මේ වගන්තියේ කාර්ය සඳහා "සමාගම" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 449 වන වගන්තියේ ඇති අර්ථය ම ඇති අතර, ඊට ශ්‍රී ලංකාවෙන් බැහැර යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් හෝ යම් විදේශ රටක යම් ප්‍රඥප්තියක්, රාජකීය අධිකාර පත්‍රයක් හෝ රාජ්‍ය සන්නසක් ප්‍රකාර පිහිටුවන ලද සංස්ථාවක් සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ පිහිටුවන ලද සංස්ථාවක් ඇතුළත් වේ; තවද ඊට මහ බැංකුව හෝ මේ පනතේ 1 වන උප ලේඛනයේ නිශ්චය කොට දැක්වෙන බැංකු හැර, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කළ පෞද්ගලික සමාගමක් හෝ ඇතුළත් නොවිය යුතුය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ඈ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සමාගමක් හෝ සංස්ථාවක් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකාවේ ස්වකීය බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී දරන්නට සිදුවන සියලු වගකීම් සහ බැරකම් පියවීම සඳහා අවශ්‍ය විය හැකි අරමුදල්, මහ බැංකුව විසින් ඉල්ලා සිටි විට අවස්ථාවෝචිත පරිදි ඒ සමාගම හෝ සංස්ථාව විසින් ලබා දෙන බව ප්‍රකාශ කරන ඒ සමාගමේ හෝ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකින් සනාථ කරනු ලැබූ ලිඛිත පොරොන්දුවක් සහ අවස්ථාවෝචිත පරිදි, එම සමාගම සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද රටෙහි මුදල් අධිකාරියෙන්, මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන තොරතුරු ඇතුළත් වාර්තාවක්;".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද යම් සමාගමකට" "ඒ සමාගම" සහ "ඒ සමාගමේ" යන වචන වෙනුවට පිළිවෙළින් "ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද යම් සමාගමකට හෝ සංස්ථාවකට", "ඒ සමාගම හෝ සංස්ථාව" සහ "ඒ සමාගමේ හෝ සංස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ, "ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද සියලුම සමාගම්වලට" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සියලුම සමාගම්වලට සහ සංස්ථාවලට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද සමාගම්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද සමාගම් සහ සංස්ථා" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියෙහි ඇති "බලපත්‍රයේ නියම සහ කොන්දේසි ඉල්ලුම්කරු විසින් ඉටුකරනු ලබන බවට සෑහීමට පත්වීමෙන් පසු" යන වචන වෙනුවට "බලපත්‍රයේ නියම සහ කොන්දේසි ඉල්ලුම්කරු විසින් ඉටු කරනු ලබන බවට සෑහීමට පත්වීමෙන් පසු සහ ජාතික ආර්ථිකයේ යහපත පිළිබඳව සැලකිලිමත්ව" යන වචන ආදේශ කිරීමෙන් සහ " බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය." යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඉ) ඒ බැංකුව, ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන අවස්ථාවක, ඒ බැංකුවේ බලපත්‍රය හෝ එහි කටයුතු කරගෙන යාමේ අධිකාරය ඒ බැංකුව සංස්ථාගත කරනු ලැබූ රටෙහි තිසි බලධරයා හෝ විධිමත්කරණ මණ්ඩලය විසින් අවලංගු කරනු ලැබූ බව හෝ ඉවත් කරගනු ලැබූ බව.".

8. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 11 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11ළ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"මුදල් නීති පනතේ 30 වන වගන්තිය අදාළ විය යුතු බව.

11ළ. මුදල් නීති පනතේ 30 වන වගන්තියෙන් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල කෙරෙහි මේ පනතේ 9,10 සහ 11 වන වගන්තිවල අන්තර්ගත කිසිවක් නිසා කවර හෝ ආකාරයක බලපෑමක් නොවිය යුතුය."

9. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 13 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 13ළ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"ජංගම බැංකු ඒකක

13ළ. (1) 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද ජංගම බැංකු ඒකක පිහිටුවීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද මගපෙන්වීම මත, ජංගම බැංකු ඒකක පිහිටුවීමට නියෝජ්‍ය අධිපතිවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි මත, ඔහු විසින් අනුමතය දෙනු ලැබිය හැකිය.

(2) නියෝජ්‍ය අධිපතිවරයා විසින්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක් මත, ලියවිල්ලකින් වූ නියමයක් මගින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතය ඉවත්කර ගැනීම හෝ ඒ අනුමතයේ නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකිය. එම තීරණය පිළිබඳ දැන්වීම් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත යවනු ලැබිය යුතුය.".

10. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, 14 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 14ළ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය අනුමතය මත වෙනස් කල හැකි බව

14ළ. 1982 අංක 17 දරන සමාගම් පනතේ 449 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි වූ සමාගමක් වන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, එහි සාංගමික සංස්ථා පත්‍රය හා සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් නොකළ යුතුය."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "එහි නමේ කොටසක් හෝ එහි විස්තර කිරීමක් වශයෙන්" යන වචන වෙනුවට "මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර එහි නමේ කොටසක් හෝ එහි විස්තර කිරීමක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ කාර්ය සඳහා එහි හෝ ඔහුගේ නමේ කොටසක් වශයෙන් හෝ" යන වචන වෙනුවට "මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර, යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ කාර්ය සඳහා එහි හෝ ඔහුගේ නමේ කොටසක් වශයෙන් හෝ " යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය, ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුවද එවැනි බැංකුවක් විසින්, මුදල් මණ්ඩලයේ ලිඛිත අවසරය ඇතිව, මෙහි පහත සඳහන් ව්‍යාපාර එකක් හෝ වැඩි ගණනක් කරගෙන යන පාලිත සමාගමක් තබාගත හැකිය :

(අ) බැංකු ව්‍යාපාරය, ගණකාධිකරණය, තක්සේරු කිරීම, ව්‍යාපෘති ඇගයීම හා ණය ඇගයීම යන කරුණුවලට සම්බන්ධ යම් එක් විෂයයක් ගැන පුහුණුවීම් සැලසීමේ ව්‍යාපාරය;

(ආ) කුලී සින්නක්කර ගණුදෙනුවල නියැලීමේ ව්‍යාපාරය;

(ඇ) සංවර්ධනය සඳහා මධ්‍යම කාලීන සහ දීර්ඝ කාලීන ණය ලබාදීමේ ව්‍යාපාරය;

(ඈ) කර්මාන්තශාලා බදුදීමේ සහ ගුදම් පහසුකම් සැපයීමේ සහ ගුදම් කිරීමේ ව්‍යාපාරය;

(ඉ) කළමනාකරණ උපදේශක සේවා සැපයීමේ ව්‍යාපාරය;

(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කරන ලද ණය මත, සමාගමක් විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවට නොගෙවන ලද ප්‍රාග්ධනය සහ ඒ මත උපචිත පොලිය, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ප්‍රාග්ධනගත කිරීමේ හේතුවෙන් ඒ සමාගමේ කොටස් බලපත්‍රලාභී වාණිජ බැංකුවට අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් පමණක් ඇති වන පාලිත සමාගමක්;

(උ) මුදල් මණ්ඩලයේ මතය අනුව බැංකු ව්‍යාපාරයට සහ මුදල් සැපයීමේ ව්‍යාපාරයට අනනුකූල නොවන යම් ව්‍යාපාරයක්.".

13. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 17 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් සියයට ගණනක් හෝ මිල අඩුවෙන් කොටස් මිලදී ගැනීම.

17අ. (1) මෙහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ලැයිස්තුගත පොදු සමාගමක් නොවන යම් සමාගමක කොටස් අත්කර ගැනීම හෝ දැරීම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නොකළ යුතුය; තවද

(අ) එවැනි බැංකුවක් විසින් අත්කර ගනු ලබන යම් කොටස් ප්‍රමාණයක් එහි ප්‍රාග්ධන අරමුදල් සම්බන්ධයෙන් මුදල් මන්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශතය නොඉක්මවිය යුතුය; තවද

(ආ) (බැංකුවේ පාලිත සමාගම් වන සමාගම්වල හැර) ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස්වල ආයෝජිත මුළු මුදල් ප්‍රමාණය, එහි ප්‍රාග්ධන අරමුදල් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රතිශතය නොඉක්මවිය යුතුය;

එසේ වුව ද ලැයිස්තුගත පොදු සමාගමක් නොවන යම් පොදු සමාගමක් මූල්‍යමය වශයෙන් ජීව්‍යතාවට පත් කිරීම පිණිස පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා එහි කොටස් අත්කර ගැනීම් අවශ්‍ය වුවහොත් එවැනි සමාගමක කොටස් ඉහත නිශ්චිතව සඳහන් සීමා නොඉක්මවන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අත්කර ගත හැකිය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන මෙහි පහත සඳහන් ආයෝජනවලට අදාළ නොවිය යුතුය:-

(අ) ඒ බැංකුවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන පාලිත සමාගමක ආයෝජනය;

(ආ) මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව අත්කර ගන්නා ලද, බැංකුවේ වෙනත් යම් පාලිත සමාගමක ආයෝජන;

(ඇ) බැංකුවට අයවිය යුතු ණය මුදලක් පියවා ගැනීමේ ක්‍රියාවලියේ දී හෝ කොටස් නිකුතුවක් ප්‍රාරක්ෂණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ බැංකුව විසින් අත්කර ගනු ලැබිය හැකි යම් කොටස් ප්‍රමාණයක්:

එසේ වුවද මේ කොටසේ අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවේ ආයෝජනවල එකතුව මුදල් මණ්ඩලය විසින් (1) වන උප වගන්තිය යටතේ නිශ්චය කළ ප්‍රාග්ධන අරමුදල් ප්‍රතිශතය ඉක්මවෙතොත්, එම කොටස අත්කර ගත් දින සිට අවුරුදු දෙකක් හෝ මුදල් මණ්ඩලය නිශ්චය කරන ඊට වඩා දීර්ඝ කාලයක් ඇතුළත දී බැංකුව විසින් එම අතිරික්ත කොටස් බැහැර කළ යුතුය;

(ඇ) මුදල් මණ්ඩලයේ මතය අනුව බැංකු සහ මූල්‍ය අංශවල මානව සම්පත් සංවර්ධනය සහ තාක්ෂණික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවනු ලැබ ඇති යම් සමාගමක යම් කොටස් අත්කර ගැනීම හෝ දැරීම.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන් 1987 අංක 36 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාරවස්තු විනිමය ස්ථානයක ස්වකීය සුරැකුම්පත් ලැයිස්තුගත කර හෝ මිල ලැයිස්තුගත කර ඇති යම් පොදු සමාගමක් අදහස් වේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1), (2) සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව,

(අ) මේ උපවගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භවීමට පූර්වයෙන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම, සියලු කල්හිම රුපියල් මිලියන විසිපහකට නොඅඩු කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතුය;

(ආ) මේ උපවගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භ වීමෙන් පසුව බලපත්‍රයක් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම සියලු කල්හිම රුපියල් මිලියන සියයකට නොඅඩු හෝ මුදල් මණ්ඩලය විසින් බැංකු පද්ධතියේ ජීව ගුණය සහ ස්ථායිභාවය ද ජාතික ආර්ථිකයේ යහපත ද සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් මුදල් ප්‍රමාණයකට නොඅඩු කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යා යුතුය."

(2) "කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය" යන්නෙන්-

(අ) එය යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කළ හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් නම්, ගෙවා නිමි ප්‍රාග්ධනය අදහස් වේ;

(ආ) එය ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කර හෝ පිහිටුවා ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් නම්, ප්‍රධාන කාර්යාලය විසින් ඒ බැංකුවට වෙන් කර දී තිබෙන මුදල් ප්‍රමාණය අදහස් වේ.

(3) (අ) මුදල් මණ්ඩලය විසින් බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපතික වගකීම් ද ඇතුළු මුළු වගකීම් හෝ මුළු වත්කම් හෝ යම් නිශ්චිත වත්කම් වර්ගයක් සැලකිල්ලට ගෙන, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය ලෙස නියම කරනු ලැබ ඇති ප්‍රමාණය, කලින් කල වෙනස් කරනු ලැබිය හැකිය.

(ආ) අවම නියමිත කොටස් සහ ස්කන්ධ ප්‍රාග්ධනය වගකීම්වලට හෝ වත්කම්වලට අදාළ වන සේ නියම කරනු ලබන කල්හි, එය ගණන් බැලීමේ කාර්යය සඳහා, ප්‍රාග්ධනය සහ වගකීම් හෝ වත්කම් යන දෙකම ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්කට ගෙන මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරන වර්ගයකින් සහ ගණන් බැලීමේ ආකාරයකින් විය යුතුය.

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යා යුතු කොටස් සහ ස්කන්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් කරනු ලබන යම් වෙනස් කිරීමක්, මුදල් මණ්ඩලය විසින් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලියවිල්ලකින් දන්වා යවනු ලැබිය යුතුය.

(ඈ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එවැනි වෙනස් කිරීමක් අනුව සිය කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කිරීමට නියම කරන අවස්ථාවක, ඒ බැංකුව විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ නියමය ඉටු කිරීම පිණිස මාස දොළහක කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් අවසර දෙනු ලැබිය හැකි ඊට වඩා දීර්ඝ කාලයක් ඒ බැංකුවට දෙනු ලැබිය යුතුය."

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව අඩු කරනු නොලැබිය යුතුය;"

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

" (7) (අ) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක්, සෑම කල්හිම පවත්වා ගෙන යා යුතුය. එසේ පවත්වාගෙන යායුතු අනුපාතය නිශ්චය කිරීමේ දී මුදල් මණ්ඩලය විසින්, හැකිතාක් දුරට, බාස්ලේහි "බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්" බැංකුව විසින් ප්‍රමාණවත් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් නියම කර තිබෙන මාර්ගෝපදේශ උපයෝගී කර ගත යුතුය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයෙහි යම් වෙනස් කිරීමක් මුදල් මණ්ඩලය විසින් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙතම ලියවිල්ලකින් දන්වා යවනු ලැබිය යුතුය. එසේ වුව ද ඒ වෙනස් කිරීමෙන් සිය ප්‍රාග්ධන අරමුදල් වැඩි කිරීමට නියම කෙරෙන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකටම ඒ නියමය ඉටු කිරීම සඳහා මාස දොළහක කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් අවසර දෙනු ලැබිය හැකි ඊට වඩා දීර්ඝ කාලයක් හෝ දෙනු ලැබිය යුතුය";

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ;

(5) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන අරමුදල්" යන වචන වෙනුවට "කොටස් සහ ස්කන්ධ ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධන අරමුදල්" යන වචන ආදේශ කිරීමෙන්.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

" III වන V වන සහ VI වන කොටස් අක්වෙරළ බැංකු කටයුතු වලට ඇතැම් අවස්ථාගත කරුණු වලදී අදාළ නොවන බව

24. (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවක මේ කොටස යටතේ වූ සියලු අක්වෙරළ මෙහෙයුම එහි අක්වෙරළ ඒකකය මගින් කරගෙන යනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තියේ විධි විධානවලට යටත්ව මේ පනතේ III සහ V වන සහ VI වන කොටස්, ඒ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

(2) මේ පනතේ III වන, V වන සහ VI වන කොටස්වල ඇති විධිවිධාන සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ, බලපත්‍රලාභී වාණිජ බැංකුවක සියලු අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පොදුවේ හෝ නේවාසිකයන් සමඟ පැවැත්වෙන එහි අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පමණක් හෝ අදාළ විය යුතු බව, මුදල් මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් ප්‍රකාශ කළ හැකිය".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි "වාණිජ බැංකුවල බලපත්‍ර ලබා ඇති 25 වන වගන්තිය යටතේ නියමිත කටයුතු සියල්ලෙහිම හෝ ඉන් යම් ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් " යන වචන සහ ඉලක්කම් වෙනුවට "බලපත්‍රලාභී වාණිජ බැංකුවලට 25 වන වගන්තිය යටතේ නියමිත කටයුතු සියල්ලෙහිම හෝ ඉන් යම් ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් නේවාසිකයකු සමඟ යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

" මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ IIIන සහ VI කොටස් ඇතැම් අවස්ථාගතු කරුණු වලදී අදාල නොවිය යුතු බව

29. (1) මෙහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ III වන, VI වන, සහ VII වන, කොටස්වල විධිවිධාන බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කෙරෙහි අදාළ නොවිය යුතුය.

2. 422 වන අධිකාරය වූ මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ III වන VI සහ VII වන කොටස්වල විධිවිධාන සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක සියලු අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පොදුවේ හෝ නේවාසිකයන් සමග පැවැත්වෙන අක්වෙරළ බැංකු කටයුතු සම්බන්ධයෙන් පමණක් හෝ අදාළ විය යුතු බවට, මුදල් මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ ලබන දැන්වීමක් මගින් ප්‍රකාශ කළ කරන හැකිය."

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 34අ වගන්තිය හැර, IVළ කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 34අ වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "මේ කොටස යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ගණුදෙනුකරුවකු වෙනුවෙන් අංකිත ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවක" යන වචන වෙනුවට "බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්

අංකිත ගිණුමක් විවෘත කරනු ලබන අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තිය අවසානයට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් -

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා "අංකිත ගිණුම" යන්නෙන් ඉවත් කරන ලද 34අ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද සහ අංකයකින්, සංකේත වචනයකින්, හෝ මුදල් මණ්ඩලය විසින් අවසර දී ඇති වෙනත් ක්‍රමයකින් පමණක් හඳුනාගනු ලබන ගිණුමක් අදහස් වේ."

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ මුදල් වර්ෂය අවසානයට වූ ශේෂ පත්‍රය" යන වචන වෙනුවට "ඒ මුදල් වර්ෂය අවසානයට වූ විගණනය කළ ශේෂ පත්‍රය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "එහි මුදල් වර්ෂය අවසානයට වූ ශේෂ පත්‍රය" යන වචන වෙනුවට "එහි මුදල් වර්ෂය අවසානයට වූ විගණනය කළ ශේෂ පත්‍රය" යන වචන ආදේශ කිරීමෙන්.

21. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, 38 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් සුදුසුකම් ලත් විගණක වරුන්ගේ ලැයිස්තුවක් නිකුත් කළයුතු බව.

38අ. (1) බලපත්‍රලාභී වාණිජ බැංකුවල ගිණුම් විගණනය කිරීම සඳහා පළපුරුදු සහ ප්‍රවීණ, සුදුසුකම් ලත් විගණකවරුන් යොදවා ගන්නා බව සහතික කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය විසින්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත මාර්ගෝපදේශ නිකුත් කළ හැකි අතර ඔහු විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ගිණුම් විගණනය සඳහා, සුදුසුකම්ලත් විගණකවරුන් යම් සංඛ්‍යාවක්, එම මාර්ගෝපදේශ අනුව, කලින් කල තෝරා, එසේ තෝරාගත් සුදුසුකම්ලත් විගණකවරුන්ගේ ලැයිස්තුවක්, සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත යැවිය යුතුය.

(2) සිය ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකවරුන් (1) වන උපවගන්තිය යටතේ එසේ යවන ලද ලැයිස්තුවෙන් තෝරා ගැනීම ඒ සියලු බලපත්‍රලාභී වාණිජ බැංකුවල කාර්යය විය යුතුය."

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයකු අවුරුදු පතා පත් කර ගතයුතුය." යන වචන වෙනුවට "සුදුසුකම්ලත් විගණකවරයකු 38අ වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන ලැයිස්තුවෙන් අවුරුදු පතා පත්කර ගත යුතුය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) (3) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, ඒ උපවගන්තියේ සඳහන් වාර්තාව ඒ උපවගන්තිය යටතේ ලැබුණු විට, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්-

(අ) විගණනය හා සම්බන්ධව අවශ්‍ය යයි මුදල් මණ්ඩලය සලකන අතිරේක තොරතුරු ඉදිරිපත් කරන ලෙස;

(ආ) බැංකුවේ ව්‍යාපාරය සහ කටයුතු පිළිබඳ විගණනයේ විෂය පථය ව්‍යාප්ත කරන ලෙස හෝ දීර්ඝ කරන ලෙස;

(ඇ) ඔහු නියම කරන වෙනත් පරීක්ෂාවක් කරන ලෙස හෝ යම් විශේෂ කාරණයක් සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවට යම් ක්‍රියාපටිපාටියක් නිර්දේශ කරන ලෙස; සහ

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් කාරණයක් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස

විගණකවරුන්ගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එම අතිරේක විගණනයේ හෝ ඒ වෙනත් වැඩවල පිරිවැය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැරිය යුතුය."

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) යම් තැනැත්තකු-

(අ) සිහිවිකල් තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ බල පවත්වන යම් නීතියක් යටතේ තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ සිටී නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ බුන්වත් වූවකු හෝ බංකොලොත් වූවකු ලෙස ප්‍රකාශ කරනු ලැබූ නිදහස් නොවූ බුන්වත් වූවකු හෝ බංකොලොත් වූවකු වී සිටී නම් ; හෝ

(ඇ) චරිත දූෂණය ඇතුළත් වන සහ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ සිටී නම් ; හෝ

(ඈ) වෙනත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක සේවා නියුක්තයකු හෝ අධ්‍යක්ෂවරයකු වේ නම් හෝ බැංකුවේ (ප්‍රධාන විධායක නිලධරයා නොවන) සේවා නියුක්තයකු වේ නම්,

ඒ තැනැත්තා, බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම හෝ තෝරා පත්කර ගැනීම නොකළ යුතුය." ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක ලේකම්වරයා

43. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එහි ලේකම්වරයා ලෙස, 1982 අංක 17 දරන සමාගම් පනතේ 176 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සමාගමක ලේකම්වරයකු සඳහා නියම කරනු ලැබිය හැකි සුදුසුකම් දරන තැනැත්තකු පත් කළ යුතු අතර, එසේ ලේකම්වරයා ලෙස පත් කරනු ලැබූ විට, ඒ තැනැත්තා ඒ වන විටත් ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සේවා නියුක්තයකු වන්නේ නම් මිස, ඔහු ඒ බැංකුවේ සේවා නියුක්තයකු බවට පත් වන්නේය. තවද ඒ තැනැත්තා ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ලේකම්වරයා ලෙස සේවයේ නියුක්තව සිටිනතාක් කල්, වෙනත් යම් ආයතනයක සේවා නියුක්තයකු බවට පත් නොවිය යුතුය."

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කොටස් සහ ස්කන්ධ ප්‍රාග්ධනය, සංචිත සහ තැන්පතු ද වෙනත් අදාළ කරුණු ද සැලකිල්ලට ගන්නා විට, ඒ බැංකුව විසින්-

(i) යම් තනි සමාගමකට, රාජ්‍ය සංස්ථාවකට, ව්‍යාපාර ආයතනයකට, පුද්ගලයන්ගෙන් හෝ තැනැත්තන්ගෙන් යුතු සමිතියකට;

(ii) සමස්ත වශයෙන්-

(අ) තැනැත්තකුට, ඔහුගේ කිට්ටු ඥාතීන්ට හෝ ඔහු සැලකිය යුතු සම්බන්ධතාවක් දරන සමාගමකට හෝ ව්‍යාපාර ආයතනකට;

(ආ) සමාගමකට සහ මෙහි පහත සඳහන් යම් එකකට හෝ වැඩි සංඛ්‍යාවකට, එනම් :-

(අඅ) එහි පාලිත සමාගමට;

(ආආ) එහි පාලන සමාගමට;

(ඇඇ) එහි ආශ්‍රිත සමාගමට;

(ඈඈ) එහි පාලන සමාගමේ පාලිත සමාගමකට; හෝ

(ඉඉ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලන සමාගම හෝ එහි පාලන සමාගමේ පාලිත සමාගමක් සැලකිය යුතු සම්බන්ධතාවක් දරන සමාගමකට

සැපයිය හැකි අනුග්‍රහයක උපරිම ප්‍රමාණය සම්බන්ධයෙන්";

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

'සමාගමක කොටස් වලින් සියයට විස්සකට නොඅඩු හා සියයට පණහකට නොවැඩි ප්‍රමාණයක් වෙනත් සමාගමක් විසින් දරනු ලබයි නම් ඒ සමාගම, එම වෙනත් සමාගමේ "ආශ්‍රිත සමාගමක්" ලෙස මේ උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබේ;'

26. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 46 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

" බොල් ණය හා සැක සහිත ණය සඳහා පොදු හා නිශ්චිත විධි විධාන නියම කිරීම

46අ. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් බොල් ණය හා සැක සහිත ණය සම්බන්ධව පොදු සහ නිශ්චිත යන දෙආකාරයේ ම විධිවිධාන පැනවීම නියම කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇති අතර, එසේ කරනු ලබන නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සියලු බලපත්‍රලාභී වාණිජ බැංකුවල කාර්යය වන්නේය".

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "පියවර ගත ලැබිය යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"පියවර ගනු ලැබිය යුතුය:

එසේ වුවද, අනුග්‍රහයක් ඒ බැංකුවේ සේවා නියුක්තයන්ට අදාළ වැඩ පිළිවෙලක් යටතේ ප්‍රදානය කරනු ලැබ ඇති විට, ඒ අනුග්‍රහය ප්‍රදානය කරන අවස්ථාවේ දී බැංකුවේ සේවානියුක්තයකු ව සිටි අධ්‍යක්ෂවරයකුට, මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

(2) ඒ වගන්තියේ (11) වන උපවගන්තියට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

(11) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් යම් මුදල් වර්ෂයක් තුළ දී, අධ්‍යක්ෂවරයකු ගේ කිට්ටු ඥාතියකුට හෝ අධ්‍යක්ෂවරයකුගේ සැලකිය යුතු සම්බන්ධතාවක් පවත්නා යම් ව්‍යාපාරයකට හෝ අනුග්‍රහයක් ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ අනුග්‍රහය, ඒ මුදල් වර්ෂයේ ගිණුම්වල එළිදරව් කරනු ලැබිය යුතුය. මේ උපවගන්තිය යටතේ වන නියමයන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති නියමයකට අතිරේක වන අතර, ඒ නියමයක බලය හීන කිරීම් වශයෙන් නොවන්නේය".

28. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 48 වන වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 48 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

" නිශ්චල දේපළ මිලට ගැනීම සහ අත්කර ගැනීම.

48අ. මුදල් මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රාග්ධන අරමුදලේ යම් ප්‍රතිශතයක් සමස්ත වශයෙන් ඉක්මවන යම් නිශ්චල දේපළක් හෝ ඒ දේපළක අයිතිවාසිකමක්, මිලදී ගැනීම හෝ වෙනත් යම් ආකාරයකින් අත්කර ගැනීම වාණිජ බැංකු ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ එහි කාර්ය මණ්ඩලයට නිවාස සැපයීමේ හෝ පහසුකම් සැපයීමේ කාර්යය සඳහා හැර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නොකළ යුතුය;

එසේ වුවද යම් ණය මුදලක් සඳහා ඇප වශයෙන් යම් නිශ්චල දේපළක් තබා ගැනීම සහ එම ණය මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එම නිශ්චල දේපල පළමුව එළඹෙන අවස්ථාවේදී විකුණන තෙක් එම නිශ්චල දේපග දැරීම, මෙම සීමා කිරීම මගින් වළක්වනු නොලැබිය යුතුය."

29. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 49 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 49 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

" බුන්වත් වූ විට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු බව.

49අ. සිය බැඳීම් ඉටු කිරීමට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හෝ බුන්වත් වීමට ආසන්න බව හෝ තැන්පතුකරුවන්ට සහ වෙනත් ණය හිමියන්ට කළ යුතු ගෙවීම් අත්හිටුවීමට ආසන්නව සිටින බව සලකන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් වහාම ඒ බව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

30. මෙහි පහත දැක්වෙන අලුත් කොටස, VII වන කොටසට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII අ. කොටස ලෙස බලාත්මක විය යුතුය.

**VII අ කොටස**

බලපත්‍රලාභී වාණිජ බැංකුවක බැංකු ව්‍යාපාරය සතු කිරීම

" යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක බැංකු ව්‍යාපාරය සතු කිරීමේ නියමය.

49ආ. (1) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කරන වාර්තාවක් මත, (මේ කොටසෙහි මින් මතු "පැහැර හැරී බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ශ්‍රී ලංකාවෙහි බැංකු ව්‍යාපාරය කරගෙන යාමට නොහැකි බවට හෝ එහි තැන්පතුකරුවන්ගේ සහ ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව සමඟ ගණුදෙනු කර තිබෙන වෙනත් තැනැත්තන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි බවට ද, එම බැංකුව ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩව නිරතව සිටීම මුදල් හා බැංකු ක්‍රමයට හා ජාතික ආර්ථිකයට බරපතල ආර්ථික පාඩු සිදු කිරීමට සහ අහිතකර අන්දමින් බලපෑමට හේතුවිය හැකි බවටද, මුදල් මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක දී, වෙනත් යම් නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණද, මුදල් මණ්ඩලය විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් එම පැහැර හැරී බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබුවා වූ ද මේ පනතින් හෝ මේ පනත යටතේ ඒ බැංකුව විසින් පවත්වාගෙන යාමට බලය දෙන ලද ව්‍යාපාරයක් වූද එහි ව්‍යාපාරය හෝ මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ඒ ව්‍යාපාරයේ කොටසක් හෝ (මේ කොටසේ මින් මතු "අත්කර ගන්නා බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ එසේ සතු කරනු ලැබීමට එකඟවන වෙනත් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත සතු කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "පැහැර හැරි බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබුවා වූ ව්‍යාපාරය" යන්නට-

(අ) අදාළ දිනයට පෙරාතුවම දිනයේ දී, පැහැර හැරි බැංකුවට අයත්ව තිබුණා වූ ද (මුදල් ශේෂ, සංචිත අරමුදල් ආයෝජන සහ තැන්පතු ඇතුළු) සියලු නිශ්චල සහ චංචල දේපළ;

(ආ) අදාළ දිනයට පෙරාතුවම දිනයේ දී, පැහැර හැරි බැංකුවට අයත්ව තිබුණා වූ ද එම බැංකුවේ ව්‍යාපාරය කරගෙන යාමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබුවා වූ ද යම් චංචල හෝ නිශ්චල දේපළක හෝ දේපළකින් උද්ගත වන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර සහ සම්බන්ධතා;

(ඇ) පැහැර හැරි බැංකුවේ, අදාළ දිනයට පෙරාතුවම දිනයේ දී පැවති සියලු බැරකම් ; සහ

(ඈ) ශ්‍රී ලංකාවෙහි ඒ ව්‍යාපාරයට සම්බන්ධ හෝ අදාළ සියලු පොත්පත්, ගිණුම් හා ලියකියවිලි ඇතුළත් වේ.

" නියමයන් හා කොන්දේසි පිළිපැදීමට අත්කර ගන්නා බැංකුව එකඟ වූ පසු නියමය කළ යුතු බව.

49ඇ. (අ) යෝජිත අත්කර ගන්නා බැංකුවට, සතු කිරීමට යෝජිත පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරය සාර්ථක ආකාරයෙන් කරගෙන යාමට හැකියාව තිබෙන බවට සහ පැහැර හැරි බැංකුවේ තැන්පතුකරුවන් හා ණය හිමියන් කෙරෙහි එම බැංකුවේ පවත්නා, සහ සතු කිරීමට යෝජිත ව්‍යාපාරයට අදාළ හෝ සම්බන්ධ බැරකම් පියවීමේ හැකියාව තිබෙන බවට මුදල් මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම් මිස;

(ආ) (i) පැහැර හැරි බැංකුවේ සතු කිරීමට යෝජිත ව්‍යාපාරයට අදාළ හෝ සම්බන්ධ පවත්නා යම් වත්කම්, ප්‍රයෝජනයට ගන්නා ආකාරය සහ සතු කිරීමට යෝජිත ව්‍යාපාරයට අදාළ හෝ සම්බන්ධ පැහැර හැරි බැංකුවේ යම් පවත්නා බැරකම් පියවන ආකාරය සම්බන්ධව ද;

(ii) පැහැර හැරි බැංකුවෙන් ස්වෛරී ආණ්ඩුවකට අයවිය යුතු යම් ගෙවීම් කරන ආකාරය සම්බන්ධව ද

මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමයන්ට හා කොන්දේසිවලට අනුව කටයුතු කරන බවට, යෝජිත අත්කර ගන්නා බැංකුව ලියවිල්ලකින් එකඟ වන්නේ නම් මිස,

මුදල් මණ්ඩලය 49 ආ වගන්තිය යටතේ කිසි නියමයක් නොකළ යුතුය.

49ඈ. පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරය හෝ ඉන් කොටසක්, අත්කර ගන්නා බැංකුව වෙත සතු කරමින් 49 ආ වගන්තිය යටතේ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මේ කොටසෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි-

(අ) පැහැර හැරි බැංකුවේ සතු කරන ලද ව්‍යාපාරයේ පාලනය සහ සන්තකය, අත්කර ගන්නා බැංකුව විසින් ලැබිය යුතු අතර ඒ බැංකුව එකී පැහැර හැරි බැංකුවේ සතු කරන ලද ව්‍යාපාරයේ පැවරුම්ලාභියා වන්නේය;

(ආ) අත්කර ගන්නා බැංකුව වෙත සතු කරන ලද ව්‍යාපාරය කරගෙන යාම සඳහා, පැහැර හැරි බැංකුවට මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය, අත්කර ගන්නා බැංකුව වෙත සතු කරනු නොලැබූ ඒ ව්‍යාපාරයේ කොටස, පැහැර හැරි බැංකුව විසින් කර ගෙන යාමට හැකි වනු පිණිස අවශ්‍ය ප්‍රමාණයට වෙනස් කරනු ලැබිය යුතුය;

(ඇ) අත්කර ගන්නා බැංකුව විසින්, 49ඇ වගන්තියේ (ආ) ඡේදය යටතේ එකඟවුණු නියමයන් හා කොන්දේසි සහ මුදල් මණ්ඩලය විසින් මේ පනත යටතේ ඒ බැංකුවට කරනු ලැබිය හැකි වෙනත් විධාන පිළිපැදිය යුතුය;

(ඈ) පැහැර හැරි බැංකුවේ දේශීය සහ අක්වෙරළ බැංකු ව්‍යාපාරය, අත්කර ගන්නා බැංකුව වෙත සතු කරනු ලබන අවස්ථාවක, බැංකු ව්‍යාපාරය කරගෙන යාම සඳහා පැහැර හැරි බැංකුවට මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරන ලද බව සැලකිය යුතුය.

49ඉ. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, අත්කර ගන්නා බැංකුව වෙත පැහැර හැරි බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ලබා දී නැති අවස්ථාවක, පැහැර හැරි බැංකුවේ යම් විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුකරුවකුගේ ඉල්ලීම් ඉටු කිරීමට, අත්කර ගන්නා බැංකුව වෙත ඇති වගකීම, ඒ තැන්පතුකරුවන්ට සහන සැලසීම සඳහා මුදල් මණ්ඩලය විසින් පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරය පිළිබඳව සමාලෝචනයකින් අනතුරුව, සකස් කරනු ලැබිය හැකි යම් වැඩපිළිවෙලක් නියමයන් හා කොන්දේසි පිළිගැනීමට එකඟවන තැන්පතුකරුවන් සම්බන්ධයෙන් පමණක් මෙන්ම ඒ වැඩපිළිවෙලෙහි ගෙන හැර දැක්වෙන ප්‍රමාණය දක්වා පමණක් විය යුතුය:

එසේ වුවද, ඒ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඵත්කර ගන්නා බැංකුව වෙත ලබා දී ඇති විට හෝ ඵත්කර ගන්නා බැංකුව විසින් පැහැර හැරි බැංකුවේ, විදේශයන්හි තිබෙන ඒ ව්‍යවහාර මුදල් තැන්පතු හෝ වෙනත් වත්කම් ආපසු ලබාගෙන ඇති විට, එසේ ලබා දෙන ලද තැන්පතු හෝ එසේ ආපසු ලබා ගන්නා ලද තැන්පතු හෝ වෙනත් වත්කම්, එම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුකරුවන්ට ගෙවීම සම්බන්ධයෙන්, ඵත්කර ගන්නා බැංකුව වෙත විධාන කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇති අතර, ඵත්කර ගන්නා බැංකුව, ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

49ඊ. (1) අදාළ දිනයට පෙරාතුව ම දිනයේ දී පැහැර හැරි බැංකුවේ සතු කරන ලද ව්‍යාපාරයේ වටිනාකම නිශ්චය කිරීම පිණිස, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පත්කරනු ලබන, සුදුසුකම්ලත් විගණකවරයකු ලවා, එම සතු කරන ලද ව්‍යාපාරයේ විගණනයක් කිරීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින් තමා පත් කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මුදල් මණ්ඩලය එම වාර්තාව සලකා බලා, අවශ්‍ය නම් මුදල් මණ්ඩලය අවශ්‍ය යයි සලකන වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සපයන ලෙස විගණකවරයාට නියම කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින්, පැහැර හැරි බැංකුවේ ගිණුම් පරීක්ෂාකර බලා ශේෂ පත්‍රයේ නිවැරදි බව නිශ්චය කොට,

(අ) ඔහු ඉල්ලා සිටි සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ඔහුට ලැබුනේ ද නැද්ද යන වග;

(ආ) වාර්තාවේ සඳහන් ශේෂ පත්‍රයෙන් හා ගිණුම්වලින්, පැහැර හැරි බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වය පිළිඹිඹු වන සේ ඒවා නිසි පරිදි සකස් කර තිබේ ද යන වග; සහ

(ඇ) සතු කරන ලද ව්‍යාපාරයේ වත්කම් හා බැරකම්වල වටිනාකම ප්‍රකාශ කරන වාර්තාවක සපයනු ලැබිය යුතුය.

(4) විගණකවරයාගේ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය විසින් සතු කරන ලද ව්‍යාපාරයේ වටිනාකම අවස්ථාවෝචිත පරිදි, පැහැර හැරි බැංකුවට හෝ එහි ඇවරකරුවන්ට හෝ එහි අනුප්‍රාප්තිකයන්ට හෝ මුදල් මණ්ඩලය නිශ්චිතව සඳහන් කරන ආකාරයට හා කාලය ඇතුළත, ගෙවන ලෙස, ඵත්කර ගන්නා බැංකුවට විධාන කල යුතුය.

(5) පැහැර හැරි බැංකුවට (4) වන උපවගන්තිය යටතේ වූ විධානයක් ප්‍රකාර කළ යුතු ගෙවීම් සහ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයාට කිරීමට නියමිත සියලු ගෙවීම් මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව, ඵත්කර ගන්නා බැංකුව විසින් කරනු ලැබිය යුතුය.

49උ. අදාළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි-

(අ) පැහැර හැරි බැංකුවේ සතු කරන ලද ව්‍යාපාරයට අදාළ වූ හෝ සම්බන්ධ වන්නා වූ ද, අදාළ දිනයට පෙරාතුවම දිනයේ දී පැවතියා වූ හෝ බලපැවැත්වූ ද, පැහැර හැරි බැංකුව පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පැහැර හැරි බැංකුවේ වාසියට වන්නාවූ ද, සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝර්නි බල නීත්‍යානුකූල නියෝජිත බල ප්‍රදානයන් සහ කවර වූ ආකාරයක වෙනත් සාධනපත්‍ර අදාළ දිනයේ සිට ක්‍රියාත්මක වන ලෙස අවස්ථාවෝචිත පරිදි ඵත්කර ගත් බැංකුව ඇතුළත් වූ හෝ ප්‍රදානය කළ ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝර්නි බල, නීත්‍යානුකූල නියෝජිත බලප්‍රදානයන් සහ වෙනත් සාධන පත්‍ර ලෙස සැලකිය යුතුය;

(ආ) පැහැර හැරි බැංකුවේ සතු කරන ලද ව්‍යාපාරයට අදාළ වන්නා වූ හෝ සම්බන්ධ වන්නා වූ ද අදාළ දිනයට පෙරාතුව ම දිනයේ දී නොඅවසන්ව පැවතියා වූ ද, පැහැර හැරි බැංකුව විසින් හෝ ඊට විරුද්ධව පවරා ඇති කවර වූ හෝ ස්වභාවයක සියලු නඩු හෝ නඩු කටයුතු අදාළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඵත්කර ගන්නා බැංකුව විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද නඩු හෝ නඩු කටයුතු ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒවා නවදුරටත් පවත්වාගෙන යා යුතුය. නැතහොත් නඩු කටයුතු කරගෙන යා යුතුය;

(ඇ) ඵත්කර ගන්නා බැංකුව විසින් එහි සේවා නියුක්තිය දීමට ඉදිරිපත් නොවන, අදාළ දිනයට පෙරාතුවම දිනයේ දී අවස්ථාවෝචිත පරිදි පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරයෙන් සතු කරන ලද කොටසට සම්බන්ධ නිලධරයන්ට හා සේවකයන්ට නැතහොත් පැහැර හැරි බැංකුවේ මුළු ව්‍යාපාරයම සතු කරන ලද විට පැහැර හැරි බැංකුවේ සියලු නිලධරයන්ට හා සේවකයන්ට වන්දි මුදලක් ගෙවනු ලැබීමට හිමිකම් ලැබෙන්නේය.

49උ෧. පැහැර හැරී බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට වන්දි මුදලක් ගෙවනු ලැබීමට හිමිකම් ඇති අවස්ථාවක, ගෙවිය යුතු වන්දි මුදල අත්කර ගන්නා බැංකුව විසින් කම්කරු කොමසාරිස්වරයා විමසා තීරණය කල යුතුය. එම තීරණය, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ නිලධරයාට හෝ සේවකයාට ඇති අයිතිවාසිකමක් කෙරෙහි බලනොපවත්වන ලෙස සැලකිය යුතුය.

49එ. මේ කොටසේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ පනවන ලද යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියාකිරීම් පැහැර හරින කවර හෝ තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේය.

49ඒ. 12වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවල අන්තර්ගත කිසිවක්, පැහැර හැරී බැංකුවක බැංකු ව්‍යාපාරය හෝ එම ව්‍යාපාරයෙන් කොටසක් අත්කර ගන්නා බැංකුව වෙත සතු කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

49ඔ. මේ පනතේ මේ කොටසෙහි පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස:—

"සතු කරන ලද ව්‍යාපාරයේ වටිනාකම" යන්නෙන් 40ආ වගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රකාර, අත්කර ගන්නා බැංකුව වෙත සතු කරන ලද, පැහැර හැරී බැංකුවේ (49ඊ වගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින් නිශ්චය කරන පරිදි අයකරගත නොහැකි වත්කම් හැර) වත්කම්වල වටිනාකමින් අත්කර ගන්නා බැංකුව වෙත එම නියමය ප්‍රකාර සතු කර ඇති, පැහැර හැරී බැංකුවේ බැරකම්වල වටිනාකම අඩු කිරීමෙන් ලැබෙන වටිනාකම අදහස් වේ;

"සතු කරන ලද ව්‍යාපාරය" යන්නෙන්, අත්කර ගන්නා බැංකුවක් හෝ පැහැර හැරී බැංකුවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ අත්කර ගන්නා බැංකුව වෙත 49 ආ වගන්තිය යටතේ වූ නියමයකින් සතු කරන ලද, පැහැර හැරී බැංකුවේ බැංකු ව්‍යාපාරය අදහස් වේ

31. ප්‍රධාන ප්‍රඥප්තියෙහි ix වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ ixඅ වන කොටස වශයෙන් බලපැවැත්විය යුතුය:-

## IX අ කොටස

## බලපත්‍රලාභී විශේෂිත බැංකු

76අ. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් තීරණය කරනු ලබන දිනයක දී සහ ඉන් පසු තැන්පතු භාර ගැනීමේ ද එම මුදල් ආයෝජනය කිරීමේ සහ ණයට දීමේ ද ව්‍යාපාරය, රුපියල් මිලියන පනහකට නොඅඩු ප්‍රමාණයක කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් ඇති සමාගමක් විසින් සහ තත්කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් මේ පනතේ මේ කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරගෙන යනු නොලැබිය යුතුය.

එසේ වුවද, බලපත්‍රයක් ලබා ගැනීමේ නියමය, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ මුදල් සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලද සමාගමක්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිතියක්, (401 වන අධිකාරය වන) ජාතික නිවාස පනත යටතේ සංස්ථාගත කරන ලද ගොඩනැගිලි සමිතියක්, මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් බලපත්‍රලත් සමාගමක, සහ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ ලියාපදිංචි කරන ලද්දා වූ ද ප්‍රධාන වශයෙන් ලාභ ලැබීමේ පරමාර්ථය මුල් කරගෙන පිහිටුවනු ලැබූ සංවිධානයක් නොවන්නා වූ ද එහි ලියාපදිංචි සාමාජිකයන්ගෙන්, පමණක් තැන්පතු භාරගන්නා වූ සහ එසේ මුදල් භාර ගැනීමටත් එම මුදල් ආයෝජනය කිරීමට හෝ ණයට දීමටත් මුදල් මණ්ඩලයෙන් ලිඛිත අවසරය ලබා ඇති යම් සංවිධානයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුය.

(2) එම සමාගම ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් වන අවස්ථාවක, එම සමාගම විසින් 1982 අංක 17 දරන සමාගම් පනතේ XIII වන කොටසට අනුකූල කටයුතු කර ඇත්නම් මිස, මේ පනතේ මේ කොටස යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

(3) මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සහ 76ආ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලබන දින හෝ ඊට පසු මේ පනතේ III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් සියලු ආයතනවලට මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(4) (1) වන උපවගන්තිය කඩකරමින් ව්‍යාපාරය කරගෙන යන කවර හෝ සමාගමක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "සමාගම" යන්නෙහි 1982 අංක 17 දරන සමාගම් පනතේ 440 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි වූ අර්ථයම තිබිය යුතු අතර, ශ්‍රී ලංකාවෙන් පිටත තිබි ලෙස සංස්ථාගත කරන ලද සමාගමක් හෝ යම් විදේශ රටක යම් ව්‍යවස්ථාපිත නීතියක් රාජකීය අධිකාර පත්‍රයක් හෝ රාජ්‍ය සන්නසක් අනුව පිහිටුවන ලද සංස්ථාවක් සහ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ පිහිටුවන ලද සංස්ථාවක් ඊට ඇතුළත් විය යුතුය. තවද ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද පුද්ගලික සමාගමක් ඊට ඇතුළත් නොවිය යුතුය.

"කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය" යන්නෙන් මේ පනතේ 19 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය.

76ආ. (1) 76අ වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතිය අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලීමෙහි සඳහන් කර ඇති විස්තරය, ඉල්ලුම්කරුගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට වූ ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක් එහි අඩංගු විය යුතුය.

(2) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් සමග ම පහත දැක්වෙන දේ ඉදිරිපත් කර තිබිය යුතුය:-

(අ) සමාගමේ සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ, හෝ සමාගමේ ව්‍යවස්ථාවේ හෝ ඊට සම්බන්ධ වෙනත් යම් ලේඛනයක පිටපතක්;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි එම සමාගම හෝ සංස්ථාව මහ බැංකුව විසින් ඉල්ලා සිටි විට, ශ්‍රී ලංකාව තුළ එම සමාගමේ හෝ සංස්ථාවේ ව්‍යාපාරය කරගෙන යාමේ දී ඇතිකරගත් සියලු බැඳීම් සහ බැරකම් ආවරණය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයන බව ප්‍රකාශ කෙරෙන්නා වූ ද එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් සනාථ කරනු ලැබූ ද ලිඛිත පොරොන්දුවක් සහ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන විස්තර ඇතුළත්ව එම සමාගම් සංස්ථාගත කරනු ලැබූ රටේ මුදල් අධිකාරියෙන් ලබාගත් වාර්තාවක්.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට මුදල් මණ්ඩලය විසින් අවශ්‍ය යයි එම මණ්ඩලය අදහස් කරන අවස්ථාවක, ඒ සමාගමට බලපත්‍රයක් නිකුත් කළ යුතුද නැද්ද යන වග තීරණය කිරීම සඳහා වෙනත් ලේඛන හෝ විස්තර සපයන ලෙස ඉල්ලුම්කරුට නියම කල හැකිය.

(4) යම් වැදගත් කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය හා නොමග යවන සුලු බව තමා දන්නා තොරතුරු ඇතුළත් වූ ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් ලේඛන ඉදිරිපත් කරන යම් ඉල්ලුම්කරුවකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතුය.

76ඇ. (1) 76ආ වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, මුදල් මණ්ඩලය විසින්, ඒ ඉල්ලුම් පත්‍රය සමග වූ ලේඛන සහ විස්තර සලකා බැලීමෙන් පසු-

(අ) "බැංකුව" යන යෙදුම හෝ එහි යම් ව්‍යුත්පන්නයක් හෝ අක්ෂර පරිවර්තනයක් භාවිතා කිරීමට ඉල්ලුම්කරුට අවසරදීම උචිත බවට;

(ආ) ඉල්ලුම්කරු විසින් බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි පිළිපදිනු ලබන බවට සහ

(ඇ) ඉල්ලුම්කරුට එම බලපත්‍රය නිකුත් කිරීම ජාතික ආර්ථිකයේ යහපතට හානිකර නොවන බවට,

සෑහීමට පත්ව, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මේ පනතේ මේ කොටස යටතේ ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කළ හැකිය.

(2) එම සමාගම විසින් එහි ව්‍යාපාරය කරගෙන යා හැකි ස්ථානය, ස්ථාන හෝ ප්‍රදේශය බල පත්‍රයේ නිශ්චිතව සඳහන් කළ යුතු අතර එම සමාගම විසින්, මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව මිස, වෙනත් යම් ස්ථානයක ව්‍යාපාරය නොකළ යුතුය.

(3) මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලැබූ යම් සමාගමක්, මෙහි මින් මතු "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(4) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්, මේ පනතේ IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් පරිදි වූ ව්‍යාපාර වර්ග, එම සමාගම විසින් කරගෙන යාමට අවසර ලැබෙන ව්‍යාපාර පිළිබඳව බලපත්‍රයේ ප්‍රකාශිතව නියම කරනු ලබන වැඩිදුර සීමාකිරීම්වලට යටත්ව, කරගෙන යා හැකිය.

(5) මේ පනතේ මේ කොටස යටතේ නිකුත්කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ ව්‍යාපාරය කරගෙන යන බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 2 වන වගන්තිය උල්ලංඝනය නොකරන ලෙස සැලකිය යුතුය.

76ඈ. (1) මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සමාගමක් විසින්, යම් භාෂාවකින් "බැංකුව", "බැංකුකරු" හෝ "බැංකු කටයුතු" යන වචන අතුරින් කිසිවක් එම සමාගමේ නමේ හෝ විස්තරයේ කොටසක් වශයෙන් භාවිතා කළ යුතුය;

එසේ වුවද, යම් භාෂාවකින් "බැංකුව", "බැංකුකරු" හෝ "බැංකු කටයුතු" යන වචන සිය නමෙහි අඩංගු නොවන ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථා ගත කරනු ලැබූ සමාගමක් හෝ මේ පනතේ III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආයතනයක් විසින් මේ වචන එහි නමේ හෝ විස්තරයේ නැති වුවද එකී ව්‍යාපාරය කරගෙන යා හැකිය.

(2) සමාගම සංස්ථාගත කිරීමෙන් පසු එක් සතියක් ඇතුළත 76ආ වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරන සමාගමකට ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ තීරණය එම සමාගමට දැනුම් දෙන තෙක්, මේ වගන්තියේ කිසිවක් එම සමාගමට අදාළ නොවිය යුතුය.

76ඉ. මුදල් මණ්ඩලය විසින් මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් බලපත්‍රය දෙන ලද සෑම ආයතනයක් සම්බන්ධයෙන් ම ලේඛනයක්, නියමිත ආකෘතියෙහි තබාගෙන පවත්වාගත යුතුය.

බලපත්‍රය අවලංගු කිරීම

76ඊ (1) මුදල් මණ්ඩලයට 76ක වගන්තිය යටතේ ලැබෙන බලතලවලට හානියක් නැතිව, යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් බලපත්‍රය අවලංගු කිරීම –

(අ) බලපත්‍රය නිකුත් කරනු ලැබීමෙන් පසු මාස නවයක් ඇතුළත ව්‍යාපාරය ආරම්භ කිරීමට අසමත් වී ඇති බවට; හෝ

(ආ) එය විසින් ඇතිකරගත් ණය එම ණය ගෙවිය යුතු වූ විට ගෙවීමට අසමත් වී ඇති බවට; හෝ

(ඇ) එයට විරුද්ධව සහනය සඳහා පෙත්සමක් හෝ නඩුවක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, යම් වස්තු භංගත්ව නීතියක් හෝ ණයකරුවන්ට සහන සඳහා විධි විධාන සැළැස්වෙන හෝ ණයකරුවන්ට අදාළ වෙනත් යම් නීතියක් යටතේ භාරකරුවකු හෝ භාරගන්නකු, ඒ සමාගම සම්බන්ධයෙන් පත් කරනු ලැබ සිටින බවට; හෝ

(ඈ) බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ ව්‍යාපාරය කර ගෙන යාම නතර කර ඇති බවට; හෝ

(ඉ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් විධාන දිගටම උල්ලංඝනය කරන හෝ කඩ කරන බවට; හෝ

(ඊ) එම බැංකුව සංස්ථාගත කළ රටේ උචිත බලධරයා විසින් හෝ විධිමත් කිරීමේ මණ්ඩලය විසින් එහි ක්‍රියා කිරීමේ බලපත්‍රය හෝ අධිකාරය අවලංගු කර හෝ ආපසු ලබාගෙන ඇති බවට,

මුදල් මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක දී මුදල් මණ්ඩලය විසින් එම බැංකුවට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කරන බවට දැන්වීමක් කළ හැකි අතර, එම දැන්වීම එම බැංකුවට නිවේදනය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවලංගු කිරීම පිළිබඳ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත, එම අවලංගු කිරීමේ දැන්වීමට විරුද්ධව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්, එම බැංකුවට නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රය එසේ අවලංගු නොකළ යුතු වීමට හේතු දක්වමින් මුදල් මණ්ඩලය වෙත ලියවිල්ලක් මගින් විරෝධතා ඉදිරිපත් කළ හැකිය.

(3) අවලංගු කිරීම පිළිබඳ නිවේදනයේ දිනයෙන් දින හැටක් ඉකුත් වීමෙන් පසුව සහ (2) වන උප වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසුව මණ්ඩලය විසින්, එම දැන්වීම ඉස්කර ගැනීම හෝ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම හෝ කළ හැකි අතර, ඒ අනුව ඒ බව ඒ බැංකුවට දැනුම් දිය යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම –

(අ) ඊට විරුද්ධව (5) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, එම අභියාචනය ඉදිරිපත් කිරීමේ කාලය ඉකුත් වීමෙන් පසුව; හෝ

(ආ) අවලංගු කිරීමට විරුද්ධව (5) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක අභියාචනාධිකරණය විසින් එම අවලංගු කිරීම ස්ථිර කරනු ලැබූ විට,

ක්‍රියාත්මක විය යුතු අතර, එකී අවලංගු කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(5) බලපත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව එම අවලංගු කිරීම පිළිබඳව තමාට මණ්ඩලය විසින් දැනුම් දීමෙන් දින දාහතරක් ඇතුළත අභියාචනාධිකරණයට අභියාචනය කරනු ලැබිය හැකිය.

(6) මේ වගන්තිය යටතේ වූ අභියාචන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන ඉල්ලීම් කිරීම සම්බන්ධයෙන් එම ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති මේ වගන්තිය යටතේ කෙරෙන සෑම අභියාචනයකට ම අදාළ විය යුතුය.

(7) අභියාචනාධිකරණය විසින්, (5) වන උපවගන්තිය යටතේ ඊට කරන ලද අභියාචනයක් මත එම අභියාචනයට මුල් වූ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභා කිරීම කරනු ලැබිය හැකි අතර, යුක්තිය ඉටුවීමට අවශ්‍ය වෙනත් යම් ආඥාවක් ද කරනු ලැබිය හැකිය.

(8) බලපත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථාවක දී මුදල් මණ්ඩලය විසින් ඒ බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ නම 76ඉ වගන්තිය යටතේ පවත්වනු ලබන ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, ඒ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ඇතුළුව අවශ්‍ය යයි මණ්ඩලය අදහස් කරන විධාන නිකුත් කරනු ලැබිය හැකිය.

(9) (8) වන වගන්තිය යටතේ වූ විධාන නිකුත් කිරීමෙන් දින තිහක් ඇතුළත එම විධානවලට අනුකූලව කටයුතු කිරීම බලපත්‍රලාභී විශේෂිත බැංකුව විසින් පැහැර හරින ලද අවස්ථාවක, බලපත්‍රලාභී විශේෂිත බැංකුව ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පැවරීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට මුදල් මණ්ඩලය විසින් නියම කළ හැකි අතර, 76ක වගන්තියේ විධිවිධාන එම ගණන් බේරා වසා දැමීමට අදාළ විය යුතුය.

76ද. (1) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සෑම කල්හි ම රුපියල් මිලියන පණහකට අඩු නොවූ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් පවත්වාගත යුතුය.

(2) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව, එහි කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය හෝ ව්‍යවස්ථාපිත සංචිත හෝ අඩු කිරීම හෝ දුර්වල කිරීම නොකළ යුතුය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා-

(අ) "කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය" යන්නෙහි මේ පනතේ 19 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේය;

(ආ) "ව්‍යවස්ථාපිත සංචිත" යන්නෙන් මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට නිකුත් කරන ලද විධානයක් අනුව ඒ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන යම් සංචිත අරමුදල් අදහස් වේ.

76දා. මේ පනතේ V වන කොටසේ විධිවිධාන, එම කොටසෙහි "බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන යෙදුම් යෙදෙන කවර තැනක වුව ද එම යෙදුම වෙනුවට "බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන යෙදුම ආදේශ කළාක් මෙන්, බලපත්‍රලාභී විශේෂිත බැංකු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

76ඒ. (1) වෙනත් යම් නීතියක කවර විධිවිධාන තිබුණ ද බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ව්‍යාපාරයේ යම් අංශයක් කරගෙන යායුතු ආකාරය සම්බන්ධයෙන්, විශේෂයෙන් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකු වර්ගයකට හෝ මුදල් මණ්ඩලය විසින් විධාන දෙනු ලැබිය හැකිය:-

(අ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයන්ගෙන් යුතු ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතයක් බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පවත්වා ගැනීම;

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක සංචිත අරමුදල, අඩුකිරීම හෝ දුර්වල කර ගැනීම ඇතුළුව, සංචිත අරමුදල පවත්වා ගෙනයාම;

(ඇ) තැන්පතු කවර නියමයන් සහ කොන්දේසි යටතේ භාර ගැනේ ද යන්න; ඒ තැන්පතු මත ගෙවිය යුතු උපරිම පොළී අනුප්‍රමාණ; තැන්පතු භාරගනු ලැබිය යුතු උපරිම කාලසීමා සහ එක් තැනැත්තකුගේ නමින් එක් ගිණුමක හෝ ගිණුම් වැඩි ගණනක බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තැන්පත් කළ හැකි වැඩිම මුදල;

(ඇ) එම බැංකු විසින් යම් ණය, ණය පහසුකම් හෝ යම් වර්ගයක අනුග්‍රහයක් ප්‍රදානය කිරීම කවර නියමයන් හා කොන්දේසි වලට යටත් වේද යන වග සහ එම ණය, ණය පහසුකම්, හෝ වෙනත් අනුග්‍රහ වර්ග මත අය කළ හැකි උපරිම පොළී අනුප්‍රමාණ, සහ එවැනි යම් ණයක්, ණය පහසුකමක් හෝ වෙනත් වර්ගයක අනුග්‍රහයක් ප්‍රදානය කළ හැකි උපරිම කාලසීමා;

(ඉ) කොමිස්, වට්ටම්, ගාස්තු හෝ කවර හෝ ආකාරයක වෙනත් ලැබීම් හෝ ගෙවීම් වශයෙන් එම බැංකුවලට ගෙවිය හැකි හෝ එම බැංකු විසින් අය කළ හැකි උපරිම අනුප්‍රමාණ;

(ඊ) අපේක්ෂිත කුලියට ගන්නකු විසින් යම් කුලී සින්නක්කර ගිවිසුමක් මත ගෙවිය යුතු අවම මූලික ගෙවීම සහ විවිධ පංතිවල ගණුදෙනු සඳහා ගෙවිය යුතු නිශ්චිත විවිධ මූලික ගෙවීම්: එම අවම මූලික ගෙවීම්, එම ගිවිසුම යටතේ කුලියට ගන්නා භාණ්ඩවල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකිය;

(උ) එම බැංකු විසින් ආයෝජනයන් කළ හැකි වන්නේ කවර නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද යන වග;

(ඌ) එම බැංකු විසින් දෙනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් අනුග්‍රහයන් සහ කරනු ලබන ආයෝජන සඳහා වූ උපරිම කල්පිරීම් සීමා සහ විවිධ වර්ගවල ණයදීම්, ණය සහ ආයෝජන කටයුතු සඳහා නියම කළ හැකි හෝ අවසර දෙනු ලැබිය හැකි ඇපවල ස්වභාවය හා ප්‍රමාණය;

(එ) එම බැංකු විසින් ගිණුම් පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වා ගත යුතු ආකාරය සහ ක්‍රමය;

(ඒ) ප්‍රදානය කරන ලද ණය නොගෙවා හිඟ තබා ඇත්නම්, එම ණය සඳහා වූ නොගෙවූ පොලිය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ආදායමෙන් බැහැර කිරීම;

(ඔ) එම බැංකුවල ද්‍රවශීල වත්කම් එම බැංකුවල මුළු තැන්පතු බැරකම්වලට දැරිය යුතු අවම අනුපාතය;

(ඕ) මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් මහ බැංකුව වෙත මුදල් ශේෂ පවත්වා ගැනීම සහ එම මුදල් ශේෂ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල තැන්පතු බැරකම්වලට දැරිය යුතු අවම අනුපාතය;

(ක) කල් පිරීමට පෙර තැන්පතු, තැන්පතුකරුවන් විසින් ආපසු ගැනීමට අදාළ විය යුතු කොන්දේසි;

(ග) එම බැංකුවල ණය, ණය පහසුකම් සහ වෙනත් වර්ගවල අනුග්‍රහ හෝ අයෝජන පිළිබඳ මුදල් ප්‍රමාණය වැඩි කිරීම එම බැංකුවලට තහනම් කිරීම;

(ච) එම බැංකු විසින් දෙනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන යම් ණය, ආයෝජන හෝ අනුග්‍රහ පිළිබඳ මුදල් ප්‍රමාණය නිශ්චිත කාලපරිච්ඡේද තුළ වැඩි කළ හැකි අනුප්‍රමාණවල සීමා නියම කිරීම;

(ජ) එම බැංකුවල ණය, ආයෝජන හෝ අනුග්‍රහ පිළිබඳ මුදල් ප්‍රමාණය යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් ඇතුළත නිශ්චිත සීමා දක්වා අඩු කිරීමට නියම කිරීම;

(ඣ) එම බැංකුවල ණය, ආයෝජන හෝ අනුග්‍රහ ප්‍රාග්ධනයෙන් පහත දැක්වෙන තැනැත්තන් හෝ ආයතන විසින් දැරිය හැකි උපරිම ප්‍රතිශතයඃ-

(i) සමාගමක්, සංස්ථාවක් හෝ තැනැත්තකු විසින්;

(ii) සමස්ත වශයෙන්-

(අ) සමාගමක් සහ පහත දැක්වෙන තැනැත්තන් හෝ ආයතනවලින් එක් තැනැත්තකු හෝ ආයතනයක් හෝ වැඩි ගණනක් විසින් එනම්-

(අඅ) එහි පාලිත සමාගම;
(ආආ) එහි පාලන සමාගම;
(ඇඇ) එහි පාලන සමාගමේ පාලිත සමාගමක්; හෝ
(ඈඈ) එම සමාගමට හෝ එහි පාලිත සමාගමට, හෝ එහි පාලන සමාගමට හෝ එහි පාලන සමාගමේ පාලිත සමාගමකට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක්; හෝ

(ආ) තැනැත්තකු සහ පහත සඳහන් තැනැත්තන්ගෙන් හෝ ආයතනවලින් එක් තැනැත්තකු හෝ ආයතනයක් හෝ වැඩි ගණනක්,
එනම් -

(අඅ) ඔහුගේ සමීප ඥාතියකු;
(ආආ) ඔහුට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති හෝ ඔහුගේ සමීප ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක්;
(ඇඇ) එම සමාගමේ පාලිත සමාගමක්;
(ඈඈ) එම සමාගමේ පාලන සමාගමක්;
(ඉඉ) එම සමාගමේ පාලන සමාගමේ පාලිත සමාගමක්;
(ඊඊ) එම සමාගමට හෝ එහි පාලිත සමාගමට හෝ එහි පාලන සමාගමට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක්; හෝ
(උඋ) එම තැනැත්තාට හෝ ඔහුගේ සමීප ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ ද සමාගමක් නොවන්නා වූ ද සංස්ථාවක්;

එසේ වුවද 79ඔ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එම බැංකුව වෙත හෝ 76ග වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ විධිවිධාන යටතේ කොටස් හිමියකු වෙත පැනවුණු නියමයක් මත හැර, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී තැනැත්තකු විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක දරනු ලබන කොටස් අඩුකිරීමට, මේ වගන්තිය යටතේ දෙනු ලබන විධානයක් මගින් නියම නොකරනු ලැබිය යුතුය.

(ඩ) සුරක්ෂිත අත්තිකාරම් සම්බන්ධයෙන් පවත්වා ගතයුතු ආන්තික;

(ණ) බලපත්‍රලාභී විශේෂිත බැංකුව සහ බදු ගැණුම්කරුවකු අතර වූ බද්දදීමේ ගිවිසුම් වලට අදාළ නියමයන් හා කොන්දේසි;

(ත) බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් කරගෙන යා හැකි කටයුතු වර්ග පිළිබඳ සීමා.

(2) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත්, (1) වන උපවගන්තියේ (ඇ) සහ (ඈ) ඡේද යටතේ යම් විධානයක් මගින් නියම කරන ලද උපරිම පොළී අනුප්‍රමාණ එම විධානයේ දිනයට කලින් භාර ගන්නා ලද යම් තැන්පතුවක් සම්බන්ධයෙන් හෝ දෙන ලද යම් ණයක්, ණය පහසුකමක් හෝ වෙනත් යම් අනුග්‍රහයක් සම්බන්ධයෙන් අදාළ විය යුතුය;

එසේ වුවද එම විධානයක කිසිවක්-

(අ) එම විධානයේ දිනයට පෙර එවැනි යම් තැන්පතුවක් හෝ ණයක්, ණය පහසුකමක් හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයක් සම්බන්ධයෙන් උපචිත වූ යම් පොලියකට අදාළ නොවිය යුතුය; තවද,

(ආ) එම විධානයේ දිනයට පෙර භාර ගන්නා ලද යම් තැන්පතුවක් හෝ දෙන ලද ණයක්, ණය පහසුකමක් හෝ මූලය අනුග්‍රහයක් මත ගෙවිය යුතු පොළී අනුප්‍රමාණය අඩු කිරීම අවස්ථාවෝචිත පරිදි එම තැන්පතුවට, ණයට, ණය පහසුකමට හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයට අදාළ ගිවිසුම හෝ එකඟ වීම කඩ කිරීමක් වන්නේ නම්, එසේ අඩු කිරීමට නියම නොකළ යුතුය.

(3) මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින් අවශ්‍ය අවස්ථාවල දී (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් යම් විශේෂ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට විධාන දෙනු ලැබිය හැකිය.

(4) මුදල් මණ්ඩලය විසින් එහි අභිමතය පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ ඊට නිකුත් කරන ලද විධානයක් අනුව මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන යම් මුදල් ශේෂයක් මත මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් මත පොළිය ගෙවිය හැකිය.

(5) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නාවූ හෝ ඒ විධිවිධානයට පටහැනිව ක්‍රියාකරන්නා වූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන්නේය.

76ඹ. (1) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පහත දැක්වෙන ක්‍රියා කරන බව, එනම්-

(i) එම බැංකුවේ තැන්පතුකරුවන්ගේ යහපතට හානිකර වන අනුචිත හෝ අනිසි මූල්‍ය පරිචයන් අනුගමනය කරන බව; හෝ

(ii) එම බැංකුවේ තැන්පතුකරුවන්ගේ යහපතට හානිකර වන ආකාරයට එකී ව්‍යාපාරය කරගෙන යාමට ඉඩ ඇති බව; හෝ

(iii) මේ පනතේ මේ කොටසේ හෝ V වන කොටසේ යම් විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් විධානයක් කඩකර හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇති බව.

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන වාර්තාවක් අනුව මුදල් මණ්ඩලයේ මතය වන අවස්ථාවක මුදල් මණ්ඩලය විසින් එම බැංකුවට-

(අ) එවැනි යම් පරිචයක් අනුගමනය කිරීම නතර කරන ලෙස හෝ එවැනි යම් කඩකිරීමකින් වැළකී සිටින ලෙස; හෝ

(ආ) මේ පනතේ මේ කොටසේ සහ V වන කොටසේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන ලෙස; හෝ

(ඇ) එම පරිචය හෝ කඩකිරීම නිසා ඇති වන තත්ත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස; හෝ

(ඈ) යම් තැනැත්තකු විසින් සමාගමේ දරන කොටස් ගණන අඩු කිරීමට සලස්වන ලෙස
විධාන කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයකින් අතෘප්තියට පත් යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්, එම විධානය නිකුත් කළ දිනයෙන් පසු දින තිහක් ඉකුත්වීමට පෙර, මුදල් මණ්ඩලය වෙත එම විධානයට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. තවද මණ්ඩලය විසින් එම අභියාචනය ලැබී දින පහළොවක් ඇතුළත එහි තීරණය දිය යුතුය.

(3) බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූලවීම පිණිස ඒ බැංකුව විසින්, ඒ බැංකුවේ කොටස් දරන තැනැත්තකුට කරනු ලබන විධානයකින් ඒ කොටස් ඒ තැනැත්තා විසින් අත්කරගනු ලැබුවේ මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමට පෙර වූවද, ඉන් පසු වූවද, ඒ තැනැත්තා ඒ බැංකුවේ දරන කොටස් ගණන එම විධානයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත අඩු කරන ලෙස විධාන කරනු ලැබිය හැකිය. තවද ඒ විධානයට අනුකූලවීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතුය.

(4) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ කොටස් හිමියකු අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය හෝ (3) වන වගන්තිය යටතේ ඊට හෝ ඔහුට දෙන ලද විධානයකට අනුකූලවීම පැහැර හැරිය හොත්, එම බැංකුව හෝ කොටස් හිමියා මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස දහ අටක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතුය.

76ඕ. (1) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක පොත් සහ ගිණුම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කවර හෝ අවස්ථාවක පරීක්ෂා කළ හැකිය; නැතහොත් එසේ පරීක්ෂා කිරීමට ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට බලය දෙනු ලැබිය හැකිය.

(2) එවැනි පරීක්ෂණයක් නිම වූ පසු හැකිතාක් ඉක්මණින් එම පරීක්ෂණයේ වාර්තාව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, මහ බැංකුවේ අධිපතිවරයාට සැපයිය යුතුය. එම පරීක්ෂණයේ වියදම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවෙන් අය කරගත හැකිය.

(3) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් පහත දැක්වෙන දේ කිරීම නීත්‍යානුකූල වන්නේය:-

(අ) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු, සේවා නියුක්තයකු හෝ විගණකවරයකු ලවා දිවුරුම් ආඥාපනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා කරවීම;

(ආ) මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා නිශ්චය වශයෙන් දැන ගැනීම අවශ්‍ය යයි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ අදහස් කරන පරිදි බැංකුවේ කටයුතු වලට අදාළ සියලු තොරතුරු සැපයීමට යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, ලේකම්වරයකුට, සේවානියුක්තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම;

(ඇ) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, ලේකම්වරයකුට, සේවානියුක්තයකුට හෝ විගණකවරයකුට, ඔහුගේ භාරයේ හෝ සන්තකයේ ඇත්තා වූ ද, එවැනි තොරතුරක් අඩංගුවීමට ඉඩ ඇති වූ ද බැංකුවේ කටයුතුවලට අදාළ යම් පොත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කිරීම;

(ඇ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් අයථා කළමනාකරණය කරගෙන යනු ලබන බවට සාක්ෂි ඇති අවස්ථාවක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද විගණකවරයකු විසින් විගණනය කිරීම් සඳහා බැංකුවේ ගිණුම් ඉදිරිපත් කිරීමට එම බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුට හෝ ලේකම්වරයාට නියම කිරීම සහ එම විගණකවරයාට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලබන හෝ බලය දෙනු ලබන තොරතුරු සැපයීමට හෝ පොත්පත්, වාර්තා හෝ ලේඛන ඉදිරිපත් කිරීමට සහ ගාස්තු ගෙවීමට නියම කිරීම.

(4) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු, සේවා නියුක්තයකු හෝ යම් විගණකවරයකු විසින්, මේ වගන්තිය යටතේ තමාට පැනවුණු යම් නියමයකට අනුකූලව කටයුතු කිරීම සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටි කවර හෝ අවස්ථාවක දී බැංකුවේ මුදල් ශේෂ, වත්කම් හා බැරකම් ඇතුළු එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ සියලු පොත් හා වාර්තා පිරික්සීමේ ඉඩකඩ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙනලද යම් නිලධරයකුට හෝ(3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකුට හෝ ලබාදීම සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක එකී සෑම අධ්‍යක්ෂවරයකුගේ, කළමනාකරුවකුගේ, ලේකම්වරයකුගේ, සේවානියුක්තයකුගේ හෝ යම් විගණකවරයකුගේ කාර්යය විය යුතුය.

(5) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක කටයුතු වල සත්‍ය තත්ත්වය නිශ්චිතව දැන ගැනීමට සහ එම බැංකුව එහි වර්තමාන හෝ අනාගත තැන්පතුකරුවන්ට හානිකර ආකාරයකින් ව්‍යාපාරය කර ගෙන යන්නේද යන්න නිශ්චිතව දැන ගැනීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා අදහස් කරන අවස්ථාවක දී ඔහු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවට අදාළ තොරතුරු ඇතිව සිටිතැයි ඔහු සලකන තැනැත්තකුට, ඒ තොරතුරු ඔහු වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හෝ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකුට සපයන ලෙස හෝ එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් එම තැනැත්තා විභාග කළ හැකි වීම සඳහා එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ස්ථානයට, එසේ සඳහන් දින එසේ සඳහන් වේලාවේ දී ඔහු ඉදිරියට හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු ඉදිරියට පැමිණ සිටින ලෙස නියම කළ හැකිය.

(6) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක කටයුතුවල සත්‍ය තත්ත්වය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා අදහස් කරන්නේ නම් (5) වන වගන්තිය යටතේ වූ විභාග කිරීමක කාර්යය සඳහා –

(අ) විභාගයට යටත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ පාලන සමාගමක් හෝ පාලිත සමාගමක්;

(ආ) එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ පාලන සමාගමක පාලිත සමාගමක්;

(ඇ) එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ ආශ්‍රිත සමාගමක්

වන්නා වූ හෝ යම් අදාළ කාලයක දී එසේ තිබී ඇත්තා වූ යම් සමාගමක ව්‍යාපාරයද පරීක්ෂා කල හැකිය. තවද මේ වගන්තියේ පූර්වයෙන් වූ විධි විධාන මගින් ඔහු වෙත පිරිනමනු ලැබ ඇති බලතල වලින් කවර හෝ බලයක් ඔහු විසින් එවැනි යම් සමාගමක් විෂයෙහි ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. මේ උපවගන්තියේ " ආශ්‍රිත සමාගම" යන්න බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් යෙදෙන විට, සමාගමේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විස්සක් හෝ ඊට වැඩි එහෙත් සියයට පණහකට අඩු සාමාන්‍ය කොටස් එම බලපත්‍රලාභී විශේෂිත බැංකුව විසින් දරන සමාගමක් ඉන් අදහස් වේ.

(7) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් (5) වන හෝ (6) වන උපවගන්තිය යටතේ තමාට කරන ලද යම් නියමයකට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

76ක. (1) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වස්තු භංගත්වයට පත්ව ඇති බවට හෝ එම බැංකුවේ තැන්පතුකරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට එම බැංකුවට නොහැකි වීමට ඉඩ තිබෙන බවට හෝ දිගටම ව්‍යාපාරය කරගෙන යාම නිසා එහි තැන්පතුකරුවන්ට හෝ ණය හිමියන්ට පාඩුවීමට ඉඩ ඇති බවට, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා, එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ කටයුතු තමා විසින්ම හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් විභාග කිරීමෙන් පසුව හෝ බැංකුවෙන් ලැබුණු තොරතුරු මත හෝ සෑහීමට පත්වූ යම් අවස්ථාවක, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඒ අනුව වාර්තාවක්, මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. තවද කරුණු හා අවස්ථානුගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසුව, එම මණ්ඩලයේ මතය වනුයේ මෙහි මින් මතු සලස්වනු ලබන පරිදි වූ ක්‍රියාමාර්ගයක් ගත යුතු බව නම්, එම බැංකුවේ ව්‍යාපාර කටයුතු වහාම අත්හිටුවන ලෙස විධාන කරමින් මුදල් මණ්ඩලය විසින් නියමයක් කළ හැකි අතර, එම බැංකුව විසින් ව්‍යාපාරය දිගටම කරගෙන යාම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට විධානය කළ හැකිය. එම බැංකුව විසින් දිගටම ව්‍යාපාරය කරගෙනයාම වැළැක්වීමට පියවර ගැනීමෙහි ලා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට බාධා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇතද (1) වන උපවගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යට නියමයක් සමාලෝචනය හෝ ප්‍රත්‍යාදිෂ්ට කරවා ගැනීමේ කාර්යය සඳහා හෝ එම නියමය නිසා සිදුවූ හෝ සිදුවීමට ඉඩ ඇති හෝ සිදුවූයේ යයි කියනු ලබන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් කිසිම අධිකරණයක පවරනු නොලැබිය යුතුය.

(3) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් බලපැවැත්වීම, එම නියමය කරන ලද දිනයෙන් පසු දින හැටක් ඉකුත් වූ විට නතර විය යුතු අතර හැකි පමණ ඉක්මණින් ද කෙසේ වුවත් එම කාලපරිච්ඡේදය ඉකුත් වීමට පෙරද, පහත දැක්වෙන ක්‍රියා කිරීම මුදල් මණ්ඩලයයේ කාර්යය විය යුතුයః-

(අ) කොන්දේසි විරහිතව හෝ මහජන යහපත සඳහා හෝ බැංකුවේ තැන්පතුකරුවන්ගේ හා වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යැයි මුදල් මණ්ඩලය අදහස් කරන කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත කරගෙන යෑමට බැංකුවට අවසරදීමේ නියමයක් කිරීම; හෝ

(ආ) එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවට නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සහ –

(1) එම බලපත්‍රලාභී විශේෂිත බැංකු 1982 අංක 17 දරන සමාගම් පනතේ 449 වන වගන්තියේ අර්ථානුකූලව සමාගමක් වන අවස්ථාවක, එම සමාගම් පනතේ (347 වන වගන්තිය හැර) IX වන කොටසේ විධිවිධානවලට අනුකූලව අධිකරණයේ අධීක්ෂණය යටතේ සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන ලෙස එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට විධාන කිරීම;

(2) බලපත්‍රලාභී විශේෂිත බැංකුව යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද රාජ්‍ය සංස්ථාවක් වන අවස්ථාවක, එම සංස්ථාව විසුරුවා හැරීම සඳහා 1971 අංක 33 දරණ මුදල් පනත යටතේ අවශ්‍ය සියලු පියවර ගතහැකි වීම සඳහා එම රාජ්‍ය සංස්ථාව පිළිබඳ වගකීම භාර දෙනු ලැබ ඇති අමාත්‍යවරයාට දැනුම් දීම; හෝ

(3) බලපත්‍රලාභී විශේෂිත බැංකුව ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් හෝ වෙනත් මණ්ඩලයක් වන අවස්ථාවක මේ පනතේ 70 වන වගන්තියේ අඩංගු විධිවිධානවලට අනුකූලව එකී ව්‍යාපාර කටයුතු ගනන් බේරා වසා දැමීම; එම ගනන් බේරා වසා දැමීමට එම වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතුය.

(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් සමාගමක් ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතුවලදී, හිමිකම් පෑම් වල ප්‍රමුඛත්වය සම්බන්ධයෙන් මේ පනතේ 6 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

76ග. (1) මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැණිව කුමක් සඳහන්ව ඇතද, එමෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක සංස්ථා පත්‍රයේ හා සාංගමික ව්‍යවස්ථාවලියේ පටහැණිව කුමක් සඳහන්ව ඇතද 76ක. වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මුදල් මණ්ඩලය විසින් නියමයක් කර ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් –

(අ) එම බලපත්‍රලාභී විශේෂිත බැංකුව වෙනත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ වෙනත් ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරන වැඩපිළිවෙලවල් එකී වෙනත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව යෙදිය හැකිය.

(ආ) එම බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් සහ අලුත් කොටස් හිමියන් බඳවා ගැනීමට සැලැස්වීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් එකී බලපත්‍රලාභී විශේෂිත බැංකුව ප්‍රතිසංවිධාන කළ හැකිය.

(ඇ) ව්‍යාපාරයේ ලාභදායක නොවන කොටස් වසා දැමීම සහ කළමනාකරණය ප්‍රතිසංවිධානය කිරීම ඇතුළුව තැන්පතුකරුවන්ගේ යහපත සඳහා වන්නේ යයි මණ්ඩලය අදහස් කරන ආකාරයකින් බලපත්‍රලාභී විශේෂිත බැංකුව ප්‍රතිනිර්මාණ කල හැකිය.

(ඈ) යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක යම් කොටස් හිමියකුට අයත් කොටස් මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකුට, පහත දැක්වෙන පරිදි නිශ්චය කරනු ලබන වන්දි ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ පසු, අවසනු කරන ලෙස හෝ පවරන ලෙස ඒ කොටස් හිමියාට විධාන කළහැකියః-

(i) එම කොටස් මිල ලැයිස්තුගතව ඇති අවස්ථාවක ඒවායේ වෙළෙඳපොළ වටිනාකම; හෝ

(ii) එම කොටස් මිල ලැයිස්තුගතව නැති අවස්ථාවක, මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන තක්සේරුකරුවකු විසින් තිරණය කරනු ලබන මිල.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ තමන්ට දෙන ලද විධානයකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින කොටස් හිමියෙක් වරදකට වරදකරු වන්නේය."

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය, ඒ වගන්තියේ "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක" යන වචන වෙනුවට, යම් "බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය එහි "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක" යන වචන වෙනුවට, " යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

34. පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 79වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 79 අ. වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

"වැරදි සමථයකට පත්කිරීම

79අ. (1) මේ පනත යටතේ වූ වරදක් සිදු කළ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව , එම වරද රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොවැඩි මුදල් ප්‍රමාණයකට සමථයකට පත් කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීම චූදිතයා නිදොස් කිරීමේ බලපෑම් ගෙන දෙන්නේය".

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය එම වගන්තියෙහි "බලපත්‍රලාභී වාණිජ බැංකුව," යන වචන යෙදෙන කවර තැනක වුවද එම වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුව හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 81අ. වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය.

"ii සහ iv වන උපලේඛන යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කලහැකි බව

81අ. මේ පනතේ II වන සහ IV වන උපලේඛන පාර්ලිමේන්තුව විසින් තත්කාර්ය සඳහා සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කරනු ලැබිය හැකිය".

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 82වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 82 අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

"මේ පනත වෙනත් නීති අභිබවා බල පැවැත්විය යුතු බව

82.අ. මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ඝට්ටනයක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය."

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එවා ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ සහ 83ආ වගන්ති වශයෙන් බල පැවැත්විය යුතුය:-

"බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත අදාළ නොවිය යුතු බව

83අ. බලපත්‍රලාභී වාණිජ බැංකුවකට (90 වන අධිකාරය වන) බඩු උකස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසි වලට යටත්ව, එවැනි බැංකුවක් විසින් බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය කරගෙන යා හැකිය.

"වාණිජ බැංකු නිදහස් කල සමාගමක් ලෙස සැලකිය යුතු බව

83ආ. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇත්තාවූ ද මේ පනතේ 5 වන වගන්තිය යටතේ බලපත්‍රලත් වාණිජ බැංකුවක් ලෙස බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද සමාගමක් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබූ දින සිට, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා " නිදහස් කළ සමාගමක්" ලෙස සැලකිය යුතුය".

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 'ප්‍රාග්ධන අරමුදල්' යන යෙදුමේ අර්ථකථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

"ප්‍රාග්ධන අරමුදල්" යන්නෙන්-

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සම්බන්ධයෙන් වූ විට කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය සහ 20 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි සංචිත අරමුදල අදහස් වන අතර, නිශ්චිත කාර්යය සඳහා වෙන් කරන ලද අරමුදල් හැර අනිකුත් සංචිත ඊට ඇතුළත් වේ :-

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වූ විට කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය සහ නිශ්චිත කාර්යයක් සඳහා වෙන් කරන ලද අරමුදල් හැර බැංකුවේ අතිකුත් සංචිත අදහස් වේ;"

(2) "වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්:-

"මුදල් සමාගම" යන්නෙන් 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ විධිවිධාන යටතේ මුදල් සමාගමක් වශයෙන් ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;";

40. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ (ඇ) විෂයය වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

"(ඇ) මූල්‍ය සේවා සැපයීමට අදාළ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ආණ්ඩුව හෝ පළාත් පාලන ආයතන හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් අනුයෝජිත කර්තව්‍ය කරගෙන යාම හෝ යම් මූල්‍ය ආයතනයක් සඳහා කළමනාකරණ අනුයෝජිත වශයෙන් ක්‍රියා කිරීම;";

(2) එම උපලේඛනයේ (ඔ) විෂයය වෙනුවට පහත දැකවෙන විෂයය ආදේශ කිරීමෙන්:-

"(ඕ) යම් ඒකක භාරයක් භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීම ඇතුළු භාර ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම;";

(3) එම උපලේඛනයේ (ක) විෂයයේ "සමාගමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙන යම් සමාගමක" යන වචන වෙනුවට "වෙනත් යම් සමාගමක" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම උපලේඛනයේ (ණ) විෂයය වෙනුවට පහත දැක්වෙන

විෂයය ආදේශ කිරීමෙන්:-

"(ණ) කළමනාකරණ උපදේශක සේවා සහ අතිකුත් තාක්ෂණික ආධාර සේවා සැපයීම;";

(5) එම උපලේඛනයේ (ද) විෂයයේ "ගබඩා කිරීම්" යන වචන වෙනුවට" වෙළෙඳ අනුයෝජිත කාර්යය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(6) එම උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන අලුත් විෂයයන් එකතු කිරීමෙන්:-

"(ප) බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය;

(බ) මූල්‍ය සේවා ව්‍යවසායයක් පැවැත්වීම සඳහා හෝ සිය ව්‍යාපාරය කරගෙන යාම පිණිස ආධාරක සේවා සැපයීම සඳහා යම් ව්‍යවසායයක් පැවැත්වීම සඳහා යම් තැනැත්තකු හෝ සමාගමක් සමග ඒකාබද්ධ ව්‍යවසායයක් සඳහා වූ වැඩ පිළිවෙලවල් ඇතිකර ගැනීම;

(අළ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිරත වීමට මුදල් මණ්ඩලය විසින් බලය දෙනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක්;";

41. II වන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛන මෙයින් එකතු කරනු ලැබේ:-

**III වන උපලේඛනය [76 ඇ(4) වන වගන්තිය]**

1. 1970 අංක 2 කරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව.

2. 1955 අංක 35 දරන සංවර්ධන මූල්‍ය සංස්ථාව.

3. 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයොජන බැංකු පනත මඟින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව.

4. 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මඟින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව.

IV වන උපලේඛනය [76 ඇ(4) වන වගන්තිය]

(අ) කාල සහ ඉතිරි කිරීමේ තැන්පතු භාරගැනීම සහ තැන්පතු ඉතිරි කිරීම් සහ වෙනත් ඊට සමාන ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම් එහෙත් මේ පනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම මීට ඇතුළත් නොවේ;

(ආ) කර්මාන්තවල, කෘෂිකර්මයේ හෝ වාණිජ කටයුතුවල යෙදී සිටින හෝ යෙදීමට ආසන්න යම් ව්‍යාවසායකට හෝ වෙනත් යම් ව්‍යාවසායකට ණය මුදල් හෝ අත්තිකාරම් ප්‍රදානය කිරීම් හෝ ණය මුදල් හෝ අත්තිකාරම් ප්‍රදානය කිරීමෙහිලා අනිකුත් මූල්‍ය ආයතන සමග සහභාගීවීම;

(ඇ) මූල්‍ය ආයතන විසින් කාර්මික, කෘෂිකාර්මික , වාණිජ සහ වෙනත් ව්‍යවසාය වලට දෙන ලද යම් ණය මුදල් හෝ අත්තිකාරම් සඳහා ප්‍රතිමූල්‍යකරණය වශයෙන් ණය මුදල් හා අත්තිකාරම් ප්‍රදානය කිරීම;

(ඈ) පහත දැක්වෙන කාර්ය සඳහා ණය මුදල් හෝ අත්තිකාරම් ප්‍රදානය කිරීම;

(i) නිවාසයක් ඉදිකිරීම සඳහා යම් ඉඩමක් මිලදී ගැනීම හෝ බදු ගැනීම;

(ii) නිවාසයක් ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම, නවීකරණය කිරීම හෝ විශාල කිරීම;

(iii) නිවාසයක් මිලදී ගැනීම හෝ බදු ගැනීම;

(iv) ඉහත (I), (II), (III) හි සඳහන් යම් කාර්යයකට, ආනුෂංගික, උපකාරක හෝ අනුයාත යම් කාර්යයක්; හෝ

(v) ඉහත (I), (II), (III) සහ (IV) සඳහන් යම් කාර්යයක් සඳහා දැනටමත් ඇතිකරගත් යම් ණයක් ගෙවීම;

(ඉ) යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායකට කෙටිකාලීන ණය මුදල් සහ අත්තිකාරම් සැපයීම සහ ආයතනික මුදල් වෙළෙඳ පොළෙහි මුදල් සැපයීම හෝ ණයට දීම;

(ඊ) බැංකුවේම සම්පත්වලින් වුවද වෙනත් බැංකුවලින් සහ මූල්‍ය ආයතන වලින් වුවද යම් පොදු හෝ පුද්ගලික සමාගමකට, සංස්ථාවකට හෝ සංගමයකට, ආණ්ඩුවට හෝ යම් පළාත් පාලන ආයතනයකට රුපියල් වලින් හෝ විදේශීය ව්‍යවහාර මුදල්වලින් ණය මුදල් පිළියෙල කරදීම, ණය මුදල සඳහා ඇපවීම, එම ණය මුදල් කළමනාකරණය කිරීම සහ වෙනත් ව්‍යවසායවලට සහාය වීම;

(උ) වෙනත් මූල්‍ය ආයතන සමග ණය මුදල්වලට, කොටස් හා ස්කන්ධවලට, ප්‍රාරක්ෂණ වැඩ පිළිවෙලට සහ ඇපවීම්වලට සහභාගී වීම;

(ඌ) මූල්‍ය ආයතනවලට තොග වශයෙන් ණය දීම භාර ගැනීම;

(එ) ව්‍යවසාය සඳහා අභ්‍යන්තර මෙන්ම බාහිර වශයෙන් ප්‍රාග්ධනය ලබාගැනීමෙහිලා සහභාගීවීම ඇතුළුව, යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමෙහි, පිහිටුවීමෙහි, ව්‍යාප්ත කිරීමෙහි හා නවීකරණය කිරීමෙහි ලා සහාය වීම;

(ඒ) මූල්‍ය ආයතනවලින් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායක් විසින් ලබාගන්නා හෝ ලබා ගැනීමට ඇති ණය මුදල්වලට ඇපවීම හෝ එවැනි ණය මුදල්වලට ඇපවීමෙහි ලා වෙනත් මූල්‍ය ආයතන සමග සහභාගී වීම;

(ඔ) යම් කාර්මික , කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායකින් අයවිය යුතු විලම්බිත ගෙවීම්වලට ඇපවීම;

(ඕ) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායවල ප්‍රාග්ධන නිකුත්කිරීම් ප්‍රාරක්ෂණය කිරීමෙන් පැනනගින මූල්‍ය ආයතනවල බැඳීම් වලට ඇපවීම;

(ක) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායවල කොටස් හා ස්කන්ධ දැරීමෙහිලා සහභාගීවීම සහ එවැනි යම් ව්‍යවසායවල ව්‍යාපාර වස්තු, කොටස්, බැඳුම්කර හෝ සෑණපත්‍ර නිකුත් කිරීමට දායක වීම, ඒවා මිලදී ගැනීම, ප්‍රාරක්ෂණය කිරීම සහ එවැනි යම් ව්‍යාපාර වස්තු කොටස්, බැඳුම්කර හෝ සෑණපත්‍ර විකිණීම සහ ඒවා පිළිබඳ ගණුදෙනු කිරීම;

(ග) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායවලට බැංකුව විසින් දෙන ලද ණය මුදල් සහ එවැනි යම් ව්‍යාවසායක් විසින් නිකුත් කරන ලද බැඳුම්කරවලට හෝ සෑණපත්‍රවලට බැංකුවේ දායකවීම සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසේ හෝ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම;

(ට) ඉතිරි කිරීම් ඒකරාශී කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්ය සඳහා ඉතිරි කිරීමේ සහතික පත්‍ර සහ වෙනත් බැඳුම්කර, සහතිකපත්‍ර සහ සාධන පත්‍ර නිකුත් කිරීම සහ ඒවා පිළිබඳ ගණුදෙනු කිරීම;

(ජ) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායවල විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, කූපන්, ණයකර, සෑණපත්‍ර සහතික කොටස්, සහතික පත්‍ර සහ වෙනත් සාධන පත්‍ර සහ සුරැකුම්පත් ඒවා පැවරිය හැකි හෝ ගණුදෙනු කළ හැකි වුවද එසේ නොවුවද භාරගැනීම, වට්ටම් කිරීම, ප්‍රතිවට්ටම් කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ ඒවා පිළිබඳ ගණුදෙනු කිරීම;

(ච) විශේෂිත මූල්‍ය නිෂ්පාදිත සේවා සංගෘහිත සහ සාධන පත්‍ර ප්‍රවර්ධනය කිරීම සහ හඳුන්වා දීම;

(ඩ) මුදල් තැරැව්කාර සේවා සහ ජාත්‍යන්තර වෙළෙඳ පහසුකම් සැපයීම;

(ණ) ප්‍රාග්ධන සහ මුදල් වෙළෙඳ පොළවල් සංවර්ධනය කිරීමට සහාය වීම;

(ත) ඒකක භාරවල කළමනාකරුවන් වශයෙන් ක්‍රියාකිරීම ඇතුළුව, භාර කර්තව්‍ය භාරගැනීම;

(ද) ආණ්ඩුවෙන් හෝ ආණ්ඩුව වෙනුවෙන් කටයුතු කරන නියෝජ්‍යායතන වලින් හෝ ආයතනවලින් ණය ලබා ගැනීම හෝ තැන්පත් භාරගැනීම;

(න) යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් ආයතනයක අනුයෝජිතයන් වශයෙන් ක්‍රියාකිරීම සහ එහි අරමුදල් පරිපාලනය කිරීම;

(ප) බැංකුව විසින් දෙන ලද යම් ණයක බැංකුවේ සම්බන්ධතාව ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ගණුදෙනුකරුවකුගේ යම් කාර්මික, කෘෂිකාර්මික වාණිජ හෝ වෙනත් ව්‍යාපාරයක් කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හෝ කළමනාකරණය, අධීක්ෂණයෙහි හෝ පාලනයෙහි ලා සහභාගී වීම;

(බ) සංවිධානවල පවතින ණය වාණිජ පදනමක් මත මිලදී ගැනීම සහ පොලී හුවමාරු පහසුකම් සහ පොලී ආබිට්‍රාජ් පහසුකම් සැපයීම;

(ම) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායවලට තාක්ෂණික මූල්‍ය කළමනාකරණය හෝ පරිපාලන උපදෙස් සහ ආධාර වැනි සේවාවන් සැපයීම;

(ය) මූල්‍ය ප්‍රතිව්‍යුහගතකිරීම්, ඒකාබද්ධ කිරීම, ප්‍රතිනිර්මාණය කිරීම, අත්කර ගැනීම සහ සංයෝජන විෂයෙහි කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායවලට සහාය වීම;

(අඅ) ආයෝජනාවලි කළමනාකරණය භාර ගැනීම;

(ආආ) නියමු ව්‍යාපෘති ඇතුළුව, කර්මාන්තවල , කෘෂිකර්මාන්තයේ, වාණිජ්‍යයේ සහ වෙනත් ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති භාර ගැනීම;

(ඇඇ) ඝන රන්, රිදී සහ රන් රිදී කාසි මිල දී ගැනීම, විකිණීම සහ ඒ පිළිබඳ ගණුදෙනු කිරීම සහ හුවමාරු මෙහෙයුම්වලට යෙදීම;

(ඈඈ) ණයවර ලිපි සහ චක්‍ර නෝට්ටු ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම;

(ඉඉ) බැංකුව විසින් ඉටු කරනු ලබන කර්තව්‍ය සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් කොමිස්, බ්‍රෝකර් ගාස්තු, පොලිය, පාරිශ්‍රමික හෝ ගාස්තු ලබාගැනීම;

(ඊඊ) දුර්වල කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමට භාර ගැනීම;

(උඋ) යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායක යම් නිෂ්පාදිතයක් විකිනීම හෝ අලෙවි කිරීම සඳහා අවශ්‍ය සංවිධාන පිහිටුවීම හෝ පිහිටුවීමෙහි ලා සහාය වීම;

(ඌඌ)කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ගබඩාගාර, ගුදම්, ගබඩා සහ ගොඩනැගිලි ඉදිකිරීමෙහි යෙදීම;

(එඑ) යම් වංචල හෝ නිශ්චල දේපළක් හෝ යම් කාර්මික කෘෂිකාර්මික වාණිජ හෝ වෙනත් ව්‍යවසායක් අත්කර ගනීම හෝ මිලදී ගැනීම හා එම දේපළ හෝ ව්‍යවසාය කළමනාකරණය කිරීම් හෝ කළමනාකරණය සඳහා වැඩපිළිවෙල යෙදීම සහ එම දේපළ හෝ ව්‍යවසාය විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම;

(ඒඒ) ගබඩාගාර, ගුදම්, ගබඩා සහ ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ වෙනත් භාණ්ඩ මිලදී ගැනීම, බදු දීම , කුලියට දීම, නියත ලෙස විකිණීම හෝ කුලී සින්නක්කර පදනමක් මත විකිණීම;

(ඔඔ) බැංකුවේ මුදල් ආයෝජනය කිරීම;

(ඕඕ) ආර්ථික විද්‍යාව, මූල්‍යය, සංවර්ධනය, කළමනාකරණය සහ වෙනත් අලෙවි ක්ෂේත්‍රවල සමීක්ෂණ, අධ්‍යයන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම;

(කක) ලොතරැයි සහ තෑගි තරඟ පැවැත්වීම;

(ගග) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් විශේෂිත බලපත්‍රලාභී බැංකුවකට කරගෙන යාමට බලය දෙනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාර.

42. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

43. (1) මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ විධි විධාන හා එම ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය යම් අධිකාරයක් පිහිටුවන ලැබුවේ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ද ලිඛිත නීතියේ විධිවිධාන අතර ගැටීමක් තිබුණ ද, එම ලිඛිත නීතිය යටතේ ආරම්භ කර මේ පනත, (19 වන වගන්තිය සහ 34 වන වගන්තිය හැර) ක්‍රියාත්මක වන දිනයේදී නොනිමිව සහ අසම්පූර්ණව පවතින සියලු ක්‍රියා තීරණ හෝ දේ මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තිය සම්මත නොවූ එක් සේ කරගෙන ගොස් සම්පූර්ණ කළ හැකිය.

(2) මේ පනතේ 24 වන වගන්තිය මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ලේකම්වරයෙකුට තිබිය යුතු යැයි නියමිත සුදුසුකම් මේ පනත (19 වන වගන්තිය හැර) ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ලේකම් ධුරය දරන යම් තැනැත්තකුට අදාළ නොවිය යුතුය. එසේ වුවද එම තැනැත්තා බැංකුවේ පූර්ණකාලීන සේවා නියුක්තයකු වශයෙන් ධුරය දරමින් සිටිය යුතුය.

44. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ කොටස ක්‍රියාත්මක වීමට පෙර මේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාරය, යම් ලිඛිත නීතියක් යටතේ වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත සතු කරනු ලැබ ඇති අවස්ථාවක, එම ව්‍යාපාරය දෙවනු සඳහන් කරනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත සතු කරනු ලැබීමට පෙරාතුවම වූ දිනයේ දී එකී පළමු සඳහන් බලපත්‍රලාභී වාණිජ බැංකුවට හිමිව තිබූ යම් නිශ්චල දේපළක් සහ එම බැංකුව විසින් යම් නිශ්චල දේපළක් විෂයෙහි භුක්ති විඳිමින් සිටි යම් බදු අයිතිවාසිකම් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් දෙවනු කී බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත සතු කරනු ලැබිය හැකිය.

(2)(1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය මගින් කරන ලද සතු කිරීම වෙනුවෙන් මුදල් මණ්ඩලය විසින් ඒ පළමුව සඳහන් බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යාපාරය දෙවනුව සඳහන් බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත සතු කරන ලද දිනයේ පැවති පරිදි, දෙවනුව සඳහන් වාණිජ බැංකුව වෙත සතු කරන ලද වත්කම් හා බැරකම්වල වටිනාකම සහ ඒ සතු කිරීමට අදාළ වෙනත් යම් අදාළ කරුණු සැලකිල්ලට ගනිමින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක වන්දියක් දෙවනුව සඳහන් කළ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් පළමුව සඳහන් කළ බලපත්‍රලාභී වාණිජ බැංකුවට ගෙවනු ලැබිය යුතුය.

45. (1) මේ පනතේ 18 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IVඅ කොටස ඉවත් කරනු ලැබුවද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන දිනයක සිට අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් ඇතුළත අංකිත ගිණුමක අයිතිකරු විසින් එම ගිණුම වසා දැමිය යුතු අතර එසේ ගිණුම වසා දමන තෙක් ඒ ගිණුම ක්‍රියාත්මක කිරීමට ඔහුට හිමිකම තිබිය යුතුය:

එසේ වුවද එම ගිණුමේ තැන්පත් කර ඇති මුදල් සඳහා පොළිය වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් හැර එවැනි යම් අංකිත ගිණුමකට අරමුදල් කිසිවක් බැර කරනු නොලැබිය යුතුය.

(2) අංකිත ගිණුමක අයිතිකරුවකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වෙමින් එම උපවගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත එම ගිණුම වසා දැමීම පැහැර හරින අවස්ථාවක එම කාලපරිච්ඡේදය ඉකුත් වූ දිනයේ සිට සහ ඉන් පසුව එම ගිණුම අංකිත ගිණුමක් වීමේ හේතුවෙන් ඊට ප්‍රදානය කරනු ලැබ තිබූ පහසුකම් ප්‍රයෝජනයට ගැනීම නතර විය යුතුය.

මේ පනතේ කාර්යය සඳහා "අංකිත ගිණුම" යන්නට ප්‍රධාන ප්‍රඥප්තියේ 34ආ වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

46. යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද ප්‍රධාන ප්‍රඥප්තියේ 83ආ වගන්තියේ සඳහන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, ඒ බැංකුව සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ දින දී සහ ඊට පෙරාතුව ශ්‍රී ලංකාවේ යම් දේපළකින් අත්කර ගන්නා සැම සම්බන්ධතාවක්ම සහ ඒ යම් බැංකුවක් විසින් කරන සැම ක්‍රියාවක්ම, අවස්ථාවෝචිත පරිදි වලංගු ආකාරයෙන් අත්කර ගන්නා ලද්දක් සේ හෝ වලංගු ආකාරයෙන් කරන ලද්දක් සේ සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුතුය.

**1995 අංක 34 දරන විසර්ජන පනත.**
**[සහතික සටහන් කළේ 1995 දෙසැම්බර් මස 29 වන දින]**

**1996 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද. ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද. එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට සැලසීම සඳහා ද. ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීමක් සඳහා ද වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 34 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් වියදමකට බලය දෙන්නාවූ වෙන යම් නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1996 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1996 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භවී 1996 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි ඇස්තමේන්තු කර ඇති රුපියල් විසිඑක් දහස් හත්සිය දොළොස් කෝටි අට ලක්ෂ හාර දහසක් විය යුතු ආණ්ඩුවේ වියදම –

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින්; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දොළොස් දහස් හාරසිය හැටතුන් කෝටි අසූනව ලක්ෂ විසිහතර දහසක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් විසිඑක් දහස් හත්සිය දොළොස් කෝටි අට ලක්ෂ හාර දහසක් වූ මුදල, මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

3. (1) 1996 මුදල් වර්ෂය තුළ දී, මේ පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්තේ ගිණුමට බැර කළයුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම් වල එකතුව, ඒ උපලේඛනයේ III වන තීරයෙහි අනුරූපි සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. ඒ කටයුත්තෙන් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 1996 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා පහත දක්වෙන ගෙවීම්, එනම් :–

(අ) යම් කටයුත්තක ආදායමට අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම්; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂයවීම් ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1996 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුළ දී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ II වන තීරයෙහි අනුරූපි සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(4) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තක් සම්බන්ධයෙන් 1996 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපි සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒ කටයුත්තේ මුළු බැරකම්, ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපි සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 1996 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක, මේ පනතේ දෙවන උප ලේඛනයේ 1 වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම් ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළහැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන අකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම නොකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට හෝ ඒ ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ මුදල් වෙන්කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලබන වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ මුදල් වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (i) බලය දෙනු ලැබූ වියදම දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු විය හැකි බවට; හෝ

(ii) යම් විශේෂ කාර්යයක් හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

7. (1) අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව–

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දක්වෙන අවම සීමා

නියමයක් මගින්, 1997 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ අලුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්තම් මිස, බල නොපැවැත්විය යුතුය.

(3) එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම්, එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

8. පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින් මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ –

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**1995 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත.**
**[සහතිකය සටහන්කළේ 1995 දෙසැම්බර් මස 29 වන දින]**

**1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1995 අංක 36 දරන ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනතේ දීර්ඝ නාමයේ "පිළිවෙලින්, 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1995 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ සඳහා ආරක්ෂක බද්දක් පැනවීම" යන වචන හා ඉලක්කම් වෙනුවට, "පිළිවෙලින්, 1992 ජනවාරි මස 1 වන දිනයෙන්, 1993 ජනවාරි මස 1 වන දිනයෙන්, 1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1996 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ සඳහා ජාතික ආරක්ෂක බද්දක් පැනවීම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක -

(අ) "ආරක්ෂක බදු පනත" යන වචන වෙනුවට, ජාතික ආරක්ෂක බදු පනත" යන වචන; සහ

(ආ) "ආරක්ෂක බද්ද" යන වචන වෙනුවට "ජාතික ආරක්ෂක බද්ද" යන වචන

ආදේශ කරනු ලැබිය යුතුය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, දැනුම් දීමක හෝ වෙනත් ලේඛනයක "ආරක්ෂක බදු පනත" සහ "ආරක්ෂක බද්ද" සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, පිළිවෙලින් "ජාතික ආරක්ෂක බදු පනත" සහ "ජාතික ආරක්ෂක බද්ද" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි -

(අ) "1994 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1995 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1994 ජනවාරි මස 1 වන දිනයෙන්, 1995 ජනවාරි මස 1 වන දිනයෙන් සහ 1996 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "(පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අර්ථානුකූලව) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම මත," යන වචන වෙනුවට, "(පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අර්ථානුකූලව) ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම හෝ එහි කොටසක් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි -

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අපනයනය කිරීම සඳහා යම් භාණ්ඩයක් සෑදීමෙහි ලා ඒ තැනැත්තා විසින් පාවිච්චි කිරීම සඳහා" යන වචන වෙනුවට, " අපනයනය කිරීම සඳහා යම් භාණ්ඩයක් ඒ තැනැත්තා විසින් නිෂ්පාදනය කිරීමෙහි ලා හෝ නිෂ්පාදනය කිරීම සඳහා පාවිච්චි කිරීම පිණිස" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින් විකිණීමෙන් ලැබෙන මුදල; සහ" යන වචන වෙනුවට, "ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින් විකිණීමෙන් ලැබෙන මුදල;" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "ඒ භාණ්ඩය යම් අපනයනකරුවකුට විකිණීමෙන් ලැබෙන මුදල" යන වචන වෙනුවට "ඒ භාණ්ඩය යම් අපනයනකරුවකුට විකිණීමෙන් ලැබෙන මුදල;." යන වචන ආදේශ කිරීමෙන්;

(iv) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :-

"(ඉ) ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක්, ඒ භාණ්ඩය-

(i) ප්‍රදර්ශනයක ප්‍රදර්ශනය කිරීම;

(ii) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යාපෘතියක, ශ්‍රී ලංකාව තුළ තාවකාලික වශයෙන් පරිහරණය කිරීම;

(iii) ඒ භාණ්ඩයට ශ්‍රී ලංකාව තුළ කරනු ලබන, අලුත්වැඩියා කටයුතු කිරීමේ කාර්යය; හෝ

(iv) වෙනත් යම් සමාන කාර්යයක්

සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති බවට සහ ඒ භාණ්ඩය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ දින සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ භාණ්ඩය නැවත නැව්ගත කරනු ලබන බවට, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ භාණ්ඩයේ වටිනාකම;

(ඊ) යම් තීරු බදු රහිත සාප්පුවක විකිණීම සඳහා ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතය ඇතිව ආනයනය කරන ලද යම් රත්රන් ප්‍රමාණයක වටිනාකම; සහ

(උ) ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක් ආනයනය කිරීමට පෙරාතුව, අලුත්වැඩියා කිරීම පිණිස ඒ භාණ්ඩය ශ්‍රී ලංකාවෙන් බැහැර ගෙන ගොස් ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ භාණ්ඩයේ වටිනාකම",.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ඉ) 1995 ජුලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1977 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා ම-

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට සමාන මුදලක්;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, සහ ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට සමාන මුදලක්;

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදය (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ මුදල ;

(ඊ) 1996 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1977 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා-

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා -

(අ) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට ; සහ

(ආ) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට දෙකකට සමාන මුදලක්;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ ඊදිනට පෙර, ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා -

(අ) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට; සහ

(ආ) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට දෙකකට සමාන මුදලක්; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදය (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ මුදල.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5ළ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට තුන හමාරකට සමාන මුදලක්" යන වචන වෙනුවට "යන මුදල් ප්‍රමාණ මත, මේ පනතේ උපලේඛනයේ දක්වා උචිත අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලබන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ,

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1). "බැංකුකරු" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය එකතු කිරීමෙන් :- "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ; තව ද

(2). "සාදන්නා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :- "පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන්නට, (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථකථනය කර ඇති පරිදි, යම් මෝටර් රථයක් මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් ඇතුළත් නොවේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

**"උපලේඛනය**

**(3 වන සහ 5ළ වගන්ති)**

මේ පනත අදාළ වන යම් තැනැත්තකුගේ පිරිවැටුම සම්බන්ධයෙන් අදාළ වන බද්දේ අනුප්‍රමාණය

| | කාර්තුව | | අනුප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 1992 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | ... | සියයට 1 |
| 2. | 1992 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා | ... | සියයට 2.3 |
| 3. | 1992 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1994 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා | ... | සියයට 3 |
| 4. | 1994 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1995 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා | ... | සියයට 3.5 |
| 5. | 1995 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1996 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා | ... | සියයට 4.5 |
| 6. | 1996 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1997 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුව සඳහා | | |
| | (i) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන පිරිවැටුම මත | ... | සියයට 4.5 |
| | (ii) යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම මත | ... | සියයට 2.". |

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.